# රණවිරුවා

2022 දෙසැම්බර් • 250 කලාපය



## දෙස රකින ඇරඹුම

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# යුද්ධ හමුදා විද්‍යාපීඨය තවත් තරුණ නිලධාරීන් පිරිසක් මාතෘභූමියට දායාද කරති



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්තිමත් අධ්‍යාපන ආයතනය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨයෙහි පුහුණුව සාර්ථකව අවසන් කළ කෙඩෙට් නිලධාරීන් 352 ක් පසුගිය දෙසැම්බර් 17 වන දින පැවති අභිමානවත් පෙළපාලියකදී විසිර ගියහ. මාතෘභූමියේ අභිවෘද්ධිය වෙනුවෙන් අනාගතයේදී විවිධ අභියෝග සහ උපායමාර්ගික වගකීම් භාරගැනීම සඳහා අත්‍යාවශ්‍ය කුසලතා සහ ආකල්ප සහිත උපායශීලී නායකයින් ලෙස මෙම කෙඩෙට් නිලධාරීන් දැනුමින් සන්නද්ධව ඇත.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ආරාධනයකට අනුව මෙම විසිරයාමේ පෙළපාලියට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී විය. කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 89, 91, 91 බී, එස්සී 19, කාන්තා නිලධාරී පාඨමාලා අංක 19, ස්වෙච්ඡා කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 61,61 ඒ සහ ස්වෙච්ඡා කාන්තා නිලධාරී පාඨමාලා අංක 18 හැදෑරූ කෙඩෙට් නිලධාරීන්





**දියතලාව යුද හමුදා විද්‍යාපීඨය එදින සැණකෙළි සිරි ගත්තේ අභිමානවත් ජවසම්පන්න දූ පුතුන් රැසක් මව්බිම වෙනුවෙන් යුහ මෙහෙවරට එක්වූ මංගල අවස්ථාව එය වූ බැවිනි. දෙස බස රැස සුරැකීම උදෙසා වන අනුලංඝනීය මෙහෙවරට පිවිසි ඔවුහු අනාගත යුද හමුදාවේ නියමුවන් ලෙස සිය වගකීම නොපිරිහෙළා ඉටු කරනු නොඅනුමානය.**







352 ක් මෙම පාඨමාලාවේදී අධිකාරියට පත්ව විසිර ගිය අතර, ඔවුන් සමග එම පාඨමාලාව හැදෑරූ මාලදිවයින සහ සැම්බියාව යන රටවලට අයත් කෙඩෙට් නිලධාරීහු තිදෙනෙක්ද වූහ.

ජනාධිපතිතුමාගේ සුරතින් අධිකාරියට පත් කෙඩෙට් නිලධාරීන් වෙත ජනාධිපති අධිකාරියෙහි සංකේතය වන අසිපත් ප්‍රදානය කිරීමද, පාඨමාලාවන්හි දක්ෂතා දැක්වූ කෙඩෙට් නිලධාරීන් වෙත විශේෂ සම්මාන ප්‍රදානය කිරීමද සිදුකෙරිණ. අධිකාරියට පත් නිලධාරීන් වෙත සුබ පැතුම් එක්කිරීම සඳහා ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ජනාධිපති ප්‍රධාන මාණ්ඩලික නිලධාරී සහ ජනාධිපති ප්‍රධාන උපදේශක සාගල රත්නායක, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, විද්‍යා පීඨයේ සේනාධිනායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියන්ගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී මෙන්ම අධිකාරියට පත් නිලධාරීන්ගේ දෙමාපියන් සහ ළඟම ඥාතීන් ඇතුළු විශාල පිරිසක් මෙම විසිරයාමේ පෙළපාළිය සඳහා සහභාගී වූහ.

# කෙඩෙට් නිලධාරීන් සිය අවසන් පර්යේෂණ අධ්‍යයන ඉදිරිපත් කරති

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා හදාරා විසිර යනු ලැබූ කෙඩෙට් නිලධාරීන්ගේ අවසන් පර්යේෂණ අධ්‍යයන ඉදිරිපත් කිරීම පසුගිය දෙසැම්බර් 16 වන දින සන්ධ්‍යාවේ යුද්ධ හමුදා විද්‍යාපීඨයේ "සිනෝ ලංකා" මිත්‍රත්ව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් සහභාගී විය.

එහිදී එම කෙඩෙට් නිලධාරීන් විසින් "රුසියානු - යුක්රේන ගැටුම සහ දකුණු ආසියාතික බලපෑම්" යන තේමාව ඔස්සේ මනාව සකස් කරන ලද පර්යේෂණ සොයාගැනීම් සංග්‍රහය ප්‍රේක්ෂකාගාරය වෙත ඉදිරිපත් කරන ලදී. එම කෙඩෙට් නිලධාරීන් අධිකාරියට පත්කිරීමට ප්‍රථම අනිවාර්ය අංගයක් ලෙස මෙම අවසන් පර්යේෂණ ඉදිරිපත් කිරීම සිදුකරනු ලබයි.





# සපුගස්කන්ද අණ හා මාණ්ඩලික විද්‍යාලයෙන් තවත් උපාධිධාරීහු පිරිසක් විසිරයති

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයීය පාඨමාලා අංක-16 හි උපාධි ප්‍රදානෝත්සවය ඉකුත් දෙසැම්බර් 08 වන දින පස්වරුවේ නෙළුම් පොකුණ රඟහලේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙම පාඨමාලාව සඳහා බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මාලදිවයින, නේපාලය, ඕමානය, පාකිස්ථානය, රුවන්ඩාව, සවුදි අරාබිය, සෙනගාලය සහ සැම්බියාව යන රටවල් නියෝජනය කරමින් සහභාගී වූ විදේශීය නිලධාරීන් 22 දෙනකු ඇතුළු උපාධි අපේක්ෂක නිලධාරීන් 149 දෙනකු සහභාගි වූ අතර, ඊට යුද්ධ හමුදා නිලධාරීහු76 ක් නාවික හමුදා නිලධාරීහු 26 ක් සහ ගුවන් හමුදා නිලධාරීහු 25 දෙනකු අයත්වූහ.

සපුගස්කන්ද, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන ක්‍රියා පටිපාටිය පිළිබඳව සහ අණ හා මාණ්ඩලික ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම ලබාදෙමින් අනාගතයේ එම නිලධාරීන් විවිධ මාණ්ඩලික තනතුරු හෙබවීමේදී අභියෝගවලට මුහුණදී ඵලදායි අයුරින් කටයුතු කිරීමේ ගුණාංග ප්‍රවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යයන ආයතනයකි.

මෙම උපාධි ප්‍රදානෝත්සවය සඳහා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සාගල රත්නායක මහතා, ආරක්‍ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්පිල්, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නාවික හා ගුවන් හමුදාධිපතිවරු, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන් සහ අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයින්, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින්, එම විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී, ඇතුළු තවත් විශාල පිරිසක් සහභාගී වූහ.







# ප්‍රථම “ඇටෑචේ කේස්” (Attaché Case) විශේෂ බෑගය ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වේ



ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ අදහසකට අනුව විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද ‘Attaché Case’ නම් ලිපි ලේඛන රැගෙන යා හැකි බෑගයක් පසුගිය දෙසැම්බර් 02 වන දින යුද්ධ හමුදාධිපති lලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු විසින් ජනාධිපතිතුමන් වෙත භාරදෙන ලදී.

ලෝක නායකයන් සංචාරයන්හි නිරත වන විට වැදගත් හා රහසිගත ලිපි ලේඛන රැගෙන යාමට මෙම ‘Attaché Case’ බෑගයන් භාවිතා කිරීම සම්ප්‍රදායකි. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මෙවැනි බෑගයක් නිර්මාණය කිරීමේ කාර්යය ජනාධිපතිතුමන් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පවරනු ලැබුවේ මෙම ලෝක සම්ප්‍රදාය ශ්‍රී ලංකාවටද හඳුන්වා දෙමිනි.

යුද්ධ හමුදාධිපතිගේ මගපෙන්වීම සහ සෘජු අධීක්ෂණය යටතේ, අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ජේඑ්ආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් යුතුව ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පිරිසක් විසින් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දෙන ලද පිරිවිතරයන්ට අනුව මෙම නවීනතම බෑගය උසස් තාක්ෂණයෙන් යුතුව නිමවා තිබුණි. අතිගරු ජනාධිපතිතුමන්ගේ පරිහරණය සඳහා සකස්කරනු ලැබූ මෙම බෑගය අනාගතයේ වැඩ භාරගන්නා ජනාධිපතිවරයා වෙත සම්ප්‍රදායානුකූලව පිළිගැන්වීමට නියමිතව ඇත.

# කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයට නව කාර්යාල සංකීර්ණයක්





ගණේමුල්ලේ පිහිටි කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථානයේ ඉදිකරනු ලැබූ නව දෙමහල් පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉකුත් දෙසැම්බර් 19 වන දින පැවති උත්සවයකදී විවෘත කෙරිණ. එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිතයින් ලෙස ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී වූහ.

කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩියු පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එම අවස්ථාවට සපැමිණි ප්‍රධාන අමුත්තා ඇතුළු ආරාධිතයින් වෙත එම රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ගෞරවනීය බුහුමන් පුදනු ලැබීය. මෙම කාර්යාල සංකීර්ණය විවෘතවීම කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයට දිගුකාලීන අඩුපාඩුවක් සම්පූර්ණ වීමකි. මෙම අවස්ථාවට එක්වූ ආරාධිතයින් විසින් සෑම අංශයක්ම නිරීක්ෂණය කළ අතර එහිදී ගොඩනැගිලි සංකීර්ණයට අදාළ පරිපාලන කටයුතු පිළිබඳව ද සොයාබලන ලදී.

# යුද්ධ හමුදා නත්තල් කැරොල් නෙළුම් පොකුණ රඟහලේදී



ප්‍රීතිමත් නත්තලේ උදාව සනිටුහන් කරමින් යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමය විසින් සංවිධානය කරනු ලැබූ "යුද්ධ හමුදා නත්තල් කැරොල් ගී ප්‍රසංගය" පසුගිය දෙසැම්බර් 20 වන දින පස්වරුවේ නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විණි. යුද්ධ හමුදා ගායන කණ්ඩායමේ සහ තූර්ය වාදක කණ්ඩායම් වල විචිත්‍රවත් සංගීතාස්වාදයෙන් වර්ණවත් වූ මෙම ප්‍රසංගය කැරොල්, යාඥා, නැටුම්, ගීතිකා සහ අනෙකුත් අංගයන්ගෙන් සමන්විතව ජනප්‍රිය ගායක ගායිකාවන් රැසකගේ ද සහභාගීත්වයෙන් අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ යුද්ධ හමුදා ක්‍රිස්තියානි සංගමයේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න එක්විය. තවද, චිත්‍රානි ගුණරත්න මහත්මිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ එම මහත්මිය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය, නාවික හා ගුවන් හමුදාධිපතිවරු හා එම මැතිනියන්, පොලිස්පති සහ එම මැතිනිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ එම මැතිනිය, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, හිටපු ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු තවත් සම්භාවනීය ආරාධිතයන් රැසක් සහභාගී වූහ.









# හටකාර්ය සම්පාදක මාණ්ඩලික පාඨමාලාව සාර්ථකව අවසන්










ත්‍රිකුණාමලය හටකාර්ය සම්පාදක පුහුණු පාසල වෙතින් වසරක කාලයක් මුළුල්ලේ පවත්වනු ලැබූ "හටකාර්ය සම්පාදක මාණ්ඩලික පාඨමාලා - අංක 8" (Lsc) පසුගියදා නිමාවට පත්විය. එහිදී, එම පාඨමාලාව සාර්ථකව හදාරනු ලැබූ මෙරට යුද්ධ හමුදාවේ නිලධාරීන් 26 දෙනකු, නාවික හමුදාවේ නිලධාරීන් දෙදෙනකු, ගුවන් හමුදාවේ නිලධාරියකු, බංගලාදේශ හමුදාවේ සහ නේපාල හමුදාවේ නිලධාරීන් දෙදෙනකු ඇතුළුව නිලධාරීන් 31 දෙනකු උපාධි හිමිකර ගත්හ.

පසුගිය දෙසැම්බර් 09 වන දින කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවති එම උපාධි ප්‍රදානෝත්සවයට ත්‍රිකුණාමලය හටකාර්ය සම්පාදක පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඒඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඒටීඕ ගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

හටකාර්ය සම්පාදක මාණ්ඩලික පාඨමාලාව යුද්ධ හමුදාවේ හටකාර්ය සම්පාදක සහ පරිපාලන ක්ෂේත්‍රවල ඉහළම වෘත්තීය දැනුම ලබාදීම සිදුකරනු ලබන පාඨමාලාවකි. එමගින් යුද්ධ හමුදාවේ නිලධාරීන්ගේ වෘත්තිය සහ සාමාන්‍ය ක්‍රියා පටිපාටිවලට සම්බන්ධ සැපයුම් සහ පරිපාලන ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සිදුකෙරේ. වසරක පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් ලෙස පවත්වනු ලබන මෙය සාර්ථකව අවසන් කරන අයවළුන් 'Lsc' පදවි නාමයට හිමිකම් කියනු ලබයි. ජ්‍යෙෂ්ඨ හටකාර්ය සම්පාදක තනතුරු සඳහා පත්වීමට ප්‍රථම එම නිලධාරීන් තුළ හටකාර්ය සම්පාදක දැනුම වර්ධනය කිරීම මෙන්ම කුසලතාවයන් සහ ආකල්ප වර්ධනය කිරීමත් මෙමගින් සිදුකෙරේ.

හටකාර්ය සම්පාදක මාණ්ඩලික පාඨමාලාව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අනුබද්ධව පවත්වනු ලබන අතර, එමගින් හටකාර්ය සම්පාදක කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනය ශාස්ත්‍රපති උපාධිය (MBA in LM) ප්‍රදානය කරනු ලබයි. තවද, එම සුදුසුකම් ලත් ශිෂ්‍ය නිලධාරීන් හට එම ආරක්ෂක විශ්ව විද්‍යාලයෙහි මාස තුනක කාලයක් පවත්වනු ලබන ඉංග්‍රීසි භාෂා පාඨමාලාවටද සහභාගී වීමට අවස්ථාව හිමිවේ.

මෙහිදී, එම හටකාර්ය සම්පාදක පුහුණු පාසලෙහි නිල සඟරාව වන "ගෝල්ඩන් ලොග් 2021 - 2022" (Golden Log 2021- 2022) සඟරාව එළිදැක්වීමද සිදුවිය. එම අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන්, විද්වත් ආරාධිතයන් රැසක් ද සහභාගී වූහ.

# ජාතික වෘත්තීය සුදුසුකම් ලත් යුද්ධ හමුදා සාමාජිකයින් වෙත සහතිකපත්‍ර පිරිනැමේ









රණවිරු සම්පත් කේන්ද්‍රය මගින් පවත්වනු ලැබූ තාක්ෂණික පාඨමාලාවන් හැදෑරීමෙන් අනතුරුව ජාත්‍යන්තරව පිළිගත් ජාතික වෘත්තීය 4 සහ 3 මට්ටම සඳහා සුදුසුකම් ලැබූ යුද්ධ හමුදා සාමාජිකයින් 30 දෙනකු සඳහා සහතිකපත්‍ර ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 27 වන දින පස්වරුවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි.

පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී සහ සුබසාධක අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ආර්පීජ්ආර්පී රාජපක්ෂ ආර්එස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ මූලිකත්වය දැරීය. එසේම මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එස්ඩියූ සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය කේ.ඒ ලලිතධීර මහතාද එක්ව සිටියහ.

සේවයේ යෙදී සිටින විවිධ හැකියාවන්ගෙන් යුත් යුද්ධ හමුදා සාමාජිකයින් සඳහාත්, ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම යාමට අපේක්ෂිත සමාජිකයින්ට තාක්ෂණික වශයෙන් අවශ්‍ය වෘත්තීය සුදුසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහාත්, විශ්‍රාමික යුධ, නාවික සහ ගුවන්, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන අයවළුන් සඳහා පුහුණුව ලබාදීමේ අරමුණින් මෙම රණවිරු සම්පත් කේන්ද්‍රය වර්ෂ 2013 දී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමග එක්ව ස්ථාපිත කරන ලදී.

එහිදී න්‍යායික සහ ප්‍රායෝගික යන දෙඅංශම ආවරණය වන පරිදි වෘත්තීය පුහුණු අධිකාරියෙහි සුදුසුකම් ලත් උපදේශකයින් විසින් අදාල දේශන පවත්වනු ලබන අතර, සුදුසුකම් ලැබීමේ සියලුම විභාග සහ ඇගයීම් කටයුතු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබයි. වර්ෂ 2013 වසරේ සිට මේ දක්වා ත්‍රිවිධ හමුදාවේ, ශ්‍රී ලංකා පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ සෙසු නිලයින් 1963 දෙනකු එම පාඨමාලාවන් සාර්ථකව හදාරා ඇති අතර, ඔවුන් ජාතික වෘත්තීය සුදුසුකම් 4 සහ 3 මට්ටමේ සුදුසුකම් ලබාගනිමින් විදේශ අධ්‍යාපන කටයුතු සඳහා පවා පහසුකම් ලබාගනී.

මෙම වැඩසටහනට සමගාමීව, ජාතික වෘත්තීය සුදුසුකම් ලැබූ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පවුල්වල දරුවන් වෙත විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යාමට ආධාර කිරීමේ අරමුණින් පසුගියදා පැවති උසස් පෙළ විභාගයෙන් දක්ෂතා දැක්වූ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය සිදුකිරීමද යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩල විසින් සිදුකරන ලදී. ඒ සඳහා මූල්‍යමය අනුග්‍රහකත්වය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, 'Dialog Axiata' පුද්ගලික සමාගම සහ යුද්ධ හමුදා සුභසාධන අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව ලබා දෙන ලදී. මෙහිදී රණවිරු සම්පත් කේන්ද්‍රය වෙත නිරන්තරයෙන් ලබා දෙන මගපෙන්වීම අගයමින් රණවිරු සම්පත් කේන්ද්‍රයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීසීසීආර් වෛද්‍යසේකර ආර්එස්පී විසින් යුද්ධ හමුදාධිපති වෙත සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# ඉන්දීය නාවික හමුදා ප්‍රධානී යුද්ධ හමුදාධිපති හමුවෙයි

ඉන්දීය නාවික හමුදා ප්‍රධානී අද්මිරාල් ආර් හරි කුමාර් පීවීඑස්එම් ඒවීඑස්එම් වීඑස්එම් ඒඩීසී (R Hari Kumar PVSM AVSM VSM ADC) පසුගිය දෙසැම්බර් 13 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. එහිදී යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රය වෙත සපැමිණි ඉන්දීය නාවික හමුදා ප්‍රධානී වෙත හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි.




මෙම සුහද හමුවේදී දෙරටෙහි පවත්නා ද්විපාර්ශ්වික සබඳතා සහ සමුද්‍රීය සහයෝගීතාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සහ එහි වැදගත්කම පිළිබඳ සාකච්ඡා කෙරිණ. තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහ ඉන්දීය නාවික හමුදාවේ අවධානයට ලක්විය යුතු ද්විපාර්ශ්වික කරුණු පිළිබඳවද එහිදී අදහස් හුවමාරු කරගත් ඔවුනු මුහුදු කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව සහ ඒ ආශ්‍රිත සෙසු කරුණු පිළිබඳවද වැඩිදුරටත් අවධානය යොමුකරනු ලැබූහ.

# නව නාවික හමුදාධිපතිට යුද්ධ හමුදාවෙන් ගෞරවනීය පිළිගැනුමක්





නාවික හමුදාධිපති ලෙස අභිනවයෙන් රාජකාරි ඇරඹූ වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් දෙසැම්බර් 28 වන දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. යුද්ධ හමුදාධිපති සහ නව නාවික හමුදාධිපති අතර පැවති සුහද සාකච්ඡාවේදී ජාතික ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා සිදුකරනු ලබන කර්තව්‍යයන්හිදී සමීප සබඳතා පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරනු ලැබූ අතර ත්‍රස්තවාදීන් හමුවේ මව්බිමේ ඒකීයභාවය සුරැකීම සඳහා වසර ගණනාවක් පුරාවට සිදුකරනු ලැබූ ප්‍රයත්නයන් පිළිබඳව ද සිහිපත් කරනු ලැබූහ. මෙම සුහද හමුව සමාප්තියේ, යුද්ධ හමුදාධිපති විසින් නාවික හමුදාධිපති වෙත විශේෂ සමරු තිළිණයක්ද ප්‍රදානය කරමින් සිය අනාගත රාජකාරි කටයුතු සාර්ථක කරගැනීම සඳහා සුබපැතුම් එක්කරනු ලැබීය.

# ඉන්දියාවේ සෙනගල් ජනරජ තානාපති කාර්යාලයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදා උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි

ඉන්දියාවේ සෙනගල් ජනරජ තානාපති කාර්යාලයේ යුද්ධ, නාවික සහ ගුවන් හමුදා උපදේශක කර්නල් අබ්දුලායේ ට්‍රායෝ (Colonel Abdoulaye Traore) පසුගිය දෙසැම්බර් 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. මෙම සුහද හමුවේදී දෙරටෙහිම හමුදාවන්ට වැදගත් වන පොදු කරුණු පිළිබඳ සාකච්ඡා කෙරුණු අතර, ත්‍රිවිධ හමුදා සාමාජිකයින් අතර පවතින සුහදත්වය, සහයෝගීතාවය සහ අවබෝධය වැඩිදියුණු කරගැනීමේ වැදගත්කම පිළිබඳව ද එහිදී සිහිපත් කෙරිණ.



කර්නල් අබ්දුලායේ ට්‍රායෝ මේ වනවිට ශ්‍රී ලංකාවේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සහ රාජ්‍යතන්ත්‍රය පිළිබඳ 5 වන ආරක්ෂක උපදේශක පාඨමාලාව හදාරමින් සිටියි.

# පිලිපීන ජනරජ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයින වෙනුවෙන් පත්කළ ඉන්දියාවේ පිලිපීන ජනරජ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක පිලිපීන යුද්ධ හමුදාවේ කර්නල් රෝලැන්ඩෝ ගෝමස් (Colonel Rolando Gomez) ඉකුත් දෙසැම්බර් 09 වන දින පෙරවරුවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු හමුවිය. මෙම සුහද හමුවේදී දෙරටෙහි යුද්ධ හමුදාවන්ට වැදගත් වන පොදු කරුණු පිලිබඳ කරුණු සාකච්ඡා කෙරිණි. කර්නල් රෝලැන්ඩෝ ගෝමස් මේ වනවිට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආරක්ෂක ප්‍රතිපත්ති සඳහා වන ජිනීවා මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ආරක්ෂක සහ රාජ්‍ය තාන්ත්‍රික පිළිබඳ 5 වන ආරක්ෂක උපදේශක පාඨමාලාව හදාරමින් සිටියි.



# යුද්ධ හමුදාධිපති ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් අමතයි





සපුගස්කන්ද, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ අණ හා මාණ්ඩලික පාඨමාලා අංක 16 හැදෑරූ උපාධි අපේක්ෂකයින් ආමන්ත්‍රණය කිරීම පසුගිය දෙසැම්බර් 01 වන දින එම විද්‍යාල පරිශ්‍රයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු විසින් සිදුකරන ලදී.

එහිදී, "ජාතික ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවධානය" මැයෙන් යුද්ධ හමුදාධිපති සිය දේශනය පැවැත්වූ අතර, "පසුගිය වසර 72 තුළ ජාතික ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දැක්ම", "වර්තමානයේ පවතින සංකීර්ණ ආරක්ෂක පරිසරය", "වර්තමාන සන්දර්භය අනුව ආරක්ෂාව පිළිබඳ යුද්ධ හමුදාවේ දැක්ම" ඔහු විසින් පැහැදිලි කරන ලදී. තවද, "ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අනාගත සැලසුම්", "නිදහසින් පසු 1971 දක්වා සහ 1971-1990 අතර කාලය තුළ රටේ පැවති ආරක්ෂක තත්ත්වයෙහි සිදුවූ වර්ධනයන්", "පශ්චාත් යුධ සමයේ සිට වර්තමානය දක්වා කාලය තුළ සිදුකළ මානුෂීය මෙහෙයුම් මෙන්ම වර්තමානයේදී යුද්ධ හමුදාවට එල්ල විය හැකි අභියෝග" පිළිබඳවද පුළුල් විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලදී.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති විසින් එම මාණ්ඩලික පාඨමාලාවේ උපාධි අපේක්ෂක නිලධාරීන් ආමන්ත්‍රණය සිදුකරන ලද අතර, එය වාර්ෂිකව සම්ප්‍රදායානුකූලව සිදුකරනු ලබන්නකි. මෙම අවස්ථාවට විදේශීය නිලධාරීන් 22 දෙනකු ඇතුළු උපාධි අපේක්ෂකයින් 149 දෙනකු සහභාගී වූහ.

# යුද්ධ හමුදා විද්‍යාපීඨයට නවීන පහසුකම්



පසුගිය දෙසැම්බර් 17 වන දින දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පැවති කෙඩෙට් නිලධාරීන්ගේ විසිරයාමේ උත්සවයෙන් අනතුරුව එම විද්‍යාලයේ යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කරමින් එම පරිශ්‍රයේදී ඉදිකරනු ලැබූ නව "මැනුම්හල" සහ "ද රෙඩ් ලැන්ටන්" (The Red Lantern) නම් නව ආපනශාලාව විවෘත කිරීමද සිදුවිය.

යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියන්ගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම නව පහසුකම් සංකීර්ණය සහ ආපනශාලාව විවෘත කිරීමට එක්විය.

# නව යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි රාජකාරි අරඹයි

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 61 වන මාණ්ඩලික ප්‍රධානී ලෙස ශ්‍රී ලංකා පාබල හමුදාවේ මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය දෙසැම්බර් 01 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී සුබ මොහොතින් සිය තනතුරේ රාජකාරි අරඹන ලදී.**



ඉහත ධූරය සඳහා පත්වීමට ප්‍රථම යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි ලෙස රාජකාරි හොබවනු ලැබූ හෙතෙම ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ධූරයේද කටයුතු කරනු ලබයි.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී 1986 ඔක්තෝබර් මස 27 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳී කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 26 යටතේ දෙවන ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්ව වර්ෂ 1987 ජූලි මස 23 දින 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුළත්ව තිබේ. යුද්ධ හමුදාව තුළ වසර 36 කට අධික නිකැලැල් සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හෙතෙම තම යුද්ධ හමුදා දිවිය තුළ විවිධ ශ්‍රේණිවල තනතුරු රැසක් හොබවා ඇති අතර, විශේෂයෙන්ම මානුෂීය මෙහෙයුම් කාලසීමාව තුළ 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ලෙස සුවිශේෂී මෙහෙවරක නිරත නිලධාරියෙකි.

නව මාණ්ඩලික ප්‍රධානී යුද බිමෙහි දක්වන ලද රණකාමීත්වය ඇගයීම වස් රණවික්‍රම හා රණශූර පදක්කම්වලින්ද පිදුම් ලබා ඇති රණකාමී අත්දැකීම් සපිරි පරිනත නිලධාරියෙකි. ඉදිරියටද යුද හමුදාව වෙනුවෙන් හා රට වෙනුවෙන් අනගි මෙහෙයක් සිදුකිරීමට නව මාණ්ඩලික ප්‍රධානී හට අවැසි ශක්තිය ධෛර්යය "රණවිරුවා" තුළින් අපිද පතන්නෙමු.

# ශ්‍රී ලංකා පාබල හමුදාවේ නව රෙජිමේන්තු අධිපති රාජකාරි අරඹයි



ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 15 වන රෙජිමේන්තු අධිපති ලෙස යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පසුගිය දෙසැම්බර් 03 වන දින පැවති හමුදා සම්ප්‍රදායානුකූල උත්සවයකදී සුබ මොහොතින් රාජකාරි භාරගනු ලැබීය.



# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී නැගෙනහිර ආරක්ෂක සේනා මුලස්ථානයේ පාලන පරීක්ෂාවකට එක්වෙමින්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ඉකුත් දෙසැම්බර් මස 12 වන දින නැගෙනහිර ආරක්ෂක සේනා මුලස්ථානයේ පාලන පරීක්ෂාවකට එක්විය. මේ සඳහා එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත සියළු අංශ ආයතන නියෝජනය කරමින් හටපිරිස් සහභාගි වූහ. එහිදී ඔවුනගේ සියලු පරිපාලන ගැටළුවලට විසඳුම් ලබාදෙමින් එම පාලන පරීක්ෂාවේ වැදගත්කම පිළිබඳ මාණ්ඩලික ප්‍රධාන විසින් පැහැදිලි කරන ලදී. එම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පීඑස්සී, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති, සේනාංකාධිපතිවරු සහ බලසේනාධිපතිවරු ද එක්වූහ.

# නව යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රාජකාරි අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් දෙසැම්බර් 14 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී රාජකාරි ආරම්භ කරනු ලැබීය.

එම තනතුරේ රාජකාරි භාරගැනීමට ප්‍රථම හෙතෙම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ධූරයද, හෙබවූවේය. බොහෝ රණකාමී අත්දැකීම් සපිරි පරිනත නිලධාරියකු වූ එතුමන් අභිමානවත් විශේෂ බලකායෙන් බිහිවූ දක්ෂ නිලධාරියෙකි. සිය තනතුර හරහා නව නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී වෙත යුද්ධ හමුදාවටත්, රටටත් තවදුරටත් විශිෂ්ට මෙහෙවරක් කිරීමට "රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.





# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක රාජකාරී අරඹයි





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ 50 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඉකුත් දෙසැම්බර් 22 වන දින කොස්ගම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී රාජකාරි අරඹනු ලැබීය. දශක තුනහමාරකට වැඩි දීර්ඝ සේවා කාලයක් සහිත පරිනත දක්ෂ නිලධාරියකු වූ හෙතෙම මීට ප්‍රථම ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ධූරයේ රාජකාරී හෙබවූ අතර, ඔහු ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බලකාධිපති ලෙසද කටයුතු කරයි. ප්‍රෞඪත්වයෙන් සපිරි යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ ඓතිහාසික ගමන්මග තවදුරටත් අලෝකමත් කරමින් ඊට අවැසි නිවැරදි නායකත්වය ලබාදෙන්නට නව සේනාවිධායක වෙත ශක්තිය ධෛර්යය නොඅඩුව ලැබේවායි "රණවිරුවා" තුලින් අපිද සුභාශිංශන පතන්නෙමු.

# පාකිස්ථාන මහකොමසාරිස් 1 වන බලකායේ සංචාරය



පාකිස්ථාන මහකොමසාරිස් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) උමාර් පාරුක් බුර්කි පසුගිය නොවැම්බර් 24 වන දින 1 වන බලකායේ සංචාරයක නිරත විය. එහිදී, බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥාණරත්න එන්ඩීසී පීඑස්සී විසින් එතුමන්ව ඉතා උණුසුම් ලෙස පිළිගනු ලැබූ අතර, පසුව එම බලකාය විසින් සිදුකරනු ලබන රාජකාරී පිළිබඳ මහකොමසාරිස් වරයා දැනුවත් කිරීමටද කටයුතු කරනු ලැබිය. මෙම අවස්ථාව සනිටුහන් කරමින් දෙදෙනා අතර, සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය.

# ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය 67 වන සංවත්සරය සමරයි



ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය සිය 67 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් 15 දින අභිමානවත්ව සමරනු ලැබිය. එම අවස්ථාවට ලලී කොබ්බෑකඩුව මහත්මිය, සන්නාහ සන්නද්ධ බලකායට අයත් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ඔවුන්ගේ භාර්යාවන්, එම බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වෛද්‍ය හර්ෂණී බෝතොට ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ. තවද එදින එම බලකායේ රණවිරුවන් සහ සිවිල් සේවක මහතුන්ගේ තෝරාගත් දූ දරුවන් දස දෙනකු හට ඉදිරි ඉගෙනීම් කටයුතු වෙනුවෙන් වර්ෂයකට රුපියල් 36,000.00 ක් බැගින් ශිෂ්‍යත්ව 10 ක් සහ ඉදිරි වසර සඳහා අවැසි පාසල් උපකරණ බෙදාදීමක්ද සිදුකරන ලදී.





# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟාවලිය



යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ තරඟාවලිය පිරිමි සහ අන්තර් බලඇණි එල්ලේ තරඟාවලිය කාන්තා ඉකුත් නොවැම්බර් 14 වන දින සිට 21 වන දින දක්වා දියගම මහින්ද රාජපක්‍ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහිදී, පාබල හමුදා එල්ලේ කණ්ඩායම යුද්ධ හමුදා සේවා බලකා කණ්ඩායම පරදවා පිරිමි අංශයේ ශූරතාවය දිනාගත් අතර, ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව එහි තෙවැනි ස්ථානයට පත්විය.



මේ අතර, 5(සේවා) යුද්ධ හමුදා කාන්තා බලකාය විසින් 4(සේවා) යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම පරදවා ශූරතාවය දිනාගත් අතර, 7 වන යුද්ධ හමුදා කාන්තා බලකාය එහි තෙවැනි ස්ථානයට පත්විය. සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ඩීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

# සුබසාධක වෙළඳසැල විවෘත කරමින්






හමුදා සමාජිකයින්ට මෙන්ම සිවිල් සමාජිකයන්ටද තොග සහ සිල්ලර වෙළඳ පහසුකම් සැලසීමේ අරමුණින් කන්කසන්තුරය අතරමැදි කඳවුරෙහි ස්ථාපිත කර තිබූ යුද්ධ හමුදා සුබසාධක වෙළඳසැල එම ස්ථානයෙන් ඉවත්කර නව ස්ථානයක ස්ථාපිත කර පසුගිය නොවැම්බර් මස 15 වන දින ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණ. එහි ඉදිකිරීම් කටයුතු සඳහා 10 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුවේ සහ 5 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවල භටපිරිස් දායක වූහ.

# විරු දෑතින් නිසට සෙවණක්



55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ මඟපෙන්වීම යටතේ 551 වන පාබල බලසෙනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණයෙන් යාපනය පේදුරුතුඩුව පුලෝලි (බටහිර) ප්‍රදේශයේ අඩුආදායම්ලාභී ජයරූපන් නන්දනී මහත්මිය සඳහා නව නිවසක් ඉදිකර පසුගිය නොවැම්බර් 22 වන දින පරිත්‍යාග කෙරිණ. එමෙන්ම නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ දරුවන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමක්ද එහිදී සිදුවිය. විශ්‍රාමික මේජර් ජෙනරාල් ආර් රත්නසිංහම් ගේ සම්බන්ධීකරණයෙන් ශිලා එමානුවෙල් මහත්මියගේ මූල්‍ය දායකත්වයෙන් 551 වන පාබල බලසේනාවේ භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් එම නිවසේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබීය.

මෙම අවස්ථාවට ආරක්ෂක සේනාව (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩියූ පීඑස්සී අයිජී, 551 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීසීඒ වික්‍රමසිංහ යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# අඩු ආදායම්ලාභී පවුලකට නව නිවසක්



වව්නියාව ප්‍රදේශීය ලේකම් එන් කමලදාසන් මහතා විසින් වෙන්කර දෙනු ලැබූ රජයට අයත් පර්චස් 40 ඉඩම් කොටසක 217 රාසේන්ද්‍රකුලම් ග්‍රාම නිලධාරී වසමේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුලක් වන එස් ශාන්තා මහත්මිය වෙත අංග සම්පූර්ණ නව නිවසක් ඉදිකර භාරදීම පසුගිය දෙසැම්බර් 09 වන දින සිදුකෙරිණ.

එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. මෙම උත්සව අවස්ථාව සඳහා 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 561, 562 හා 563 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීන්, ඉදිකිරීම් සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදුන් පරිත්‍යාගශීලීන් ඇතුළු ප්‍රදේශවාසීන් රැසක් සහභාගී වූහ. එහි ඉදිකිරීම් කටයුතු 17 වන (සෙව්) සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිදුකරනු ලැබූහ.

# රාජ්‍යතාන්ත්‍රික ආරක්ෂක උපදේශකයින් පිරිසකගේ සංචාරය

ඕස්ට්‍රේලියාව, චීනය, කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, නෙදර්ලන්තය, පකිස්ථානය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල්වල රාජ්‍යතාන්ත්‍රික ආරක්ෂක උපදේශකයින් පිරිසක් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි සංචාරයක නිරත විය. එහිදී, ප්‍රදේශයේ වත්මන් තත්ත්වය හා යුද්ධ හමුදාව විසින් ප්‍රදේශයේ ජනතාව වෙත සිදුකරනු ලබන ප්‍රජාසත්කාරක වැඩසටහන් සබැඳිව ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් එම භටපිරිස දැනුවත් කරන ලදී.



# අන්තර් සේනාංක පාපන්දු තරඟාවලිය





ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති ගේ අදහසකට අනුව 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අධීක්ෂණයෙන් සේනාංක අතර එකමුතුභාවය හා ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කරවීම සඳහා පැවති අන්තර් සේනාංක පාපන්දු තරඟාවලියේ අවසන් මහා තරගය ඉකුත් දෙසැම්බර් 10 වන දින ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිකුණාමලයේ ඊහම්පරම් ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

22 වන පාබල සේනාංක කණ්ඩායම හා 23 වන පාබල සේනාංක කණ්ඩායම අතර පැවති අවසන් මහා තරගයේදී ගෝල 1 - 0 ක් ලෙස 22 වන පාබල සේනාංක කණ්ඩායම ජයග්‍රහණය අත්කර ගනු ලැබීය. අවසන් මහා තරගාවලිය විචිත්‍රවත් කිරීම සඳහා යුද්ධ හමුදා අංගම්පොර ක්‍රීඩා සංදර්ශනයක්, වයිකොන්ඩෝ ඉසව්වක් සහ බටහිර තූර්යවාදක සංදර්ශනයක්ද පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා ඉනපෙ (නැ) ආඥාපති, 23 වන සහ 24 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





# ජන දිවියට අත්වැලක්

ආරක්ෂක සේනා (මුලතිව්) අඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් 593 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ජීවත් වන අඩු ආදායම්ලාභීන් උදෙසා සහන රැසක් සැලසීමට ක්‍රියාකෙරිණ. මේ යටතේ ගැබිනි මව්වරුන් 50 දෙනකු සඳහා රුපියල් 10,000.00 වටිනාකමින් යුත් අත්‍යවශ්‍ය භාණ්ඩ දමිළ පවුල් 200 ක් සඳහා රුපියල් 15,000.00 වටිනාකමින් යුත් වියළි සලාක මෙන්ද කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් 50 දෙනකු සඳහා උදළු තල 50ක්ද බෙදාදෙන ලදී.

පසුගිය නොවැම්බර් 28 වන දින සිදුකළ මෙම සත්කාර්යයට 19 වන බළඇණිය ගැමුණු හේවා බලකාය හා 5 වන බළඇණි ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව එක්වූ අතර, පූජ්‍ය නාකුළුගමුවේ සුමන ස්වාමීන් වහන්සේගේ හා සරණ පදනමේ ධන පරිත්‍යාගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණ. මෙම උත්සව අයස්ථාව සඳහා විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, 59 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 593 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්පීඑස්බී කුලතුංග ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් වැසියන් 300 පමණ සහභාගී වූහ.

# “යුද්ධ හමුදාධිපති උතුරු පළාත් අභියෝගතා කුසලානය - 2022”





යුද හමුදාව සහ සිවිල් ජනතාව අතර සුහදත්වය සහ සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් යාපනය, කිලිනොච්චිය, මුලතිව් වව්නියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පාපන්දු කණ්ඩායම් 25 ක සහභාගීත්වයෙන් "යුද්ධ හමුදාධිපති උතුරු පළාත් අභියෝගතා කුසලානය - 2022" පාපන්දු තරගාවලිය පසුගියදා පැවැත්විණ. එහි අවසන් මහා තරගය පසුගිය නොවැම්බර් 28 වන දින ආරක්ෂක සේනා (මුලතිව්) අණදෙන නිලධාරී/අග්‍රාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් උතුරු පළාත් ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්විණ.

පුනරින් ශාන්ත මේරි කණ්ඩායම හා උරිතිපුරම් කණ්ඩායම් අතර පැවති අවසන් මහා තරගයේදී තියුණු සටනකින් අනතුරුව ගෝල 1 - 1 ක් වශයෙන් ලබාගෙන කණ්ඩායම් දෙකම සම ශූරයින් බවට පත්විණි. එහිදී, ජයග්‍රාහී කණ්ඩායම් දෙක සඳහා රු.150,000.00 බැගින් රු.300,000.00 ක මුදල් ත්‍යාග හා කුසලාන ප්‍රදානය කරන ලදී.

අවසන් මහ තරගය නැරඹීම සඳහා උතුරු පළාතේ අති විශාල පාපන්දු ක්‍රීඩා ලෝලීන් පිරිසක් සහභාගී වූ අතර, ආරක්ෂක සේනා මුලතිව් බලප්‍රදේශයේ සියලුම සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු හා අණදෙන නිලධාරීන් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් මෙම තරගය නැරඹීම සඳහා සහභාගී වූහ.

# මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්





2022 දෙසැම්බර් 10 වන දිනට යෙදුණු ලෝක මානව හිමිකම් දිනයට සමගාමීව මානව හිමිකම් පිළිබඳ වටිනා දැනුවත් කිරීමේ වැඩසටහනක් පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මානව හිමිකම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ටීසීකේ පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සහභාගිත්වයෙන් පැවති මෙම වැඩසටහන සැසිවාර දෙකකින් සමන්විත විය. එය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන් අධ්‍යක්ෂ නීතිඥ මේනකා හේරත් මහත්මිය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විශේෂ විමර්ශන අධ්‍යක්ෂ නීතිඥ සුලාරි ලියනගම සහත්මිය විසින් මෙහෙයවනු ලැබූහ.

වර්තමාන සමාජයට මානව හිමිකම්වල ඇති වැදගත්කම සහ විශේෂයෙන්ම යුද්ධ හමුදා හටපිරිස් සිවිල් ජනතාව සමග සිය රාජකාරි ඉටු කිරීමේදී ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සබැඳිව මෙම දේශණය හරහා දැනුවත් කෙරිණ. 14 වන පාබල සේනාංක බලප්‍රදේශයට අයත් සහ පනාගොඩ යුද්ධ හමුදා ජනපදයෙහි රාජකාරී සිදුකරනු ලබන නිලධාරීන් 50 ක් සහ සෙසුනිලයින් 150 දෙනකු මෙම දේශණ සඳහා සහභාගි වූහ.

# මධ්‍යම ආඥාපති ගේ සංචාර සටහන්



ආරක්ෂක සේනා මූලස්ථාන (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්ඒම්ජේම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඒන්ඩියූ නවතමයෙන් ඉදිකරන ලද පල්ලේකැලේ යුද හමුදා රෝහල, 4 සහ 5 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයන්හි පසුගිය දෙසැම්බර් 02 සහ 03 දෙදින නිල සංචාරයන්හි නිරත විය.



එහිදී, උකුවෙල, බෝවතැන්න සහ මොරගහකන්ද යන බලාගාරයන් ආඥාපති ගේ නිරීක්ෂණයට බඳුන් විය. මෙම සංචාරය සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) ආඥාපති හා 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# නිවසක ගින්නක් මැඩලීමට 111 වන බලසේනාවේ භටපිරිස් සමත්වෙති



111 වන බලසේනාව යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා භටපිරිස් ඉකුත් දෙසැම්බර් 17 වන දින මහනුවර, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි නිවසක ඇති ගබඩාවක පැතිර යමින් තිබූ ගින්නක් පාලනය කිරීමට සමත් වූහ. 2 වන (ස්වේච්ඡා) සිංහ රෙජිමේන්තුවේ හා 10 වන ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් මහනුවර පොලිසියේ ජීවිතාරක්ෂක නිලධාරීන් එක්ව මෙම ගින්න පැතිරයාම වළක්වමින් ඉතා සාර්ථකව එය පාලනය කිරීමට කටයුතු කළහ.

# ගාල්ල දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් සමග සුහද හමුවක්





61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්ඩබ්ලිව් හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී සිය නව තනතුරේ වැඩභාර ගැනීමෙන් අනතුරුව පසුගිය නොවැම්බර් 24 වන දින දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ මහතා සහ ගාල්ල දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ යන රාජ්‍ය නිලධාරීන් හමුවූහ. එහිදී ගාල්ල දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සහ සිවිල් සම්බන්ධීකරණ කටයුතු ආදී කරුණු කිහිපයක් සබැඳිව සුහදව කරුණු හුවමාරු කරගන්නා ලදී.

# 59 වන පාබල සේනාංකය 15 වන සංවත්සරය සමරයි





59 වන පාබල සේනාංක මූලස්ථානයේ 15 වන සංවත්සරය ඉකුත් දෙසැම්බර් මස 01 වන දිනට යෙදී තිබූ අතර, ඒ වෙනුවෙන් ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් වැඩසටහන් මාලාවක් පැවැත්විණ. 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වෙත සම්මාන මුරයක් පිරිනැමීම, ඔහු විසින් භටපිරිස් ඇමතීම, එම පාබල සේනාංකයේ සියලු නිලයන් වෙනුවෙන් පැවති සුහද හමුව සහ සංගීත ප්‍රසංගය එහිදී ප්‍රධාන විය. එම අවස්ථාව සඳහා 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.

# 29 වන බලඇණි සංවත්සර දිනය සමරමින්





ඉකුත් දෙසැම්බර් මස 03 වන දින මන්නාරම් ජීවනගර් ප්‍රදේශයේ ස්ථාපිත 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සිය 29 වන බලඇණි සංවත්සරය සමරන ලදී. එහිදී, ඒකකයේ භටපිරිස් විසින් ඒකක අණදෙන නිලධාරී මේජර් ජීඑන්පීආර් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී හට කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, අණදෙන නිලධාරී විසින් භටපිරිස් ඇමතීම, සියලු නිල භෝජන සංග්‍රහය සිදුකෙරිණ. අනතුරුව ඉකුත් දෙසැම්බර් මස 04 වන දින සියලු නිලයින්ගේ සාමූහිකත්වයෙන් අන්තර් කණ්ඩායම් සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක්ද පවත්වන ලදී.  තවද, සංවත්සරයට සමගාමීව 8 වන විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් විසින් එම ඒකක බලප්‍රදේශයේ දිළිඳු පවුල් 25 ක් සඳහා වියළි සලාක ආහාර ද්‍රව්‍ය පාර්සල් බෙදාදීම මෙන්ම කඳවුරු භූමියේදී ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීමද සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙනුණි.

# ඉගෙනුමට අත්වැලක්





12 වන පාබල සේනාංකයේ සම්බන්ධීකරණයෙන් මො/දෙවගමුව කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබන පාසල් සිසුන් 475 දෙනකු සඳහා නිල ඇඳුම් සහ දිවා ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් සිත්මීර කන්ට්‍රක්ෂන් ආයතනයේ පූර්ණ දායකත්වයෙන් පසුගිය දෙසැම්බර් 06 වන දින එම විද්‍යාලයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට සිත්මීර කන්ට්‍රක්ෂන් ආයතනයෙහි කාර්යය මණ්ඩලය, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී හා 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂ බලමුළුවෙහි අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පාසල් උපකරණ හා වියළි සලාක පරිත්‍යාගයක්





62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත මු/ඇහැටුගස්වැව මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන පාසල් ළමුන් 50 දෙනකු සඳහා පාසල් උපකරණ හා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 25 වන දින සිදුකරන ලදී. මෙහිදී, එක් පාසල් ළමයකු සඳහා රුපියල් 8,000.00 වටිනා පාසල් උපකරණ සහ රුපියල් 3,500.00 ක් වූ බැගින් සලාක මළු 50 ක් ලබාදෙන ලදී. මෙම වැඩසටහන 622 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 9 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ගේ සංවිධානයෙන් යුතුව සිදුකරන ලද අතර, ඊට මූල්‍ය අනුග්‍රහය එන්එස් ප්‍රමෝෂන්ස් ආයතනය, ද කිචන් හවුස් ආයතනය සහ වර්ණ ෆාමසි විසින් ලබාදෙන ලදී.

# දිවියට සවියක් වෙමින්





2(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තු බලප්‍රදේශයෙහි මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කේට්ඨාශයේ ලිඳවැව ගම්මානයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 26 වන දින සිදුකෙරිණ. ඒ සඳහා මූල්‍ය දායකත්වය කඩවත සරණ බෞද්ධ පදනම පුණ්‍යායතනයේ සුනිල් විජේවර්ධන මහතාගේ සම්බන්ධීකරණයෙන් සිංගප්පූරුවේ සුමන නායක ස්වාමීන් වහන්සේ විසින් සපයනු ලැබිය. මෙම අවස්ථාව සඳහා 2(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ආර්එම්කේබී රත්නායක ආර්එස්පී, නිලධාරීන්, පාසල් දරුවන්, ප්‍රදේශවාසීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති 611 පාබල බලසේනාවේ සංචාරයක





61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්ලූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී සිය තනතුරේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව පසුගිය දෙසැම්බර් මස 07 වන දින 611 වන පාබල බලසේනාවෙහි සංචාරයක නිරත විය. එහිදී, එම බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්එන් ඇරැගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව සේනාංකාධිපති උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. මෙම අවස්ථාව සඳහා එම බලසේනා බලප්‍රදේශය තුළ ස්ථාපිත 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 8 වන බලඇණිය ගැමුණු හේවා බලකායේ අණදෙන නිලධාරීන්ද සහභාගී වූහ.

# නිසට සෙවණක් දිරියට සවියක්



51 වන පාබල සේනාංකාධිපති ගේ උපදෙස් පරිදි 513 වන පාබල බලසේනාධිපතිගේ මගපෙන්වීම මත අඩු ආදායම්ලාභී පවුල් වෙත නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ තවත් අදියරක් ලෙස ප්‍රනාන්දු රනුශාන් මහත්මා හට නව නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමේ උත්සවයක් පසුගිය දෙසැම්බර් 09 වන දින පැවැත්විණ. 11 වන පාබල හමුදා බලඇණියේ ශ්‍රම දායකත්වය හා ඉංජිනේරු සහය මත මෙහි ඉදිකිරීමට කටයුතු සිදුකරනු ලබන අතර, ඒ සඳහා මූල්‍ය දායකත්වය කැනඩාවේ වෙසෙන සින්නදුරෙහි සෙත්තිවේල් හා මෝදර මට්ටක්කුලිය සිංහ සමාජයේ සාමාජිකයින් විසින් සපයනු ලබයි. තවද, මෙම උත්සවයට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කෙරිණ. මෙම අවස්ථාව සඳහා 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, 513 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ආර් රාශික් ආර්එස්පී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් හා ප්‍රදේශවාසීන් සහභාගී වූහ.

# විරු නිසට සෙවණක්



55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් පරිදි එම සේනාංකයේ ලිපිකරුවකු වශයෙන් රාජකාරි නියුතු සැරයන් බංඩාරනායක හට නිවසක් ඉදිකර පරිත්‍යාග කිරීම පසුගිය දෙසැම්බර් 08 වන දින සිදුකෙරිණ. මෙම මානුෂීය කටයුත්ත සඳහා මූල්‍ය දායකත්වය ඇමෙරිකාවේ වෙසෙන විග් නඩරාජා මහත්මා විසින් රුපියල් මිලියන 1.3 ක් ලබාදී ඇති අතර, 55 වන පාබල සේනාංකයේ තාක්ෂණික සහ ශ්‍රම දායකත්වය සපයනු ලැබීය. මෙම නිවස පරිත්‍යාග කිරීමේ අවස්ථාවට 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේජීඑස් ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ අයිජී ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# "යුද සාහිත්‍යය" දේශන මාලාවක්









යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් දීපව්‍යාප්තව සිදුකළ නවත් "යුද සාහිත්‍යය" දේශන මාලාවක් 2022 දෙසැම්බර් මසදී පැවැත්විණ. ඒ යටතේ කටුකෙලියාව බළඇණි පුහුණු පාසල, ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය, තිසාවැව ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා පුහුණු පාසල හා මැණික්ෆාම්හි යාන්ත්‍රික පාබල පුහුණු මධ්‍යස්ථානය යන ස්ථානවලදී දේශන පැවැත්විණ.

තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට දායක වූ විරුවන් අගයමින් එකී මතක හා අත්දැකීම් පිළිබඳ නව පරපුර දැනුවත් කිරීම මෙම "යුද සාහිත්‍යය" ප්‍රචලිත කිරීමේ අරමුණයි. මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් එම දේශන මෙහෙයවන ලදී.

# ජල පිරිපහදු යන්ත්‍රයක් ජනතා අයිතියට





17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ නිලධාරීන් සහ සෙසුනිලයින් කුඹුරුපිඩ්ඩි ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ පානීය ජල ගැටළුවට විසඳුමක් වශයෙන් එම කඳවුර තුළ ජල පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපනය කර ඉකුත් දෙසැම්බර් 09 වන දින විවෘත කරනු ලැබූහ. මේ සඳහා මූල්‍ය අනුග්‍රහය හොරණ පිහිටි බොඩිලයින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් දරණ ලදී. මෙම විවෘත කිරීමේ අවස්ථාවට හොරණ බොඩි ලයින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතයේ නිලධාරීන්, කුඹුරුපිඩ්ඩි විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලා, ඉරක්කාණ්ඩි මොහෙයිදීන් ජුම්මා පල්ලියේ මව්ලවි ඇතුළු සිවිල් වැසියන් පිරිසක් සහභාගී වූහ.

# බෝධිපූජා පිංකමක්





සිය මාතෘ භූමිය වෙනුවෙන් ආරක්ෂාව සපත කරමින් ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන්ට පුණ්‍යානුමෝදනා කිරීම සහ රණක්ෂිතයට පත් රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම උදෙසා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම මත ඉකුත් දෙසැම්බර් 22 වන දින කෝට්ටේ ශ්‍රී නාග විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් සංවිධානය කරන ලදී.

මෙම බෝධි පූජා පිංකම කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති සුභද්‍රාරාම විද්‍යායතන මහ පිරිවෙනේ නියෝජ්‍ය පරිවේනාධිපති, රාජකීය පණ්ඩිත දර්ශනපති පූජ්‍ය චතුරවිල සිරි සුජාත නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා එම මහ පිරිවෙනෙහි ආචාර්ය කැගල්ලේ පඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේගේ මෙහෙයවීමෙන් පැවැත්විණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සමගින් ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් ඇතුළු සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් රැසක් ඊට සහභාගී වූහ.

# අභිමංසල 1 අනුරාධපුරය සුවසහන මධ්‍යස්ථානයේ සංචාරයක





ක්‍රියාන්විතයේදී තුවාල ලබා රණක්ෂිතව දැනට අභිමංසල 1 අනුරාධපුරය සුවසහන මධ්‍යස්ථානයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීමේ රෝහල් සංචාරයක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා ගජබා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් නොවැම්බර් 30 වන දින සිදුකරනු ලැබූහ. එහිදී, රණක්ෂිත රණවිරුවන් වෙත ප්‍රණීත කෙටි ආහාර වේලක් සමග තේ පැන් සංග්‍රහයක් ලබාදීමටද ඔවුන්ගේ ප්‍රයෝජනය පිණිස සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් පාර්සල් සහ ජලය බෙදාහැරීමේ උපකරණ කට්ටල 10 ක් පරිත්‍යාග කිරීමද සිදුකෙරිණ.

# මුල්ලේරියාව ජාතික රෝහල් පරිශ්‍රයේ නිරීක්ෂණ චාරිකාවක්





මුල්ලේරියාව ජාතික මානසික විද්‍යායතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 05 හි නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තාවන් හට දිවා ආහාරය ලබාදීම සහ එම වාට්ටුවට අවශ්‍ය පොදු අවශ්‍යතාවයන් සපුරාලීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 19 වන දින පැවැත්විණ.

එහිදී, රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන කාන්තාවන් වෙනුවෙන් සංගීතමය රසාස්වාදය යුද්ධ හමුදා සංගීත කණ්ඩායම විසින් ලබාදුන් අතර එම අස්ථාවේදී නේවාසික කාන්තාවන් විසින් නර්ථනයක්ද ඉදිරිපත් කරන ලදී. ඉන් අනතුරුව නත්තල් උත්සවය පාදක කරගනිමින් ඔවුනට නත්තල් තෑගි පාර්සල් ලබාදීමද සිදුකරන ලද අතර යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් ඔවුන් වෙත දිවා ආහාරය ලබාදීමටද කටයුතු කෙරිණ. එහිදී, රෝහල් කාර්ය මණ්ඩලය වෙතද ත්‍යාග පිරිනමන ලදී. තවද, ජාතික මානසික විද්‍යාතන අතරමැදි නිවස්නයේ වාට්ටු අංක 5 හි අලුත්වැඩියා කටයුතු සිදුකිරීමටද කටයුතු කිරීම විශේෂත්වයකි. මෙම අවස්ථාවට සේවාවනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, නිලධාරී, සෙසුනිලයින් මෙන්ම ජාතික මානසික විද්‍යාතන අතරමැදි නිවස්නයේ කාර්ය මණ්ලයේ අයවළුන්ද සහභාගී වූහ.

# සේවා වනිතා සභාපතිනිය දියතලාවේ සංචාරයක





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මිය විසින් ඉකුත් දෙසැම්බර් 16 වන දින එම ඒකකය වෙතින් දියතලාව ප්‍රදේශයෙහි පවත්වාගෙනු ලබන ***Shop of the Garrison*** නිරීක්ෂණ චාරිකාවකට එක්වූවාය. එහිදී, එම වෙළඳසැලේ කටයුතු පිළිබඳ සොයා බැලූ එතුමිය ඉදිරි අභිවෘද්ධිය උදෙසා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඔවුන් හා සාකච්ඡාවක නිරත වූවාය.

# දූදරුවන්ගේ කලා කුසලතා එළි දක්වමින්

මින්නේරිය විරු කැකුළු පෙර පාසලේ වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය ඉකුත් දෙසැම්බර් 01 වන දින පෙරවරුවේ සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ගිරිතලේ මධ්‍ය මහා විද්‍යාලයීය උත්සව ශාලාවේ පවත්වන ලද මෙම විවිධ ප්‍රසංගය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී, ඉනපෙ (නැ) ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී, සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් මෙන්ම දූදරුවන්ගේ දෙමාපියන්ද සහභාගී වූහ.

දූදරුවන්ගේ කලා කුසලතාවයන් ඔප්නංවමින් එය වර්ධනය කිරීම අරමුණු කරගෙන එළිදක්වන ලද විවිධ ප්‍රසංගය දූදරුවන්ගේ විචිත්‍රවත් අංගයන්ගෙන් වර්ණවත් විය.



# දියතලාව විරුකැකුළු පෙරපාසලේ නිරීක්ෂණ චාරිකාවක්





යුද්ධ හමුදා සේනා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය දෙසැම්බර් මස 16 වන දින එම ඒකකය වෙතින් පාලනය වන දියතලාවෙහි පිහිටි විරු කැකුළු පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. එහිදී, කුඩා දරුවන් සමග සුහද පිළිසඳරක නිරත වූ එතුමිය ඔවුන් වෙත පාසල් උපකරණ ද බෙදාදෙනු ලැබුවාය. එම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්පීඑම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඒන්ඩීයූ, එම මැතිණිය උදේනි ජයරත්න මහත්මිය ඇතුළු පිරිසක් ද එක්වූහ.

# පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් රණවිරු දිරියට පරිත්‍යාග රැසක්





පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව මඟින් සංවිධානය කරන ලද සෙබළුන්ගේ දෛනික වියදම් පහසු කරගැනීමේ පොළක් සහ පාසල් ළමුන් සඳහා පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 23 වන දින එම රෙජිමේන්තු පරිශ්‍රයේදී පවත්වන ලදී. පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුචිනා මෙත්තානන්ද මහත්මියගේ මඟපෙන්වීම සහ අනුග්‍රහය ඇතිව සංවිධානය කෙරුණු මෙම වැඩසටහනට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. තවද, යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී එන්ඩීසී සහ එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද ඊට එක්වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් ඉගෙනුමට අතහිත



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව "අතහිත 2022" සමාජ සත්කාරක වැඩසටහන යටතේ එම බලකාය සහ ශ්‍රී ලංකා කාන්තා බලකාය යටතේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාපනය ලබන දූදරුවන් 230 දෙනකු සඳහා පාසල් උපකරණ ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් 13 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක, සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය, සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# ගිලන් හදට සේවා වනිතාවෙන් සත්කාර



සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශෂිකා හේරත් මහත්මිය මුල්ලේරියාව මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් බැලීම සඳහා පසුගිය නොවැම්බර් 11 වන දින සංචාරයක නිරත වූවාය. එහිදී, ප්‍රතිකාර ලබන රෝගීන්ගේ යටිතල පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් එහි පිළිසකර කිරීම් හා අවශ්‍ය ගෘහ භාණ්ඩ ලබාදීමට මෙන්ම රෝගීන් වෙනුවෙන් දිවා ආහාර වේලක් ලබාදීමටද කටයුතු කරනු ලැබිය. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක්ද සහභාගී වූහ.

# අභිමංසල 1 සුවසහන නිකේතනයෙහි සංචාරයක්



අනුරාධාපුර අභිමංසල 1 සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ඔමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගිය නොවැම්බර් 26 වන දින රෝහල් සංචාරයක් සිදුකරනු ලැබුවාය. එහිදී, නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ විනෝදාස්වාදය සඳහා කැලිප්සෝ සංගීත කණ්ඩායමක් මගින් ගීත ගායනයක්ද ඉදිරිපත් කළ අතර, එහිදී රණවිරුවන් 25 දෙනකු හට සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් පිරිනැමීමටද ඔවුනට තේපැන් සංග්‍රහයක් ලබාදීමටද කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය සහ අනෙකුත් සාමාජිකාවන් පසුගියදා අභිමංසල 11 කඹුරුපිටිය මධ්‍යස්ථානයේ වාට්ටු සංකීර්ණයන්හි චාරිකාවක නිරත වූහ. එහිදී, අබලන් වූ බට පැලලි වෙනුවට නව බට පැලලි පරිත්‍යාග කිරීම සහ නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා ත්‍යාග පාර්සල් ප්‍රදානය කිරීමටද කටයුතු කරන ලදී. එහිදී, 9 ගැමුණු හේවා බළඇණියට අයත් සෙ/422385 සැරයන් ගමගේ පීජීආර්එම් යන ජ්‍යෙෂ්ඨකොනොනි විසින් ඔහු භාවිතා කරනු ලැබූ අබලන් තත්ත්වයේ පැවති විදුලි පුටුව වෙනුවට නව රෝද පුටුවක් ලබාදීමද සිදුකෙරිණ.



# මුල්ලේරියා මානසික රෝහලේ සංචාරයක





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් පසුගිය නොවැම්බර් 27 වන දින මුල්ලේරියාව මානසික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් සොයා බැලීමේ සංචාරයක් සිදුකරන ලදී. එහිදී, එම රෝගීන් වෙත සහ රෝහල් කාර්ය මණ්ඩලය වෙත දිවා ආහාර වේලක් ලබාදීමටද රෝහලේ පරිහරණය සඳහා පරිත්‍යාග භාණ්ඩ ලබාදීමටද කටයුතු කරන ලදී. මෙම අවස්ථාවට රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# විශේෂ බලකා සේවා වනිතා ශාඛාවෙන් ඉගෙනුමට අත්වැලක්





විශේෂ බලකාය යටත් රාජකාරියේ යෙදී සිටින සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ පාසල් යන දුවා දරුවන් හට 2023 වසර සඳහා පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් ඉකුත් දෙසැම්බර් මස 18 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නයනී සමන්ති සෙනරත් යාපා මහත්මියගේ ඉල්ලීමකට අනුව ව්‍යාපාරික මාධව තේනුවර හා සන්ධ්‍යා නුවර යන යුවල විසින් රුපියල් මිලියන 04 කට අධික වටිනාකමකින් යුතු පාසල් උපකරණ ඒ සඳහා පරිත්‍යාග කරනු ලැබූහ. අදාල පරිත්‍යාග බෙදාදීම යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මෙන්ම විශේෂ බලකා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# "වරුසවිතාන" වැඩිහිටි නිවාසය වෙත දානය සපයමින්





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත අම්බලන්ගොඩ වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දවල් හා රාත්‍රී දානය ලබාදීම පසුගිය නොවැම්බර් 27 වන දින සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානයක්





ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහාසභා රැස්වීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දීපිකා ප්‍රශාන්ති චන්ද්‍රසේන මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා එහි සේවා වනිතා ශාඛාවේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් දෙසැම්බර් 10 වන දින එම රෙජිමේන්තුවේදී පැවැත්විණ. 2021 වර්ෂයෙහි 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් එම රෙජිමේන්තු සාමාජිකයිනිගේ දූ දරුවන් 68 දෙනකු සඳහා පාසල් උපකරණ ප්‍රදානය කිරීම වස් දරුවන් 10 දෙනකු සඳහා පාසල් උපකරණ ලබාදීමේ සංකේතාත්මක උත්සවයක්ද එදින පවත්වන ලදී.

# අකුරු ඉගෙනුමට රණවිරු සත්කාරයක්





සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑම් ජයසිංහ එල්එස්සී ගේ සහ එම මහත්මියගේ මෙහෙයවීමෙන් එම ඒකකය යටතේ රාජකාරී නියුතු සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දරුවන් 30 දෙනකු සඳහා 2023 වර්ෂය වෙනුවෙන් අවැසි පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. තවද, එම සිවිල් සේවක මහතුන්, ඔවුන්ගේ භාර්යාවන් හා දරුවන් අතරින් ඇස් කණ්නාඩි අවශ්‍ය අයවලුන් සඳහා ඇස් කණ්නාඩි පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්ද පසුගිය නොවැම්බර් 26 වන දින තිසාවැව සේවා බලකා පාසලේදී පවත්වන ලදී. එම අවස්ථාව සඳහා සේවා බලකා සේවා වනිතා සභාපතිනිය තුෂාරි වනිගරත්න මහත්මිය, එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ඒඑම් ප්‍රේමරත්න පීඑස්සී එල්එස්සී, නිලධාරීන් සහ සෙසුනිලයින් ඇතුළු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# වෛද්‍ය බලකායෙන් නත්තල් කැරොල් ගී ප්‍රසංගයක්





යුද්ධ හමුදා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව, යුද්ධ හමුදා රෝහල් කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොළඹ යුද්ධ හමුදා රෝහලෙහි එකමුතුවෙන් සංවිධානය කරන ලද නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් පසුගිය දෙසැම්බර් 15 වන දින යුද්ධ හමුදා රෝහලේදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය සහ යුද්ධ හමුදා වෛද්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් හා වෛද්‍ය බලකා බලකාධිපති බ්‍රිගේඩියර් පීඒසී ප්‍රනාන්දු යූඑස්පී ඇතුළු නිලධාරීන් හා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

# අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි රණක්ෂිතයට පත් විරුවන්ට සත්කාර





අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන් 36 දෙනකුගේ සුවදුක් විමසීමේ සංචාරයක් පසුගිය දෙසැම්බර් 10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛවේ සභාපතිනිය බන්දුනි මාග්‍රට් රණසිංහ රණවක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එහිදී, රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් තෑගි සංග්‍රහයක් පිරිනැමීම, අඟල් 32 LED රූපවාහිණී යන්ත්‍රයක් ලබාදීම සහ ත්‍යාග පාර්සල් පිරිනැමීම සුවිශේෂී විය. මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අනුග්‍රාහක තිළිණයක්

6 සහ 7 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායන්හි රාජකාරී නියුතු සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන් අතරින් දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවි ගෙවන පවුල්වල පාසල් අධ්‍යාපනය ලබන දූවා දරුවන් වෙත අනුග්‍රාහක තිළිණ චවුචර්පත් සහ නොමිලේ පාසල් උපකරණ පිරිනැමීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 18 වන දින 7 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා කඳවුරු පරිශ්‍රයේදී පැවැත්විණ.



# යුද හමුදා මූලස්ථාන පරිශ්‍රයේ කෘෂි අලෙවි සැලක් ආරම්භ කරමින්





පවතින ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් යුද හමුදාධිපති ගේ උපදෙස් මත සියලු නිලයන්ගේ සුබසාධනය උදෙසා කෘෂි අලෙවි සැලක් පසුගිය දෙසැම්බර් 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ රථගාලේදී සුබ මොහොතින් විවෘත කෙරිණ. යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී හා එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ශාන්ති අබේසේකර මහත්මිය විසින් මෙම වෙළඳසැල විවෘත කරනු ලැබූහ.

කාබනික කෘෂි නිෂ්පාදන, එම සේවා වනිතා ශාඛාව මගින් නිෂ්පාදනය කරන ලද අත්කම්, ගෘහ භාණ්ඩ ඇතුළු අනෙකුත් නිෂ්පාදන රැසක් මෙම කෘෂි වෙළඳසැල වෙතින් මිලදී ගැනීමට හැකියාව පවතී. මෙම විවෘත කිරීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සේවා වනිතා ජ්‍යෙෂ්ඨ සාමාජිකාවවන් ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# තෘප්තිමත් හමුදාවක් සඳහා මනෝවිද්‍යාත්මක මගපෙන්වීමක්





මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් "තෘප්තිමත් හමුදාවක් සඳහා මනෝවිද්‍යා උපදේශනය" යන මැයෙන් වූ දේශන මාලාවක් අරඹා ඇත. එහි තවත් අධියරක් පසුගිය දෙසැම්බර් 28 වන දින යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී නිලධාරීන් හා සෙසුනිලයින් 200 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. වෘත්තීය තුළ හා පුද්ගලිකව හමුදා සාමාජිකයින් මුහුණදෙන ගැටළුවලදී ඇතිවන ව්‍යාකූල මානසික තත්ත්වය සමනය කොට ඔවුන්ගේ චිත්ත ධෛර්යය නංවාලීම හා තෘප්තිමත්ව තම රාජකාරියේ නියැලෙන්නේ කෙසේද යන්න පිළිබඳව පුළුල් දැනුමක් ලබාදෙන එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 (මනෝවිද්‍යා උපදේශක) ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගරෙ විසින් මෙහෙයවන ලදී.



# 40 පනින්න පෙර

හතළිහ පැන්නාට පසු වැඩ කටයුතු වඩාත් දුෂ්කර වන බව පැතිරී ගිය මතයකි. ඇත්ත වශයෙන්ම ඇගපත කැක්කුමක් නැතිව උදයේ නැගිටීම වැනි සමහර කටයුතු අපහසුය. එහෙත් බොහෝ සංවිධානවල වැඩ කටයුතු හතළිහෙන් පසුව පුදුමාකාර ලෙස පහසු වේ.

වගකීම් වඩාත් බරපතල වුවත් හතළිහෙන් පසු දිනකට පැය 18 ක් වැඩ කිරීමේ හැකියාව වෙනුවට ඔබව අගය කරනු ලබන්නේ ඔබේ පළපුරුද්ද, දැනුම හා හරි වැරදි පිළිබඳ ගන්නා තීරණ වෙනුවෙනි.

ජීවිතයේ බොහෝ ප්‍රධාන සාර්ථකත්වයන් ඇරඹෙන්නේ වයස හතළිහෙන් පසුවය. ඒ ඔබ ඊට පෙර නිවැරදි දේ කර සිටියොත් පමණි.

1

ඒ සඳහා කළයුතු නිවැරදි ක්‍රියා මොනවාද? ප්‍රථමයෙන්ම ඔබේ ව්‍යාපාරය හෝ රැකියාව ගැන දැනගැනීමට ඇති සියලු දේ 40 වීමට පෙර දැනගන්න. උදාහරණයක් වශයෙන් මම අත් පිටපතක් සංස්කරණය කිරීමද එවැන්නක් මුද්‍රණය කිරීමේ මූලධර්මද වයස තිස් ගණන්වලදී දැන ගතිමි. කෙටියෙන් මම නියම වයසේදී මගේ ව්‍යාපාරය හොඳින් දැනගෙන එතැන් සිට නව දුරටත් පළපුරුද්ද ලැබීමට උත්සාහ කළෙමි.

වයස හතළිහ වනවිට ලෙනාඩ් බර්න්ස්ටීන් විසින් වෙස්ට් සයිඩ් ස්ටෝරි ලියා තිබුණ අතර දීප්තිමත් සංගීත රචකයකු වශයෙන් නමක් ගෙන තිබුණි.

වයස හතළිහ වනවිට චාල්ස් බ්ලුඩෝන් විසින් ඔහුගේ ගල්ෆ් ඇන්ඩ් වෙස්ටර්න් ඉන්ඩස්ට්‍රීස් ඩොලර් මිලියන ගණනක ව්‍යාපාරයකට නංවා තිබුණි.

වයස 20 දී හෝ 30 දී නිදි මරමින් වැඩකිරීම කළයුතු මුත් හතළිහෙන් පසුව අලුතෙන් යමක් උගෙනීම සඳහා කිසිවකු නිදි නොලබා නොසිටිය යුතුය.

2

දෙවැනිව ඔබ කළ යුත්තේ ඔබටම ආවේණික වූ විලාශයක් දියුණුකර ගැනීමයි. 40 වීමට පෙර ඔබට සුවදායි ලෙස සිටිය හැක්කේ කෙසේද? ඔබ ඇඳුම් අඳින පිළිවෙල නැතහොත් ඔබ අන් අයගෙන් වෙන්කොට හඳුනාගන්නා යම් යම් සුළු කරුණු දැනගන්න. ඔබේ වයස විසි තිස් ගණන්වලදී ඔබට අත්හදා බැලීම කළ හැකි මුත් 40 වනවිට ඔබටම ආවේණික ශෛලියක් ස්ථිර ලෙස ඇති කරගෙන සිටිය යුතුය. රැකියාව මැද්දී පෙනුම වෙනස්කරන අයකු තරම් අස්ථිර චරිතයක් වෙනත් ඇත්තේ නැත.

තෙවැනිව ඔබේ හැඟීම්වලට පිළිවෙලක් ඇතිකරගන්න. ඔබගේ ශක්තිය උරාගන්නා ඔබේ අවධානය බැහැර කරන පුද්ගලික ප්‍රශ්න විසඳා

## 3

නොගෙන සාර්ථකත්වයට පියවර තැබීම අපහසුය. හැරත්, සිතේ සතුටක් නැතිකම රෝගයක් වැනිය. එය ක්‍රමයෙන් අන් හැම දෙයක්ම ගැන ඇති උනන්දුව නැතිකර දමයි.

ඇත්ත වශයෙන්ම සියලුම දුෂ්කරතා විසඳිය නොහැකිය. යමෙකුට ඒවා මැඩගෙන හිස එසවීම අවශ්‍යය. එහෙත් 40 වීමට පෙර සිය පුද්ගලික ජීවිත පිළිවෙත කරගත් පුද්ගලයෝ එසේ කර නොගත් පුද්ගලයින්ට වඩා සාර්ථක ලෙස ජීවත් වෙති. එහෙයින් ඔබ වැඩකට නැති සම්බන්ධයකට පැටලී එය නවතා දැමීමට හෝ විවාහවීමට තීරණය කර ඇත්නම් එය දැන්ම කරන්න. එය ඔබේ පස්වැනි දශකය දක්වා දිගින් දිගට අතීරණාත්මකව රැගෙන යන්න එපා. ඒ වනවිට ඔබ ඔබේ රැකියාව වෙනුවෙන් ගත් වෙහෙස ගැන සතුටට පත්වෙමින් ජීවිතය විනෝදයෙන් ගතකළ යුතු කාලයකි.

## 4

හතරවැනිව, ඔබේ අඩුපාඩු හඳුනාගන්න. ඔබට හොඳින් කිරීමට නොහැකි, ඔබට කෙසේවත් කරන්නට සිත් නොදෙන හෝ ඔබ නොකරන දේ ගැන හොඳින් දැනගන්න.

## 5

ඔබ ගණිතයට එතරම් කැමති නැතිනම් හා යමක් නිපදවීමෙන් සතුටක් ලබන අයකු නම් ඔබට වැඩි වැටුපක් ලැබෙන නිසා හෝ එබඳු රැකියාවක් ඔබ කරනැයි අන් අය බලාපොරොත්තු වන නිසා හෝ ගණන් සම්බන්ධ රැකියාවක් කරගෙන යන්න එපා. ඔබේ වයස 40 වීමට පෙර ඔබ කිරීමෙන් සතුටක් ලබන රැකියාවකට බැඳෙන්න. නැතහොත් ඊළඟ දශකය හෝ දෙක ඔබව ස්ථිර වශයෙන්ම අසන්තෝෂයෙන් ගත කිරීමට සිදුවිය හැකිය. එමෙන්ම ලැබීමට හැකි සාර්ථකභාවයද ඔබට නොලැබී යනු ඇත. පස්වැනිව, ඔබේ දක්ෂතා මොනවාදැයි දැනගන්න. ඔබට කුමන දේවල් හොඳින් කිරීමට හැකිදැයි තීරණය කරන්න. ඔබ සතුටින් කරන්නේ කුමක්ද යන්නත් වටහාගන්න.

මා තරුණ කාලයේ ප්‍රශ්නයක දෙපැත්තෙන්ම දැකීම සම්බන්ධයෙන් බොහෝ දෙනා මට දොස් කීහ. දැන් මගේ වයස 54 ක් වන නිසා එය මගේ යහපත් ගුණයක් බව මම දනිමි. ඒ හේතුවෙන් මම හොඳ විධායක නිලධාරියකුට වඩා හොඳ උපදේශකයකු වුණිමි. එහෙත් එයින් වන වරදක් නැත. සංවිධානයකට එම පුද්ගලයින් දෙවර්ගයම අවශ්‍යය. ඔබේ රාජකාරිය කුමක් වුවත් ඔබ කවුද හොඳින් කළ හැකි කුමක්ද යන්න දැනගැනීම සාර්ථකත්වය ඇති කිරීමේදී තීරණාත්මක වන්නකි.

## 6

සයවැනිව ඔබ කරමින් සිටින රැකියාවෙන් හදිසියේ ඉවත් වුණොත් ප්‍රයෝජනයට ගත හැකිවන සේ මුදලක් රැස්කිරීම ආරම්භ කරන්න. මා වඩාත් තරුණ අවධියේ අර්විංලසාර් නමැති ශ්‍රේෂ්ඨ පුද්ගලයා මට පියකු මෙන් මෙවැනි අවවාදයක් දුන්නේය. "ඔබ රැස්කරන පළමු ඩොලර් මිලියනය පසෙකින් තබන්න" හේ කීය. "ඔය ඔබ රැකියාව හදිසියේ නවතා දැමුවහොත් ජීවත්වීම සඳහා යොදවන මුදලයි."

මට එතරම් විශාල මුදලක් ඉතිරි කිරීමට නොහැකි වුවත් එම උපදේශනය අගනා එකකි. රැකියාවෙන් ලැබෙන මුදල නොමැතිව ජීවත්වීමට නොහැකි නිසා ඔබට එය දිගටම කරගෙන යාමට සිදුවීම හෝ රැකියාවල් වෙනස් කිරීමට හැකියාවක් නොමැතිවීම හෝ සිත ඉතා කනස්සලු කරනදේය. ඔබේ සුරක්ෂිතභාවය ස්ථිර කිරීම සඳහා මුදලක් ඉතිරි කරන්න. සමහරවිට ඔබ කිසි විටෙකත් එය පාවිච්චි නොකරනු ඇත. එහෙත් ඔබට ඕනෑම අවස්ථාවක, "මහත්වරුණි, මම අයින් වෙනවා"යි පවසා ඉවත්වීමට හැකියාව නැත්නම් ඔබේ සිතේ ඔබ ගැනම කෝපයක් ඇතිවනු ඇත.

## 7

සත්වැනිව මිතුරු සමාගමක් ඇතිකරගන්න. 40 වනවිට ඔබ ගැන විශ්වාසය තබන හෝ හදිසියකදී ඔබට වුවද ඉල්ලිය හැකි මිතුරන් සමූහයක් නැතිනම් ඔබ සිටින්නේ අපහසු තත්වයකය. ඔබ ඔවුනට උදව් කරනුද, ඔවුන්ගේ ව්‍යාපෘති ගැන විශ්වාසය තිබුණද, ඔවුන්ගේ ප්‍රශ්නවලට කන් දෙනුද ඇත. ඔවුහුද ඔබට ඒ ක්‍රමයට සලකති. මේ මිතුරු දැල එක් දවසකදී ඇතිකර ගත හැක්කක් නොවේ. ඒ සඳහා දශක ගණනක උත්සාහය අවශ්‍යය. ව්‍යාපෘති වලදීද, දේශපාලනයේදී මෙන් ඔබට විශ්වාසය තැබිය හැකි හා නියම තැන්වල සිටින සෙනඟ අවශ්‍යය.

## 8

අටවැනිව ඔබගේ කාර්යයන් සඳහා අන් අය යෙදවීමට පුරුදුවන්න. මෙය කිරීමට නොහැකි හෝ කිරීමට අසතුටු අය බොහෝ විට රැකියාවන්හි පහත් මට්ටම්වල දිගටම රැඳී සිටිති. සාර්ථකත්වයෙන් අඩක් රැඳී පවතින්නේ අන් අය ලවා වැඩකරවා ගැනීමේ දක්ෂතාවය මතය. ඔබේ වයස 40 වන විට ඔබ ඒ පිළිබඳ විශේෂඥයකු විය යුතුය. ඔබ යම් කාර්යයක් කිරීමට සුදුසුම තැනැත්තා සොයාගෙන ඔවුන් ගැන විශ්වාසය තැබිය යුතුය.

## 9

නවවැනිව ඔබ නිශ්ශබ්දව සිටිය යුත්තේ කුමන අවස්ථාවලදැයි දැනගන්න. බොහෝ රැකියාවන් අඩපණවන්නේ අන් හැමටම වඩා නොසැලකිලිමත් කතාබහ නිසාය. නිසලව හිඳගෙන නුවණැත්තකු මෙන් පෙනී සිටීමට තැත් කරන්න. ඔබ ඇත්තටම දන්නවාට වඩා බොහෝ දේ දන්නා කෙනකු යැයි මිනිසුන් සිතනු ඇත. ඕපාදූප නොකියන්න. ඔබේ සැලසුම් ගැනද, කිසිවකුට නොපවසන්න. ඔබ අන් අයගේ රහස් සුරකින අයකු ලෙස නමක් ගතහොත් අන් අය සමඟ ඕපාදූප පැවසීමෙන් ඇතිකර ගන්නා ජනප්‍රියභාවයට වඩා එය වැදගත් වනු ඇත. උසස් කළමනාකරණයේදී රහස් සුරැකීම අතිශයින් වැදගත්.

## 10

දසවැනිව, පක්ෂපාතීවන්න ඔබේ වයස 40 වනවිට ඔබ සියයට සියයක් ඔබේ ප්‍රධානීන්ට පක්ෂපාතී වන්නකු බවට නමක් ඇතිකරගෙන නොමැතිනම් ඔබේ රැකියාවේ රැඳී සිටිනතුරු ඔබට මේ අඩුපාඩුව නිසා කරදර විඳීමට සිදුවේ. ඔබ වැඩකරන සමාගමට ඔබ පක්ෂපාත නැති බව පැතිරී ඇත්නම් කිසිම ව්‍යාපාරයකට ඔබ වැද්ද නොගනු ඇත. 40 ට පෙර ඇති කරගන්නා පක්ෂපාතීභාවයෙන් ප්‍රයෝජන ලැබීම ඇරඹෙන්නේ 40 න් පසුව වුවද, යමක භාෂ්‍යය හඳුනා ගැනීමට නිතරම ඔබ සූදානම් විය යුතුය. මේ ලෝකයේ සාර්ථකභාවය හෝ අන් කිසිම දෙයක් ස්ථිර නැත.

*1995 දෙසැම්බර් "මුතුහර" සඟරාව ඇසුරිනි..*




## ඔබේ දරුවාගේ මතක ශක්තිය වර්ධනය සඳහා

# මනෝවිද්‍යාත්මක අත්වැලක්

රටක මෙන්ම ලෝකයේ ඉදිරි පැවැත්ම රඳාපවතිනුයේ අනාගත දරු පරපුර අත බව නොරහසකි. එබැවින් "හොඳම දේ දරුවන්ට" යන වැකියේ අර්ථාන්විත බව දෙමාපියන් වන ඔබට මැනවින් අවබෝධ වනු ඇත. දරුවන්ගේ අනාගතය ගැන සත්‍යය වශයෙන් වෙහෙසෙන දෙමාපියන්ගේ අරමුණ වන්නේ හොඳ අධ්‍යාපනයක් දරුවන් සඳහා ලබාදීමටයි.

ඒ සඳහා ජනප්‍රිය පාසල් සඳහා දරුවන් යොමු කිරීමට උත්සාහ දැරීම, උපකාරක පංති සඳහා පාසල් නිමාවෙන් පසු දරුවන් යොමුකිරීම හා හැකි සෑම අවස්ථාවකම දරුවන් ඉගෙනීම සඳහා යොමු කිරීම දෙමාපියන් සියලුදෙනාගේම ඒකායන අපේක්ෂාවයි. නමුත්, දරුවා විසින් හදාරණු ලබන විෂයයන් ඔහුගේ මතකයේ රඳවා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබන දෙමාපියන් අල්ප බව නොරහසකි.

මතකය වර්ධනය කිරීම තුළින් බුද්ධිමත් දරු පිරිසක් බිහිකිරීම සඳහා මෙය අතිශයින්ම වැදගත් කරුණකි. ඇයි අප සියලුදෙනාම කුඩා කාලයේ අධ්‍යාපනයක් ලබන්නේ යන්න විමසූ විට එයට දියහැකි අර්ථකතනය වන්නේ කුඩාකල අප විසින් ඉගෙනගත් දෑ සහ අත්දැකීම් තුළින් වැඩිහිටියකු වශයෙන් යම් කාර්යයක යෙදීමේදී තර්ක බුද්ධිය භාවිතා කර ස්වාධීනව නිවැරදිව සිතීමේ හැකියාව ලබාගැනීම සඳහාය.




ඉහත රූපසටහනෙන් පෙනෙන ආකාරයට අධ්‍යාපනයේ අරමුණ වන්නේ යමක් **මතක තබාගැනීම** තුළින් අපට එය **තේරුම් ගැනීමට** හැකිවීම හා එය නිවැරදිව **යෙදවීම** කළ හැකි වන අතර එය යෙදවීමේදී **විශ්ලේෂණය** කිරීමටද හැකි වේ. එමගින් අපට **විනිශ්චයකට** පැමිණිය හැකි අතර එයින් **නව නිර්මාණයන්** බිහි වේ.

එසේ කරුණු මතක තබාගෙන තේරුම් ගැනීම, යෙදවීම, විශ්ලේෂණය, විනිශ්චය, නව නිර්මාණය කරා යාමට නම් අමතක වීමේ සම්භාවිතාවය අවමකරගත යුතුය. ඒ සඳහා අමතකවීමේ විද්‍යාත්මක හේතුව හොඳින් දැන සිටිය යුතුය.

අමතක වීම පහත දැක්වෙන ආකාරයට සිදුවන බැවින් එය දෙමාපියන් වන ඔබද දැන සිටිය යුතුයි.

## Forgtting Curve




එමගින් විද්‍යානුකූලව තම දරුවා පාඩම් කිරීම සඳහා යොමුකිරීම තුළින් විශිෂ්ට ප්‍රතිපල අත්කරගත හැකි බව නොරහසකි. යම්කිසි පාඩමක් මතක තබාගැනීමේදී එය ඉගෙන ගැනීමට පටන්ගත් මොහොතේ සිට පැයකට පමණ පසු ඉගෙනගත් දෙයින් 50% ක ප්‍රමාණයක් පමණක් මතකයේ රැඳෙන අතර, දිනකට පසු එය 30% පමණ ප්‍රමාණය දක්වා මතකයෙන් ගිලිහී යන අතර එය සතියක් පමණ ගිය පසු අපගේ මතකයේ රැඳෙනුයේ 20% ත් 25% ත් අතර ප්‍රමාණයකි. මෙය සාමාන්‍ය තත්ත්වයකි. ඉගෙනගනු ලබන විෂය අනුව සහ ඒ සඳහා දක්වන කැමැත්ත මත තත්ත්වය අඩුවැඩි විය හැක.



ඉහත දක්වා ඇති වගුවට අනුව ඔබට යමක් ඉගෙන ගැනීම ආරම්භ කළ විගස පළමුවන පැය තුළ අමතක වීමට ඇති සම්භාවිතාවය ඉතා වැඩි අතර, එය ටික දිනක් යාමේදී එය යම් තලයකට පැමිණෙන බවයි. එසේනම්, අප කළයුත්තේ සාමාන්‍ය ඉගෙන ගැනීමේ ක්‍රමයෙන් පරිබාහිරව කටයුතු කළයුතු යන්නයි. ඉගෙනගනු ලබන පාඩම අවසානයේ පැයකට හෝ පැය දෙකකට පසු නැවත එය ආවර්ජනයක් කිරීම තුළින් නැවත මතකය අලුත් කරගැනීමට හැකිවේ. ඒ සඳහා කෙටි සටහනක් ආකාරයෙන් මතකය අවදිකළ හැක. නමුත්, පැය 24 වැනි කාලයකට පසු නැවත මතකය ආවර්ජනය කළ යුතුය. නොඑසේනම් නැවත මතකය රැඳීමේ ප්‍රමාණය අඩුවන බැවිනි.

එයද සතියකට පසු නැවත මතක ගිලිහී යාමට නොදී ආවර්ජනයක යෙදිය යුතුයි. දීර්ඝකාලීනව මතක තබාගැනීමට සහ මතක ශක්තිය වර්ධනය කිරීම සඳහා එය කළයුතුම කටයුත්තකි. ඒ සඳහා සාරාංශගතව පාඩම් අවශ්‍ය පරිදි සකසා ගැනීමට දරුවාට මගපෙන්වීම ඔබ සතු වගකීමකි. එමෙන්ම එහි විද්‍යාත්මක පසුබිම ඔහුට හෝ ඇයට කියා දිය යුතුයි. එසේ කිරීමෙන් අනතුරුව මොලයේ මතක ශක්තිය වර්ධනය වීම තුළින් විභාගයට පෙනී සිටීමට ආසන්න අවස්ථාවේදී නැවත එම කරුණු පරිශීලනය කළ පමණින් ඔහුගේ මතක ආවර්ජනය වන බව විද්‍යාත්මක මතයයි.

මෙම ක්‍රමවේද ඔබේ දරුවාටත් හුරු කරන්න. රටේ අනාගතය ඔවුන් බව දරුවාට අවබෝධ කර දෙන්න. ඉගෙන ගැනීමේ වටිනාකම සහ විද්‍යානුකූලව එය මතක තබාගැනීමේ ක්‍රමවේදය දරුවාට නිවැරදිව ආදරයෙන් කියා දෙන්න. පොත්පත් පරිශීලනයේදී අවශ්‍ය කොටස් ප්‍රායෝගික අයුරින් මතක තබාගැනීමට අවශ්‍ය වූ විට එම කොටස වර්ණ පෑන් භාවිතයෙන් වර්ණ ගන්වා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් කළ පරිදි නියමිත කාල වේලාවන්වලදී අධ්‍යාපනයේ යෙදවීම තුළින් අපේක්ෂිත ප්‍රතිපලය අත්කර ගත හැකි බව දරුවාට කියා දෙන්න.

පාඩම් කිරීම ආරම්භ කර සුළු වේලාවකින් යම් දරුවකුට නින්දයාම විභාගය සඳහා අධික බියක් වැනි ගති ලක්ෂණයක් තිබේනම් මනෝ වෛද්‍යවරයකුගේ සහය පතන්න.

මන්දයත් එය රෝගී තත්ත්වයක් බැවින් මොලයේ රසායනික වෙනස්වීමක් පෙර නිමිත්තක් බව වටහා ගන්න. බුද්ධිමත් දරුවකු බිහිකිරීම සඳහා දෙමාපියන් ඉතා බුද්ධිමත් නොවිය යුතු අතර සමාජ අවබෝධය සහ ඒ සඳහා දැඩි වුවමනාවක් මෙන්ම කැපවීමක් තිබිය යුතු බව මතක තබාගන්න.



සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගජර,
(මනෝවිද්‍යා උපදේශක)
දුරකථන : [illegible]
hemantharathnayake20gr@gmail.com



# සතුට සහ මානසික ආතතිය

තෘප්තිමත් මනස කය සුවපත් කරයි. සතුටින් සිටින අය නිබඳවම සෞඛ්‍ය සම්පන්න සහ ආතතියෙන් තොර අය වෙති. සතුට තුළ ආත්ම විශ්වාසය හා තෘප්තිය යහමින් ගැබ්ව ඇත. වයසින් මේරූ බොහෝ වැඩිහිටි පුද්ගලයින් තම ජීවිතය ගැන නිරන්තරයෙන් තෘප්තිමත් වන අතර ඔවුන් තරුණයින්ට වඩා සතුටින් සිටින බව පර්යේෂණ මගින් තහවුරු වී ඇත. ඊට බොහෝවිට හේතු වන්නේ වයසින්, අත්දැකීම්වලින් මුහුකුරා ගිය මිනිසුන්ගේ අපේක්ෂාවන් යෞවනයන්ට සාපේක්ෂව අඩු බැවිනි.

ආගමික ඇදහිලි සහ ආගමික කටයුතුවලට සහභාගී වීම මානසික ආතතිය අවම කර, සතුට සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කරන බවද සොයාගෙන ඇත. ඩියුක් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයන් සොයාගෙන ඇත්තේ නිතිපතා ආගමික වතාවත්වල නිරත වන පුද්ගලයින් රෝගී වීමේ ප්‍රවණතාව අඩු බව සහ ඔවුන්ගේ රෝහල් ගතවීම් අවම වන බවයි. කෙනෙකු සතුටින් සිටින විට ඔහුගේ මනස සන්සුන්ව පවතින අතර හිත ආදරණීය සහ දයානුකම්පිත වේ. පුද්ගලයකු සතුටින් සිටින විට සතුට හා සම්බන්ධ මොළයේ ප්‍රදේශයේ වැඩි විද්‍යුත් ක්‍රියාකාරීත්වයක් පවතී.

ධනය සහ වෙනත් භෞතික සම්පත් කෙනකුට සතුට ගෙන ඒමට අත්‍යවශ්‍ය බව බහුතරයකගේ මතය වන අතර, ඒවා නොමැතිකම අසතුටට හා ආතතියට හේතුවක් වන බව ඔවුන් සිතති. කෙසේ වෙතත්, බොහෝ අධ්‍යයනයන් මෙම මතය ප්‍රතික්ෂේප කර ඇත. ෆෝබ්ස් සඟරාවේ ධනවත්ම ඇමරිකානුවන් 400 දෙනකුගේ සමීක්ෂණයකදී, සාමාන්‍ය මිනිසුන්ට වඩා සමස්තයක් වශයෙන් සතුටින් සිටීමට ධනවත් සහ වරප්‍රසාද ලත් අයවළුන් අපොහොසත්ව ඇති බව සොයාගෙන ඇත.

ඔබට තවමත් නොලැබුණු දේ සාක්ෂාත් කරගැනීමේ අධික ආශාව හා තණ්හාව තුළින්ද මානසික ආතතිය ඇති වේ. ආශාවන් අසීමිත ය. මෙය කිසිදා නිම නොවන විෂම චක්‍රයකි. අධ්‍යයනයකින් හෙළි වී ඇති පරිදි, සීමිත ආදායමකින් යැපෙන, ලද දෙයින් සතුටුවන සමබර සිත් ඇත්තන් තමන් සතුව ඇති සීමිත ධනයෙන් සෑහීමකට පත්වන බව පෙනෙන නිසා, බොහෝ ධනවත්, තරඟකාරී ජීවිත ගෙවන පුද්ගලයින්ට සාපේක්ෂව ඔවුන් සතුටින් සහ ආතතියකින් තොරව සිය ජීවිත ගෙවා දමන බව තහවුරු වී ඇත.

බොහෝ අය වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් පසු පැය ගණනාවක් ටෙලි නාට්‍ය නැරඹීමට වැය කරන්නේ සතුට, විවේකය සහ ආතතිය ජය ගැනීමේ අදහසිනි. කෙසේ වෙතත්, ඇතැම් ටෙලි නාට්‍ය නැරඹීම විවේකය සහ සතුටට වඩා ආතතිය ගෙන දෙන බව පර්යේෂණ මගින් සොයාගෙන ඇත. දිනකට පැය 3කට වඩා වැඩි කාලයක් ටෙලි නාට්‍ය නරඹන අය රූපවාහිනිය නැරඹීමට අඩු කාලයක් ගත කරන අයට වඩා අඩු තෘප්තිමත් බවකින් ජීවත්වන බව අධ්‍යයනයකින් හෙළි වී තිබේ. වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් පසු සොබා දහම සමඟ ගත කළ හැකි නම්, එය මනසට විවේකයක් හා ප්‍රබෝධයක් ගෙන දෙන අතර පුද්ගලයකුගේ, මානසික ආතතිය දුරු කිරීමට සහ නිරෝගීව සිටීමට එය උපකාරී වේ.

වැරදි ආකල්ප ද මිනිසුන්ව අසතුට සහ ආතතියට පත් කිරීමට සමත් වේ. බොහෝ විට අපි ඇතැම් දේ / සිදුවීම් සහ අප සතු දේවල් දෙස සෘණාත්මකව බැලීමට නැඹුරු වී සිටිමු. ඒවායේ ධනාත්මක පැත්ත නොසලකා හරිමින්, අප සන්තකව ඇති දෙයින් සතුටට සහ සෑහීමකට පත් නොවී, අප සතුව නොමැති දේ ගැන සිතමින් සිත තුළ තෘෂ්ණාව වැඩීම ආතතිය ඇති කරයි. බොහෝ විට, අප තුළ ඇති නිෂේධාත්මක ආකල්ප නිසා අප කිසියම් මානසික විඳවීමකට හා ආතතියට පත් වේ. කෙනකු අඩක් පිරුණු වීදුරුවක් දෙස බලන ආකාරයෙන් මෙය මනාව පිළිබිඹු වේ. යමක සෘණාත්මක පැත්ත දෙස බලන බහුතරයකට වීදුරුව අඩක් හිස් බව පෙනෙන අතර ජීවිතයේ ධනාත්මක පැත්ත දෙස බලන අයට එම වීදුරුව අඩක් පිරී ඇති බව පෙනේ.

ඔබ ලද ජීවිතයෙන් තෘප්තිමත් වීම හා නොලද දේ ගැන කම්පා නොවීම තෘප්තිමත් ජීවිතයකට වැදගත් වේ. සතුටින් දිවි ගෙවීමට නම් අපේ ආකල්ප ධනාත්මක විය යුතුවා සේම උත්සහයන්ද ප්‍රබල විය යුතුය. එසේම අප හට ලඟාවිය හැකි ඉලක්කයන් කෙරෙහි සිත මෙහෙයවිය යුතුය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය සහ තරහව වැනි චිත්තවේග හැකිතරම් සිතින් ඈත් කලයුතු අතර ආගම දහම කෙරෙහි ඇති නැඹුරුවද පුද්ගලයකු හට ආතතියෙන් තොර, සරල තෘප්තිමත් දිවියක් ගත කිරීමට උපකාරී වනු ඇත.




සටහන

මේජර් ජෙනරාල්
කීර්ති කෝට්ටවත්ත (විශ්‍රාමික)



පසුගිය කලාපය හා සැබඳේ..

# පරිණත සොල්දාදුවා විශිෂ්ට නායකයෙකි

**හිතවතුන් සමකාලීනයන් වුවද ඔවුන්ගේ ක්‍රියාවන් නොහොබිනා හෝ අයුක්තිසහගත වේ නම් නායකයා කිසි විටෙකත් ඒවා අනුමත නොකළ යුතුය. එසේ වුවහොත් නායකත්වය දියාරු වේ. මෙවන් අවස්ථාවකදී නායකයා ඉතා සමබර පිලිවෙතක් අනුගමනය කරමින් උපායශීලී ආකාරයෙන් ක්‍රියාත්මක වෙමින් අවශ්‍ය තැන්හි දැඩිවෙමින් මෙන්ම අවශ්‍ය තැන්හි නම්‍යශීලී වෙමින් තම නායකත්වය පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය.**

පරිණත සොල්දාදුවා විශිෂ්ට නායකයෙකි යන ලිපි මාලාව ඔස්සේ පසුගිය කලාප කිහිපයකදී සාකච්ඡා කරනු ලැබුවේ නායකයකුට අත්‍යවශ්‍ය වන ප්‍රධාන කුසලතාවය වූ යහපත් නායකත්ව ගුණාංග පිළිබඳවය. නායකත්ව ගුණාංග යහපත් ආකාරයෙන් වර්ධනය වී සුවිශේෂ නායකයන් බිහිකරන බව අපි දනිමු.

මෙම නායකයකු තුළ තිබිය යුතු නායකත්ව ගුණාංග අතර, පක්ෂපාතීභාවය, ධෛර්ය සම්පන්න බව, මානසික හා කායික වශයෙන් ශක්තිමත්භාවය, සංවේදීබව, තීරණ ගැනීමේ හැකියාව, බුද්ධිමත්බව, තරගකාරීබව, නොපසුබස්නා උත්සාහය, ආත්ම විශ්වාසය, වගකීම් භාරගැනීම, විශ්වාසවන්ත බව, දරාගැනීමේ හැකියාව, මනා සවන්දීමේ ගුණය, දක්ෂ නායකයකු වීමට පවතින ආශාව, ක්‍රියාශීලී බව, ආදර්ශවත්භාවය ප්‍රධාන තැනක් ගන්නා අතර, ඒ පිළිබඳව විස්තරාත්මක උදාහරණ සහිතව පසුගිය කලාප වලදී සාකච්ඡා කළෙමු.

එබැවින් මෙම කලාපයේ සිට මෙම ලිපි මාලාව මීට ආවේණික වෙනත් දිශාවකට අවතීර්ණ වෙමින් අප විසින් සාකච්ඡා කරනු ලැබූ ඉහත කී නායකත්ව ගුණාංග අප දන්නා හෝ අප අසා ඇති නායකයන්ගේ ක්‍රියා කලාප තුළින් කොතෙක් දුරට යහපත් සහ අයහපත් ලෙස ප්‍රකට වූයේද? ඒ කුමන ආකාරයකටද? යන කරුණ පිළිබඳව විශ්ලේෂණයක් කිරීමට අපේක්ෂා කරමි.

උදාහරණයක් ලෙස දැක්වුවහොත් ලෝක ප්‍රකට මහා රණශූරයකු වූ නැපෝලියන් බොනපාට් හමුදා නායකයකු ලෙස අතිසාර්ථක විය. හමුදා නායකයකු ලෙස ඔහු තුළින් කැපී පෙනුනේ ඉතා මිටි මිනිසකු වූ ඔහුගේ ශාරීරික පෞරුෂය නොවේ. නිරතුරුව කියවන්නකුවූ ඔහුගේ බුද්ධිමත් බව ඉතා ඉහළ විය. ක්‍රියාශීලීවීම නැමති නායකත්ව ගුණාංගය ඔහු නිරතුරුව ප්‍රදර්ශනය කළේය. එඩිතරකම, ආදර්ශවත්බව හා මහගු විනය එලෙසම විය. ඔහු ඉතා පහළ ශ්‍රේණියේ සොල්දාදුවන්ගේ අදහස්වලට පවා මනා

ලෙස සවන්දීමට අමතක නොකළ නායකයෙකි. එසේ වුවද, හෙතෙම නැපෝලියන් අධිරාජ්‍යයා ලෙස සමස්ත රට පාලනය කිරීමේ අභියෝගය භාරගත්විට ඔහු සාර්ථක පාලකයෙක් නොවීය. එසේම ඔහුගේ සුවිශේෂී නායකත්ව ගුණාංගද ගිලිහී ගියේය.

මේ ආකාරයෙන් අප මෙවර කලාපයෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නේ සිංහලේ අන්තිම රජතුමා වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ නායකත්වයේ පැවති ප්‍රබල ලක්ෂණ මෙන්ම අයහපත් ලක්ෂණයන් පිළිබඳවයි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා උපතින් සිංහලයකු නොවීය. ඔහු වඩුග ජාතිකයෙකි. එසේ වුවද, එවකට රට තුළ සිටි ප්‍රබල මහාධිකාරවරයකු වූ පිළිමතලාවේ අධිකාරම්ගේ ආශිර්වාදය ලබා රජකමට පත්විය. ශ්‍රී වික්‍රම රාජසිංහයන්ට ජනතාව පිළිගත් සාර්ථක රාජ්‍ය පාලකයකු වූ නායකයෙක් වීමට හැකියාව නොලැබුණි. ඔහුව රජකමට පත් කල එමෙන්ම රජතුමා සමීපව ඇසුරු කළ සමීපතම නායකයන් සමග සුහදශීලී පාලනයක් ගෙනයාමට අවශ්‍ය අවකාශය නොලැබුණි. ඒවනවිට තරුණ වියෙහි සිටි රජතුමා වෙතින් මුහුපුරා ගිය අත්දැකීම් සහිත පරිණත නායකයකුගේ ගති ලක්ෂණ පිළිබිඹු නොකළේය. රජතුමා මහාධිකාරම් පිළිමතලාවේ සමග ගැටුම් ඇති කර ගත්තේය. අවසානයේ ඔහු තම සමීපතමයන්ගේ ක්‍රියාවන් පිළිබඳ සැක පහල කළේය. ඔහුට විරුද්ධවාදීන් බොහෝ පිරිසක් සිටියහ. පරිණත නොවූ බොහෝ කලබලකාරී නායකයන්ට සිදුවන ආකාරයේ වටපිටාවක් රජුටද නිර්මාණය වීම වලැක්විය නොහැකි විය. නායකත්වය එක්තරා විදියක කලාවකි. බොහෝ නායකයන් ඉහළ තනතුරකට පත්වීම හෝ නායකත්වයට පත්වූ විගස තම සමකාලීනයන් හා යටත් පිරිස තරහා කර ගනිති.

"කාටවත් ඕන විදියට නටන්න නෙමෙයි මම මෙතනට ආවේ......! මම වැඩ කරන්නේ මට ඕනේ විදියට".

එය සත්‍යයක් විය හැකිය. එසේ වුවද, තම හිතමිතුරන් සමකාලීනයන් උදව් කළ පිරිස් අමනාප කරගැනීම හෝ ඔවුන්ගේ නිර්දය විවේචනයට ලක්වීම නායකයකුගේ උසස් ගතිලක්ෂණයක් නොවේ. තමන්ගේ හිතවතුන්, සමීපතමයන්, සමකාලීනයන් තමන්ගේ යටතට පත්වූ විට නායකයා හැකි තරම් නම්‍යශීලී සමබරතාවයකින් ක්‍රියාකළ යුතුය. මෙයින් අදහස් වන්නේ ඔවුන් කියනා ආකාරයට කටයුතු කිරීම නොවෙයි. හිතවතුන් සමකාලීනයන් වුවද ඔවුන්ගේ ක්‍රියාවන් නොගැලපෙනා හෝ අයුක්තිසහගත වේ නම් නායකයා කිසි විටෙකත් ඒවා අනුමත නොකළ යුතුය. එසේ වුවහොත් නායකත්වය දියාරු වේ. මෙවන් අවස්ථාවකදී නායකයා ඉතා සමබර පිළිවෙතක් අනුගමනය කරමින් උපායශීලී ආකාරයෙන් ක්‍රියාත්මක වෙමින් අවශ්‍ය තැන්හි දැඩිවෙමින් මෙන්ම අවශ්‍ය තැන්හි නම්‍යශීලී වෙමින් තම නායකත්වය පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය. මෙය දුෂ්කර කාර්යයක් බව සැබෑවකි.

උදාහරණයක් ලෙස එය සර්කස් කණ්ඩායමක ක්‍රීඩිකාවක් දිගැති පොල්ලක් අතින් ගෙන දෙපසට ඇද බැඳතබා ඇති කඹයක් දිගේ ඒ පැත්තට මේ පැත්තට ඇලකරමින් පොල්ලේ ආධාරයෙන් සමබරතාවය ආරක්ෂා කරගනිමින් ඉදිරියට ගමන් ගන්නා ආකාරයේ දුෂ්කර කාර්යයක් වන්නේය.

ඉක්බිතිව තමාගේ නිර්දේශයෙන් රජකමට පත්කල රජු අතින් මරණයට පත්වීමට පිළිමතලාවේ අධිකාරම්ට සිදුවිය. මෙම නඩුව රජවාසලේදී අවසාන අවස්ථාවේදී රාජසිංහ රජු පවසා සිටියේ "රාජ්‍ය ලබාදීම ද්‍රෝහි කමක් කිරීමට හේතුවක් නොවිය යුතුයි" යනුවෙනි.

මෙයින් අනතුරුව මහාධිකාරම් ලෙස පත්කෙරුනේ ඇහැලේපොල නිලමේ තුමාය. පසු කාලීනව රජුට බරපතලම ගැටළු තිබුණේ ඇහැලේපොල සමගයි. එය සිංහල රාජ්‍යයේ අවසානය ළගාවීමටද හේතුවක් විය. නායකයකු වශයෙන් රජුගේ තවත් දුර්වලතාවයක් පැවතියේය. එනම් කෂණික තැති ගැනීමකින් යුතුව ක්‍රියාකිරීමයි. තරහක්, කෝපයක් හටගත් විට නායකයකු, පාලකයකු වශයෙන් ඔහු සන්සුන් මනසින් ක්‍රියා නොකළේය. බොහෝ විට ඔහු පසුව කළ වැරදි ගැන පසුතැවුල් වූ බවද ඉතිහාසයේ සඳහන් වේ.

1815 පෙබරවාරි මස 18 වන දින සමරග මුවෙන් පැමිණි එක්නැලිගොඩ නිලමේ ඇතුළු පිරිස විසින් රජතුමා සැඟවී සිටියදී අල්ලාගනු ලැබීය. ඉන්පසු නොයෙකුත් අඩම්තෙට්ටම්වලට ලක්වූ රජ පවුල අනතුරුව කොළඹට රැගෙන එනු ලැබුවේ ඉංග්‍රීසි විසිනි. මෙසේ රජු කොළඹලට රැගෙන එනු ලැබුවේ අවකට ඉංග්‍රීසි හමුදාවේ සේවය කළ මේජර් හුක් නම්වූ නිලධාරියා විසින් වන අතරමග ගමනේදී ඔහු රජු සමග සමීප මිතුදමක් ඇති කර ගත්තේය. එහිදී, එක් අවස්ථාවකදී රජතුමා මේජර් හුක් වෙත මෙසෙ පවසා ඇත.

"ඉංග්‍රීසි ආණ්ඩුකාරයන් අපට වඩා බුද්ධිමත් අය වෙති. මක් නිසාද යත් ඔවුන් සිය පුද්ගලික අදහස් මැඩගෙන ක්‍රියා කිරීම පිණිස අවවාද හා අනුශාසනා කිරීමට හොඳ උපදේශකයන් සිටී. ඒ නිසා ඔවුන් අතින් එතරම් දරුණු දඬුවම් සිදු නොවේ. නමුත්, අපට එසේ නොවේ. අපේ හැඟීම් මැඩගෙන ඉවසිල්ලෙන් විමසිලිමත් වී ක්‍රියාකාරී වීමට පෙර වරදකරු මලවුන් අතරට ගොස් හමාරයි"

මීට ඉහත කොටස්වලදී සඳහන් කළ පරිදි උස මහත පෙනුමක් සැබෑ නායකයකුට අත්‍යවශ්‍ය සාධකයක් නොවවුත් උස් මහත්වූ මනා ශරීර පෙනුමක් නායකයකු හට පැවතීම හොඳ ලක්ෂණයකි. නායකයකු හට ඔබින ප්‍රසන්න පෙනුමක් හා ශාරීරික ස්වාභාවයක් රජතුමා තුළ පැවති බව රජතුමා මුණගැසී කථා බස්කර ඇති හෙන්රි මාර්ෂල් නම්වූ ඉංග්‍රීසි වෛද්‍යවරයා පවසා ඇත.

රජතුමා අඩි හයකට ආසන්න උසින් යුක්තය. එතුමා තරබාරු දේහයකින් යුක්තය. ප්‍රසන්න මුහුණ ඔප කළ රැවුලකින්ද පුළුල් උරහිස් හා ඉදිරියට නෙරා ආ පපුවකින්ද යුක්තය. පාංශු දේහධාරී එතුමා තේජවන්ත විලාසයක් ගෙනහැර පෑවේය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තුළ නායකයකු වශයෙන් පැවති අයහපත් ලක්ෂණයන් වූයේ ක්ෂණික තැතිගැන්ම, අධික කෝපය, ජීවිතයේ බොහෝ ගැටලු නායකයකු වශයෙන් සංයමයෙන් විඳදරා ගැනීමට නොහැකි වීම යන කරුණු බව පෙන්වාදිය හැකිය.

අත්අඩංගුවට පත්වූ රජතුමා කොළඹට රැගෙන ඒමෙන් අනතුරුව 1816 ජනවාරි 24 වෙනිදා ඉංග්‍රීසින්ට අයත් කොන්වෝලිස් නැවෙන් මාද්‍රාසිය බලා රැගෙන ගියේය. එසේ යන අවස්ථාවලදී රාජකීය පවුල භාරව ගමන්ගත් ගරුන්විල් විල්සන් නම් වූ නිලධාරියා තම දින පොතෙහි රජුගේ යහපත් පෞද්ගලික ලක්ෂණ සටහන් තබා ඇති අතර, ඉහතින් සඳහන් කළ පරිදි එතුමා තුළ පැවති අධික කෝපය පිළිබඳව මැනවින් වටහාගැනීමට එහි සඳහන් එක් විස්තරයක් මෙසේය.

1816 පෙබරවාරි 20 වැනි දින

දහවල් 1100 ට පමණ රාජකීය ලැගුම් කුටි දෙසින් මහා ඝෝෂාවක් ඇසුණි. එකෙණෙහිම පාත මාලයට ගොස් රාජකීය කුටි පෙදෙසට ඇතුළුවන්ම රජතුමා ඉමහත් කේන්තියකින් එහි තිබූ යහනාවක් පතුරු ගසන බව දුටුවෙමි. ඊට පසු කෙටේරිය අමෝරාගෙන රාජකීය පිරිසට තර්ජනය කරන්නට වූහ. රජතුමා හොඳ සිහියකින් පසුවන බව තේරුම් ගත් මා තවත් පමාවීම නුවණට හුරුනොවන නිසා ඉදිරියට ගොස් රජුගේ මුහුණ දෙස එකඑල්ලේ බලාසිටිමින් එතුමාගේ අත දයාවෙන් අල්වාගෙන උතුමාණෙනි, කෙටේරිය මට දුන මැනවැයි කීවෙමි. රජතුමා අනලස්වම එය මා අතට පත්කළේය.

ඉන් පසුවත් ඉහවහා ගිය කේන්තියෙන් අවට සිටියවුන් දෙස රවා බලමින් සිටි රජතුමා ක්ෂණිකයකින් නික්ම ගොස් සිය කුටියට වැදුණේය. පළමු වතාවට කෝපාගිනියෙන් දැවෙමින් සිටි රජතුමාගේ බිහිසුණු විලාශය දුටු මට මෙවැනි අවස්ථාවක එතුමා සිහසුන අරා වැඩසිටියේ නම් අසරණ අන්තේවාසිකයිනට කුමක් සිදුවන්නේ දැයි පසක් කරගත හැකිවිය.

රජුගේ මෙම දැඩි කෝපය හා බිහිසුණු ක්‍රියාකලාපය හේතුවෙන් ඇහැලේපොළ කුමාරිහාමි හා දරුවන්ට ඛේදජනක ඉරණමකට මුහුණ පෑමට සිදුවිය. රජුගේ මෙම ක්‍රියාවන් යටත් වැසියන් පිළිකුල් කළේය. යම් අයකු ඒවා අගය කළේ නම්, ඒ රජු විසින් එවකට රටේ පැවති ඉහළම සමාජය වූ නිලමෙවරුන්ට දඬුවම් කරන විට ඒවා දැකීමෙන් ප්‍රීතිවන පුද්ගලයන් පමණෙකි. කෙසේ වුවද රජතුමා පවසා ඇත්තේ ඔහු කටයුතු කළේ පුරාණ රාජ නීතියට අනුව බවයි.

එසේ වුවද රාජසිංහ රජු දැඩි දරදඬු බිහිසුණු පුද්ගලයකු ලෙස පමණක් හැඳින්වීම සාධාරණ නොවේ. ඔහුගේ බොහෝ වැරදි ක්‍රියාවන්ට වගකිවයුතු රජු විශ්වාස කළ රජුව මුලාකළ සමීප ඇමතිවරු රාශියක්ද වේ. රජතුමා සැමවිටම රාජකීය බව පෙනෙන ලෙස හැසිරුණු බවත්, ඉතා පිරිසිදුව ඇඳීමට පැලඳීමට ප්‍රියකළ බවත්, යම් විටක හාස්‍ය රසය විඳගනිමින් කටයුතු කළ බවත්, එක් දිනක නැවේ සියලු දෙනා වෙනුවෙන් භෝජන සංග්‍රහයක් පවා පැවැත්වූ බවත් 1830 Journal of William Granville Colombo නම් ග්‍රන්ථයේ සඳහන් වේ.



කර්නල් එම්ඩීපී පෙරේරා
(විශ්‍රාමික)

## අගස්ටියන් පෙර පාසලේ දූ දරුවන් හට ඉගෙනුමට අත්වැලක්

641 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 14 ශ්‍රීලංසිරෙ ඒකකය වෙතින් තවත් ප්‍රජා මූලික වැඩසටහනක් කරුවලකණ්ඩාල් ග්‍රාමසේවා වසමේ පිහිටි අගස්ටියන් පෙර පාසලේදී පවත්වන ලදී. එහිදී දූ දරුවන් 13 දෙනකුගේ අධ්‍යාපන කටයුතු නංවාලීමේ අරමුණින් ඔවුන් වෙත මේස හා පුටු ලබාදීමට ක්‍රියාකෙරිණ. 641 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීපීජේසී ජයවර්ධන යුඑස්පී ගේ උපදෙස් මත මෙම කටයුත්ත සිදුවිය.



## 1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ බළඇණි පුහුණු පාඨමාලාව





1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ බළඇණි පුහුණු පාඨමාලාව ඉකුත් නොවැම්බර් 01 වන දින සිට දෙසැම්බර් 15 වන දින දක්වා පැවැත්විණ. එම පාඨමාලාවේ දක්ෂතා දැක්වූවන් හට යුද හමුදා පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් ජයග්‍රාහී කුසලාන පිරිනමන ලදී. එහිදී, මේජර් සීසී මුදන්නායක ශ්‍රීලංරබ දක්ෂතම සිසුවා ලෙසද, සෙ/2ජේ00333 රසෙ කෝප්‍රල් රත්නිලක ඩීඑම් දක්ෂතම වෙඩි තබන්නා ලෙසද දක්ෂතම ශාරීරික යෝග්‍යතා ශිෂ්‍යයා ලෙස සෙ/ජේ100800 රසෙ දිසානායක ඩීඑම්සී හා සෑම අතින්ම දක්ෂතම කණ්ඩායම ලෙස "ඒ" කණ්ඩායමද සම්මාන දිනාගත්තා ලදී.



# "අලි කෙඳි සෙවීම"

**90** දශකයේ මුලභාගයේ මඩකලපුව ප්‍රදේශය තුළ සේවය කළ කාලසීමාව මා හට යුද බිමෙහි බොහෝ මතක ඉතිරි කළ සමයකි. යුද්ධයේ කුරිරු බවද පාරිසරික දුෂ්කරතාවයන්ද අතර වුව එම අතීතය අදටද සුන්දර සිහිනයක් වැන්න. එම කාලවකවානුව ජීවිතයේ බොහෝ දුක්විඳි සමයක් වුවද වර්තමානයේ එය සිහිකිරීම තරම් ආශ්වාදයක් තවත් නැත. යුද බිමෙහි අත්දැකීම් ඇති ඕනෑම අයකුටද එය එලෙසින්ම දැනෙනු නොඅනුමානය.

ආරක්ෂක අංශ සාමාජිකයින් අතර අලිකෙඳි පිළිබඳ එවක පැවතියේ මහත් උනන්දුවකි. අලිකෙඳි යොදා සෑදූ මුදු, බ්‍රේස්ලට් ආදිය පැළඳීම ඔවුන් අතර සුලභ විය. එමගින් කිසියම් ආරක්ෂාවක් සැලසෙන බවට වූ මතයක්ද එය ආඩම්බරය දනවන මෝස්තරයක්ද වූ හෙයින් එලෙස හමුදා සාමාජිකයින් අතර අලිකෙඳි භාවිතය පැතිරීමට හේතු වූයේය. එකළ අලිකෙඳි සෙවීම තරගයක් සේ වූ අතර ඒවා යොදා සෑදූ බ්‍රේස්ලට්, මුදු ආදිය පොලොන්නරුව, කදුරුවෙල ප්‍රදේශයේ වූ රත්‍රන් බඩු සාප්පුවල පවා අලෙවියටද තබා තිබුණා මතකය. මා සිටි කඳවුර අවටද නිතර වල් අලි ගැවසුනු හෙයින් ඔවුන් ගෙන් ගිලිහුනු අලිකෙන්දක් ඒ අවටින් අහුලාගන්නට ලැබේවි යැයි සිතා බලාසිටි සෙබළුද එහි වූහ.

එවක මා සිටි කඳවුර පොලොන්නරු මඩකලපු මාර්ගයේ 118 වෙනි කිලෝමීටර් කනුව අසල පිහිටා තිබුණි. ලුතිනන් වරයකු වූ මා යටතේ එහි 40 කට ආසන්න භටපිරිසක්ද වූහ. මඩකලපු පොලොන්නරු ප්‍රධාන මාර්ගයේ ආරක්ෂාව තහවුරු කිරීම එවක අප වෙත පැවරී තිබූ ප්‍රධාන වගකීම විය. ඒ අනුව සෑම දිනකම එහි හමුදා වාහන ගමන්කිරීමට පෙර මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම අනිවාර්ය වුවද සිවිල් වාහන හෝ පුද්ගලයින්ට එහි යාමට බාධාවක් නොවීය. එබැවින් උදෑසන සිටම යාබද "වාලච්චේන" හා "ඕට්ටමාවඩි" නගර වෙතද "වැලිකන්ද" දෙසටද යන දෙමළ හා මුස්ලිම් ජනතාව මාර්ගයේ බොහෝවිට දැකගත හැකිවිය.

එක්තරා දිනෙක උදෑසන මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාන්විතය සඳහා මා ඇතුළු භටපිරිස් සූදානම් වූහ. එදින දහවල වෙද්දී මඩකලපුවේ සිට වැලිකන්ද බලා යුද හමුදා රථ පෙළක් ගමන් ගැනීමට නියමිතව තිබූ බැවින් මා හට අයත් බල ප්‍රදේශයේ ආරක්ෂාව නිසි ලෙස සහතික කිරීම අනිවාර්ය විය. ඒ අතරවාරයේ වාලච්චේන දෙසට පාපැදියකින් යමින් සිටි මුස්ලිම් ජාතිකයකු කඳවුරට කිසියම් පණිවිඩයක් ලබාදුන්නේය. එමගින් කියවුනේ යාබද පූනානි දුම්රියපොල සමීපයේ මාර්ගය අද්දර වූ තැනක වල් අලියකු මියගොස් සිටින බවය.

කුමන හේතුවකින් හෝ එලෙස අලියකු මියයාම කනගාටුවට කරුණක් වුවද අලි කෙඳි සෙවීමේ නොතිත් ආසාවෙන් පෙළුණු කඳවුරේ සැමට එය කිසියම් උනන්දුවක් ගෙනදුන් ප්‍රවෘත්තියක්ද විය. එම මුස්ලිම් ජාතිකයා කියූ පරිද්දෙන් අලියා මැරී සිටි තැන මාගේ කඳවුරේ සිට කිලෝමීටර් එකහමාරක් පමණ වැලිකන්ද දෙසට වන්නටය. එම ප්‍රදේශය පූනානි "දුම්රියපොල කඳවුර" ට අයත්විය. ඒඅනුව මාර්ගයේ ආරක්ෂාව සැලසූ සැනින් එම අලියා බලන්නට යාම මාගේද අපේක්ෂාව විය.

මේ අතරතුර යාබද පුනානි දුම්රියපොල කඳවුර දෙසින් එක්වරම ඇසුනෙත් වෙඩි වරුසාවකි. අසාමාන්‍ය ලෙස ඇසුණු එම වෙඩි හඬවල් විනාඩි කිහිපයක් තුළදී නතර විය. මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාන්විත අවට කඳවුරුවලින්ද ඒ වනවිට ඇරඹී තිබූ හෙයින් ප්‍රදේශයේ වෙඩි හඬවල් ඇසීම සාමාන්‍ය කරුණක් වුවද දුම්රියපොල කඳවුර දෙසින් ඇසුනේ වෙනදාට වඩා වෙනස් තත්ත්වයකි. එහිදී, මා වහා ගුවන්විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍රය ඔස්සේ ඒ පිළිබඳ විපරම් කිරීමේදී දැනගත්තේ දුම්රියපොල කඳවුරේ හටපිරිසකට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ලවී ඇති බවකි.

පුනානි දුම්රිය පොල කඳවුරේ කඳවුරු භාරව සිටියේ විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිලධාරියකු වූ ලුතිනන් ජානක කාරියප්පෙරුමය. උදෑසන මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාන්විතය සඳහා සූදානම් වෙමින් සිටියදී ඔහුටද සිය කඳවුර සමීපයේ තැනක මාර්ගය අද්දරට වන්නට වල් අලියකු මියගොස් සිටින බවට තොරතුරු ලැබී තිබුණි. ඒ අනුව ඔහු සිය හටපිරිස් සමඟ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ ක්‍රියාන්විතය අතරතුර අලියා වැටී සිටි ස්ථානයටද ලඟාවී තිබිණ. නමුත් ඒ වන විට එහි සිදුවෙමින් තිබුණේ කිසිවකු අපේක්ෂා නොකළ සිදුවීමකි. එනම් මාර්ග ආරක්ෂාවේ යෙදෙන එම හටපිරිස් ඉලක්ක කොට ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා ත්‍රස්තවාදීන් එහි රැකසිටීමය. නමුත් ඒ ආසන්නයේම අලියෙකු මැරී සිටින බවක් එහි රැකවල්ලා සිටි ත්‍රස්තවාදීන් දැන සිටි බවක් නොපෙනිණ.

ලද තොරතුරු ඔස්සේ මාර්ග සෝදිසි කිරීමේ ක්‍රියාන්විතයේ නිරත ලුතිනන් කාරියප්පෙරුම ඇතුළු හටපිරිස් වල්අලියා සොයා අනපේක්ෂිත ලෙස එහි පැමිණීම ත්‍රස්තවාදීන්ගේ සැලසුම් අවුල් කර දැමූ සෙයකි. ඔවුන් සැඟව සිටි ප්‍රදේශය හමුදා සමාජිකයන් හඳුනාගෙන ඇති බවට සිතූ ඔවුන් එක්වරම එම හටපිරිස් වෙත ප්‍රහාරයක් එල්ල කරමින්ම ප්‍රදේශයෙන් පලා යන්නට වූහ. එහිදී පැවැති ගැටුමෙන් හමුදා සාමාජිකයෙකු සුළු තුවාල ලැබුවද ත්‍රස්තවාදීන්ට සැලකියයුතු හානි සිදුවූ බවක් පෙනෙන්නට තිබිණ.

අතහැර දැමූ වෙල්යායක් බඳු විවෘත භූමියක් වූ එම ප්‍රදේශයේ වියළී ගිය වලගොඩැලිද ඇල පාරවල්ද අඩි හතරකට වඩා උස්ව සරුවට වැඩුණු ඉලුක් ගාල්ද පැතිර පැවතිණ. එම භූමිය විශාල පිරිසකට වුව එකවර සැඟවී සිටිය හැකි තරම් ආවරණ සහිත වීම ත්‍රස්තවාදීන්ට සිය ප්‍රහාර සඳහා වාසිවී තිබුණි. අලියා මිය ගොස් සිටියේද ඉලුක් ගාලක් මැද බැවින් ඌගේ සිරුරද එක්වරම සොයාගත නොහැකි තරම්ය.

මේ අතර අමතර හට කණ්ඩායමක්ද සමඟ එහි ගොස් සිටි මාහට ලුතිනන් කාරියප්පෙරුම ඇතුළු සෙබළ පිරිස අලියා මැරී සිටි ස්ථානයේදී මුනගැසුනහ. ඒවනවිට එහි තත්ත්වය සමනයවී තිබුණු අතර අවට ආරක්ෂාවද තරකොට තිබිණ. එහිදී, එම අලියා මියයෑමට හේතුව සොයාබැලීමේදී එය විදුලි සැර වැදීමෙන් බැව් අපගේ අනුමානය විය. එවක පුනානි දුම්රියපොල කඳවුරට විදුලිබලය තිබුනද එතැන්සිට කිලෝමීටර් දෙකහමාරක් පමණ දුරකින් වූ මාසිටි කඳවුරට (118 KM post) විදුලිබල පහසුකම් නොවීය. එහිදී, මාගේ කඳවුරේ හටපිරිස් එකතුව ඒ සඳහා විකල්ප ක්‍රමයක් යොදාගෙන තිබිණ. එනම් ප්‍රධාන මාර්ගයේ තැනින්තැන වූ පැරණි ලයිට් කණුවල එල්ලාවැටෙමින් තිබූ කම්බි ගලවා ඒවා දුම්රියපොල කඳවුරේ සිට මා සිටි කඳවුර තෙක් ඇද ඒ හරහා විදුලිය ලබාගැනීමය.

පොලොන්නරු මඩකලපු දුම්රිය මාර්ගයද ප්‍රධාන මාර්ගයට සමාන්තරව දිවුණු අතර එවක එහි දුම්රිය ධාවනය සිදුනොවුණි. එබැවින් අප කඳවුර දක්වා විදුලි වයර් ඇදීම සඳහා රේල්පාර යොදාගැනීම පහසුවක් විය. අවට කැළයෙන් කපාගත් ශක්තිමත් තේක්ක කණු ඒ සඳහා යොදාගන්නා ලද අතර එම කටයුතුවලදී බොහෝ කැපවීමෙන් වැඩ කරන ක්‍රියාශීලී සෙබළ රැසක්ම මා සිටි කඳවුරේ සිටියහ. පාළුවට ගොස් තිබූ එම රේල් පාරෙන් බංකර් සෑදීම සඳහා සිල්පර කොට හා රේල්පීලි ගැලවීමටද ඔවුහු රුසියෝ වූහ. "ජැක්" එකක් ආධාරයෙන් ඒවා ක්ෂණිකව ගලවන තාක්ෂණය ඔවුන් දනී.

එම කටයුතු නීත්‍යානුකූල නොවූවද පැවති ක්‍රියාන්විත තත්ත්වයද කඳවුරේ කටයුතුවලදී විඳි අපහසුතාද හේතුවෙන් එවන් ක්‍රියාමාර්ගයක් ගැනීමට හේතුවී තිබිණ. රාත්‍රියේ ප්‍රදේශයේ සැරිසරන වන අලි රේල්පාර දිගට කම්බි බැඳි එම තේක්ක කණුවල පිට ඇතිල්ලීම පුරුද්දකි. මෙම අලියා අවාසනාවන්ත ලෙස මියගොස් තිබුනේ එවන් අවස්ථාවක එහි තිබූ විදුලි රැහැන් ස්පර්ශ වීමෙන් බැව් සිතාගත හැකිවිය.

කෙසේ හෝ සිද්ධිය පිළිබඳ තොරතුරු ඉහළ මූලස්ථාන වෙත දන්වා ඉදිරි කටයුතු සිදුකෙරෙන අතරේ ලුතිනන් කාරියප්පෙරුම සමඟ මා අලියාට සමීප වූයේ එළැඹි අවස්ථාවෙන් අලිකෙන්දක් හෝ ගලවා ගැනීමේ බලාපොරොත්තුවෙනි. නමුත් පුදුමයකි, ඒ වනවිටත් අලියාගේ වලිගයේ අග කොටස කිසිවකු විසින් කපා ගෙනගොස් තිබිණ.

**යුද්ධය හමුවේ අහිමිවන සතාසීපාවුන් පිළිබඳ සේම විනාශවන ගහකොළ පිරි පරිසරය පිළිබඳවද එම බිමෙහි පයගසා සිටි අයවළුන් ලෙස අපතුළ පැවතියේ පශ්චාත්තාපයකි. එහෙත් වැඩි වටිනාකමක් ඇත්තේ මිනිස් ජීවිතයකද සතාසීපාවුන්ගේද ගහකොළවලද යන්න තෝරාගැනීමට එවක පැවති ක්‍රියාන්විත පරිසරය අපට බලකොට තිබුන සෙයකි.**

අලියා මියගොස් ඇති ආකාරය පැහැදිලි වුවද උගේ වලිගය අහිමිවීම කෙසේ සිදුවිනිදැයි අප දෙදෙනාටම ප්‍රෙහේලිකාවක් විය. කෙසේවුවද එම වල් අලියා නිසාම එහි ඇතිවීමට ගිය බරපතල තත්ත්වයක් නම් වැලකී ගියේය.

යුද්ධය හමුවේ අහිමිවන සතාසිපාවුන් පිළිබඳ සේම විනාශවන ගහකොල පිරි පරිසරය පිළිබඳවද එම බිමෙහි පයගසා සිටි අයවළුන් ලෙස අපතුළ පැවතියේ පශ්චාත්තාපයකි. එහෙත් වැඩි වටිනාකමක් ඇත්තේ මිනිස් ජීවිතයකද සතාසිපාවුන්ගේද ගහකොලවලද යන්න තෝරාගැනීමට එවක පැවති ක්‍රියාන්විත පරිසරය අපට බලකොට තිබුන සෙයකි.

ඉහත මතක පිරි කාලය ඉක්ම මේ වෙද්දී වසර 27ක් පමණ ගෙවී අවසන්ය. එකල මෙන් අද අලිකෙඩි පිළිබඳ උනන්දුවක් සමාජයේ නැතත් යුදබිමේ ඉහත අප්‍රකට කතානම් අදටද වටී. මේවා සොඳුරු විඳීම් ඇති රසබර කථා සේ පෙනුනද ඒවා යට තිල ඇඳුම් ලාගත් සංවේදී මිනිසුන්ගේ ලේ කඳුළු දහඩිය තැවරී තිබුණු බැව් පමණක් අමතක නොකරන්නැයි පාඨක ඔබගෙන් ඉල්ලමි.



සටහන:
ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ

# 613 වන පාබල බලසේනාවෙන් තවත් පූජා සත්කාරයක්





ගා/ඕමන්ත මහා විද්‍යාලය වෙත පරිගණක දෙකක් හා එහි පාසල් ළමුන් 40 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමක් පසුගිය නොවැම්බර් මස 23 වන දින එම විද්‍යාලයේදී සිදුකෙරිණ. මේ සඳහා ආරක්ෂක සේනා (බටහිර) ට අයත් 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්යු හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ උපදෙස් මත 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණය යටතේ 14 (සේවා) ගැමුණු හේවා බළඇණියේ භට පිරිස් සහභාගී වූහ.

# ඇහැටුගස්වැව මහා විද්‍යාලයේ පාසල් ළමුන් සඳහා පරිත්‍යාගයක්





622 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශය තුළ පිහිටා ඇති මු/ඇහැටුගස්වැව මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන පාසල් ළමුන් 50 දෙනකු සඳහා පාසල් උපකරණ හා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් මස 25 වන සිදුකෙරිණ. මෙහිදී, පාසල් ළමයකු සඳහා රුපියල් 8000.00 ක් වටිනා පාසල් උපකරණ (මුළු වටිනාකම රුපියල් 400000.00) සහ රුපියල් 3500.00 ක් බැගින් වූ සලාක මළු 50 ක් (මුළු වටිනාකම රුපියල් 175000.00 ක්) ලබාදෙන ලදී. මෙම මාහැඟි මෙහෙවර 62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අදහසකට අනුව 622 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 9 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ සංවිධානයෙන් යුතුව සිදුකරන ලදී. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා පූර්ණ මූල්‍ය අනුග්‍රහය සමරක්කොඩි මහතාගේ සම්බන්ධීකරණයෙන් එන්එස් ප්‍රමෝෂන්ස් ආයතනය, ද කිචන් හවුස් ආයතනය හා වර්ණ ෆාමසි විසින් ලබාදෙන ලදී.



# විදේශ විනිමය ඉතිරි කරන්න යුද්ධ හමුදාවෙන් අලුත් වැඩක්

රටට බරක් නොවී රටට සේවය කිරීමේ සංකල්පය මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ක්‍රියාත්මකවන වැදගත්ම සංකල්පයකි. විශේෂයෙන්ම තමන් ස්වයංපෝෂිත වී රටට අවශ්‍ය සේවය මෙන්ම ඉන් ඔබ්බට ගිය මෙහෙවරක් ඉටු කිරීමට මේ තුළින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකි වී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මේ වනවිට කෘෂිකර්මාන්තය වෙනුවෙන්ම වූ බලකායක් ස්ථාපනය කර යුද්ධ හමුදාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එලෙස නිෂ්පාදනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය සහන මිලකට යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් ලබාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව පසුගියදා ආරම්භ කෙරුණි.

ඉන් නොනැවතී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තමන්ට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් යුද්ධ හමුදාව තුළම නිෂ්පාදනය කිරීමේ වැඩපිළිවෙලක් සකස්කර අවසන්ය. එහි කූඨෝප්‍රාප්තිය ලෙස සඳහන් කළ හැකිවන්නේ වේයන්ගොඩ දී ඉදිකළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ කර්මාන්ත ශාලාව ARMY



ORDNANCE INDUSTRIES නමින් ඉකුත් දෙසැම්බර් 08 දින යුද්ධ හමුදාධිපති විසින් විවෘත කිරීමයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය යුද්ධෝපකරණ භාණ්ඩ යුද්ධ හමුදාව තුළම නිෂ්පාදනය කරගැනීමේ මූලික අභිමතාර්ථය සහිතව කළුතර දොඹගොඩදී යුධෝපකරණ කර්මාන්ත ශාලාව ආරම්භ කරන ලද්දේ බ්‍රිගේඩියර් කෙම්පිටිය සහ බ්‍රිගේඩියර් පියසෝම විසින් "කෙම්පියා" මෝටාරය නිෂ්පාදනය කටයුතු අත්හදා බැලීමත් සමගය. එය එල්ටීටීඊ සංවිධානයේ පාසිලාන් -200 මෝටාරයට එරෙහිව අත්හදා බලන ලද මෝටාරයයි. එහි සියලු නිෂ්පාදනයන් හා අත්හදාබැලීම් එම යුධෝපකරණ භූමියේදී සිදුවිය.

ඉන් අනතුරුව දශකයකටත් වැඩි කාලයක් නිහඬව පැවති දොඹගෙඩ යුධෝපකරණ කර්මාන්තශාලාව 2014 වසරේදී යළි ආරම්භ කෙරුණි. ඒ කර්නල් එච්එල් ගුරුගේ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ අඩු පිරිවැය ඉහළ ගුණාත්මකභාවය යන සංකල්පය පෙරදැරි කරගනිමිනි.





**පසුගිය කොරෝනා වසංගත සමය තුළ යුද්ධ හමුදාව සහ සෞඛ්‍යය අංශ විසින් පවත්වාගෙන ගිය සියලු නිරෝධානය මධ්‍යස්ථාන වෙත අවශ්‍යය යකඩ ඇඳන් 20000 කට අධික ප්‍රමාණයක් සහ ඇඳ ඇතිරිලි සහ කොට්ටා උර 40000 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලැබුවේද, කලුබෝවිල රෝහලේ කොවිඩ් රෝගීන් වෙනුවෙන් දින දෙකක් වැනි කාලයක් තුළ යකඩ ඇඳන් 200ක් නිෂ්පාදනය කිරීමටත් කටයුතු කළේ මෙම කර්මාන්ත ශාලාවෙනි.**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා 2020-2025 මූලෝපායික සැලැස්මට අනුව මෙන්ම කොරෝනා වසංගත තත්ත්වය නිසාවෙන් සැපයුම්දාමය අඩපණවීමත් සමඟ යුද්ධ හමුදාවට අවශ්‍ය යුධෝපකරණ ද්‍රව්‍යය යුද්ධ හමුදාව තුළින්ම නිෂ්පාදනය කරගැනීමේ අවශ්‍යතාවය පැණනැගුණු නිසාත් මෙම කර්මාන්තශාලාවේ නිෂ්පාදනයන් වඩාත් පුළුල් කිරීම සහ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව අත්හැරදමා තිබූ වේයන්ගොඩ පෙහෙකම්හල් සංකීර්ණය නවීකරණය කර ARMY ORDNANCE INDUSTRIES නමින් ආරම්භ කෙරුණි.

එලෙස යළි ආරම්භකළ කර්මාන්තශාලවේදී යුද්ධ හමුදාවට අත්‍යවශ්‍යය භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී. ඊට යකඩ ඇඳන් නිෂ්පාදන අංශය, භාණ්ඩෝපකරණ අංශය, ඇඟළුම් නිෂ්පාදන අංශය, ටයර් කට්ටා නැවත ඇලවීමේ අංශය වැනි අංශයන් ඇතුලත්ය. පසුගිය කොරෝනා වසංගත සමය තුළ යුද්ධ හමුදාව සහ සෞඛ්‍යය අංශ විසින් පවත්වාගෙන ගිය සියලු නිරෝධානය මධ්‍යස්ථාන වෙත අවශ්‍යය යකඩ ඇඳන් 20000 කට අධික ප්‍රමාණයක් සහ ඇඳ ඇතිරිලි සහ කොට්ටා උර 40000 කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලැබුවේද කලුබෝවිල රෝහලේ කොවිඩ් රෝගීන් වෙනුවෙන් දින දෙකක් වැනි කාලයක් තුළ යකඩ ඇඳන් 200ක් නිෂ්පාදනය කිරීමටත් කටයුතු කළේ මෙම කර්මාන්ත ශාලාවෙනි.

ඇඟළුම් නිෂ්පාදන අංශයෙන් ආධුනික සෙසුනිලයින් පුහුණු කිරීම සඳහා අවශ්‍යය නිලඇඳුම්, කොට කලිසම්, හිස්වැසුම්, වැඩඇඳුම්, ටී ෂර්ට්, ඇඳඇතිරිලි, කොට්ට උර නිෂ්පාදනය කරනු ලබන අතර ටයර් කට්ටා ඇලවීමේ අංශය මඟින් යුද්ධ හමුදාවේ ධාවනය වන සියලුම බර වාහන සඳහා ටයර් කට්ටා ඇලවීම සිදුකරනු ලබයි. උපකරණ නිෂ්පාදන අංශය වෙතින් සියලුම වර්ගයේ පැක්වර්ග, වැහිකබා, පොංචොකේප්, වාහන කැනපි, සියලුම වර්ගයේ කූඩාරම්, නිලධාරීන් සහ සෙසු නිලයින් පළඳින සියලුම වර්ගවල බෙල්ට්, ඇසෝල්ට් ජැකට්, ෆ්ලැට් ජැකට් වැනි විශේෂ උපකරණ නිෂ්පාදනය කරනු ලබයි.

රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කරමින් බැලැස්ටික් හෙල්මට් නිෂ්පාදනය කිරීමද මෙම කර්මාන්ත ශාලාවේ සිදුකිරීම සුවිශේෂී කරුණකි. ඊට අමතරව නියමු ව්‍යාපෘතියක් ලෙස බෙරට් (හිස්වැසුම්) නිෂ්පාදන අංශය, පාවහන් නිෂ්පාදන අංශය, අත්‍යන්ත්‍ර හා රෙදිපිළි නිෂ්පාදන අංශය ආරම්භ කර ඇති අතර, එම අංශයන් මඟින් උසස් ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබාදීම සිදුකෙරේ. එමෙන්ම ගෑස් ලිප්, ගෑස් උඳුන්, පිහි වැනි උපකරණද යුධෝපකරණ කර්මාන්තශාලාව තුළින් නිෂ්පාදනය කිරීම තුළින් රටට විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකි වී ඇත.

මේ වනවිට මෙම කර්මාන්ත ශාලාව සඳහා අතිනවීන පහසුකම් සහිත

අධිවේගී යන්ත්‍ර 115ක් නිෂ්පාදන ක්‍රියාවලියට එක්කර ඇති අතර, ඒ නිසා නවතමයෙන් ආර්සීඑච් 100 පැක්, 58 මාදිලියේ පැක්, ඇලිස් පැක් වැනි සංකීර්ණ නිෂ්පාදන පවා මෙහිදී සිදු කෙරේ.

මේ වනවිට වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පැස්සුම් ශිල්පී සහ මැහුම් ශිල්පී පාඨමාලාවන් සිදුකරනු ලබන අතර ඒ සඳහා NVQ - L3 සහතිකය ලබා දී වෘත්තීය මට්ටමේ සෙබළුන් බිහිකිරීමටද කර්මාන්තශාලාව විසින් සිදුකරනු ලැබේ. මේ වනවිට මෙම කර්මාන්තශාලාව තුළ පුහුණු ශ්‍රමිකයින් 240ක් සේවය කරනු ලබයි.

මෙම කර්මාන්තශාලාව ස්ථාපනය කිරීමත් සමග යුද්ධ හමුදාවේ ඉහත සඳහන් කළ අවශ්‍යතාවයන් දේශීය සහ විදේශීය සැපයුම්කරුවන්ගෙන් ලබාගැනීමේදී වැයවන මුදලින් 40%ක් අවම කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකි වී ඇත. එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රටට ලබාදෙන සුවිශේෂී දායකත්වයකි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සැමවිටම කටයුතු කරනු ලබන්නේ ජාතියේ ආරක්ෂකයා ලෙසිනි. රට ආර්ථික වශයෙන් යම් පසුබෑමකට ලක්ව සිටින මේ අවස්ථාවේ දී විදෙස් විනිමය රටට ඉතිරි කර ජාතික අර්ථිකයට ශක්තියන් වන්නේද ඔවුන් සැබැවින්ම රටේ ආරක්ෂකයන් වශයෙන් රටට අවැසි ඕනෑම මොහොතක රට වෙනුවෙන් පෙරට එන්නට සූදානම් නිසාය.



සටහන -:
ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# ප්‍රතිත්‍රස්ත යුධ උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලා අංක - 31





මාදුරුඔය සටන් පුහුණු පාසල වෙතින් ඉකුත් අගෝස්තු 29 වන දින ආරම්භ කරන ලද "ප්‍රතිත්‍රස්ත යුධ උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලා අංක - 31" (නිලධාරී පාඨමාලාව) ඉකුත් දෙසැම්බර් 06 වන දින සාර්ථකව නිම කරන ලදී. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිලධාරීන් 21 ක්ද, ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරියකු, බංගලාදේශ හමුදා නිලධාරීන් දෙදෙනකු, පාකිස්ථාන හමුදා නිලධාරීන් දෙදෙනකු හා නේපාල හමුදා නිලධාරියකු සහභාගී වූහ.

පාඨමාලාවේ පළමු ස්ථානය නි/69980 කපිතාන් ඒඒපීවී සුරවීර ශ්‍රීලංඉ යන නිලධාරී විසින් හිමිකරගත් අතර, සහතික ප්‍රදානය එම පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# දෘශ්‍යාබාධිත වැඩිහිටියන් සඳහා විශේෂ දිවා භෝජන සංග්‍රහයක්





52 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ මූලිකත්වයෙන් කයිතඩි ප්‍රදේශයේ පිහිටි දෘශ්‍යාබාධිත වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන් 35 දෙනකු සඳහා පසුගිය නොවැම්බර් 22 වන දින විශේෂ දිවා ආහාර වේලක් පිරිනැමීමට කටයුතු කරන ලදී.




# පුදුකුඩිඉරිප්පු හිදී සිදුකරනු ලැබූ වීර ක්‍රියාව



**නි/66514 කපිතාන් එච්එම්කේඅයි මේසවර්ණ පිඩබ්ලිව්වී ආර්වඑස්පී**

9 වන ගැමුණු හේවා බළඇණිය



රත්නපුර - ඇඹිලිපිටිය මාර්ගයේ කහවත්ත නාගරික පෙදෙස පසුකරත්ම හමුවන කුඩා රමණීය කඳුබෑවුම්වලින් සමන්විත මාර්ගයේ දකුණු දිශාවට හැරී යන විට සුන්දර ගම්මානයකි "යායින්න". එම සුන්දර ගමේ බණ්ඩාරගෙන්න අප මේසවර්ණයන්ගේ ජන්මභූමියයි.

කහවත්ත ග්‍රාමයේ ව්‍යාපාරිකයකු ලෙස සිය ජීවන වෘත්තිය ගෙනගිය හේවාවසම් ගොලුවා මරක්කලගේ කිත්සිරි මේසවර්ණ සහ ඔහුගේ ප්‍රිය භාර්යාව වන ගම්මුලුගේ ආරියලතා ද සිල්වා යන මාපිය දෙපලගේ එකම පුතුරත්නය ලෙස 1984 දෙසැම්බර් මස 09 වන දින කහවත්ත රජයේ රෝහලේදී ජන්ම ලාභය ලැබූ කුමරුට හේවාවසම් ගොලුවා මරක්කලගේ කසුන් ඉෂාර මේසවර්ණ ලෙස නම් තැබිණ. කසුන් ඉෂාර දරුවා තම වැඩිමහල් එකම සහෝදරිය වූ හේෂානී එරංගා මේසවර්ණ නම් වූ අක්කණ්ඩිය සමග වැලිකෙලියෙහි පටන්ම ලැබැඳි සහෝදරත්වයකින් වෙළුණි.

කහවත්ත මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයට කසුන් ඇතුලත් කරනුයේ වර්ෂ 1989 ක් වූ ජනවාරි මස 10 වන දිනය. එතැන් පටන් ඔහු විද්‍යාලයේ ගුරු පියවරුන්ගේ සහ ගුරු මෑණිවරුන්ගේ ඔවදන් අනුව යමින් ආදර්ශවත් විනයගරුක ශිෂ්‍යයකු වූයේ අන් සිසුන් හට තමා වටා ඒකරාශී වීමට මගහසර හෙළිකරමින්ය. කහවත්ත මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති සෝමසිරි ගමඇතිගේ මහතා අතීත මතකයන් ආවර්ජනය කරමින් මේසවර්ණ සිසුවා කුඩාකල පටන්ම පාසලේ සියලුම වැඩකටයුතුවලදී නිසි නායකත්වය දෙමින් හා ක්‍රමානුකූලව තමාට පැවරෙන රාජකාරී ඉතා වගකීමකින් යුතුව ඉටුකළ අයකු බව ප්‍රකාශ කරයි. මේසවර්ණ සිසුවා පාසලෙන් පිරිනැමෙන පන්ති නායක හා ශිෂ්‍ය නායක ආදී තනතුරුවලට පත්වනුයේ ඔහුගේ නායකත්වයේ ලක්ෂණ විශද කරමිනි.

මේසවර්ණ ශිෂ්‍යයා වර්ෂ 2002 - 2004 කාලසීමාවෙහි පාසලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායක තනතුරෙන් පිදුම් ලබන්නේ කුඩා කල සිටම වර්ධනය කරගත් විනය හා එඩිතර බව අන් සිසුන්ටද කියාදෙමින්ය. එමෙන්ම මේසවර්ණගේ පාසල් කාලයේදී පන්තිභාර ගුරුවරු ලෙස කටයුතු කළ කරුණා විජේසිංහ, නිමාලි ප්‍රනාන්දු හා ගෝෂිකා නාගසිංහ වැනි ගුරුමෑණිවරුවන්ද මේසවර්ණ දරුවා තම පාසල් සමය තුළ තමන්ට හමුවූ සුවිශේෂී

ගුණාංගවලින් හෙබි දරුවකු බව හෙළිකළේ ආඩම්බරයෙනි. මේසවර්ණ ශිෂ්‍යයා ක්‍රීඩාවට උපන් දක්ෂයකු බව අදත් ඔහුගේ නිවසේ ඇති සහතික මිටි හා ජයග්‍රහණවලට හිමිවූ කුසලාන මැනවින් සාක්ෂි සපයයි.

ජීවිතයේ සාර්ථකත්වයට විවිධ අත්දැකීම් එකතු කරගනිමින් සිටි මේසවර්ණ ශිෂ්‍ය භටයකු ලෙස 2002 වර්ෂයේ අටවන බළඇණියේ ලියාපදිංචි වී එම වර්ෂයේදීම තම විද්‍යාල මාතාව නියෝජනය කරමින් රංටැඹේ ජාතික ශිෂ්‍යභට ඇගයීම් කඳවුර සඳහා සහභාගී විය. 2003 වර්ෂයේදී කෝප්‍රල්වරයකු ලෙස රංටැඹේ ජාතික ශිෂ්‍යභට ඇගයීම් කඳවුර සඳහා කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය වෙනුවෙන් සහභාගී වෙමින් ඉහළ දක්ෂතා දැක්වීමට සමත්වූ බව ඔහුගේ පාසල් දිවියේ ශිෂ්‍යභට කණ්ඩායම් භාර ගුරුතුමා වූ ඩබ්ලිව්ඩබ්ලිව්එල් ගුණදාස මහතා ඔහු පිළිබඳ මතකය අවදි කරමින් පවසා සිටියි.

පාසලේ ශිෂ්‍යභට හා බාලදක්ෂ කණ්ඩායමට ඇතුළත්ව සිටි මේසවර්ණ ශිෂ්‍යයා රට දැය සමය වෙනුවෙන් යුක්තිගරුකවූත්, සාධාරණවූත් යම් මෙහෙයක් ඉටුවිය යුතු බව සිතට ගනී. තම මාතෘභූමියට සිදුවෙමින් පැවති අගාදය සියැසින් දුටු කසුන් ඉෂාර මේසවර්ණ නම් වූ මේ යොවන තරුණයා දේශවාත්සල්‍යයෙන් යුතුවම තම මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් ජීවිතය දෙවෙනි කොට සලකා අධිෂ්ඨානශීලීව තීරණයක් ගත්තේය. ඒ අනුව වර්ෂ 2005 ජනවාරි මස 03 වන දින යුද්ධ හමුදාවට කෙඩෙට් නිලධාරියකු ලෙස එක්වී යුද්ධ හමුදාවට නිලධාරීන් බිහිකිරීමේ ප්‍රමුඛතම පුහුණු ආයතනය වන දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පවත්වන ලද නිලධාරී පාඨමාලා අංක 62 හැදෑරීමට ඔහු සමත් විය. කඳු තරණය කර තමා ඉදිරියේ ඇති ඉලක්කපත්වලට නිසි එල්ලයට වෙඩි තබමින් යුද ශිල්ප ඥානයෙන් මුවහත් වූ මේසවර්ණ වර්ෂ 2007 දෙසැම්බර් මස 22 වන දින 2/ලුතිනන් වරයකු ලෙස අධිකාරියට පත් වන්නේ යුද්ධ හමුදා නිලධාරියකු වශයෙන් "ඉදිරි ජීවිත කාලයටම රට දැය වෙනුවෙන් සේවය කරමි" යන පරම පිවිතුරු දේශමාමක සිතුවිල්ල හද පුරවා ගනිමිනි. ඔහු සමග කෙඩෙට් නිලධාරී පාඨමාලාව හැදෑරූ කපිතාන් අමරසිංහ තම පාඨමාලා සගයා පිළිබඳ මතකය අවදි කරමින් පවසා සිටියේ පුහුණු පාඨමාලාව තුළ ඔහු සරඹ හා වෙඩි තැබීම් යන විෂයන් පිළිබඳ මනා දක්ෂතාවයක් පෙන්නුම් කළ බවත් සැමවිටම තම පාඨමාලා සගයින් ධෛර්යමත් කිරීමට කටයුතු කළ බවත්ය.



තවද, කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 62 හි පාඨමාලාභාර නිලධාරියකු ලෙස කටයුතු කරන ලද මේජර් ප්‍රදීප් සිරිවර්ධන තමාගේ කෙඩෙට් නිලධාරියකු වූ කපිතාන් මේසවර්ණ පිළිබඳව මතකයන් අවදි කරමින් ප්‍රකාශ කර සිටියේ ඔහු සැමවිටම ඉතාමත් උද්‍යෝගිමත් හා සෙසු ශිෂ්‍යයින් සමග සහෝදරත්වයෙන් කටයුතු කළ කෙඩෙට් නිලධාරියකු බවයි.


"මා නිවත්ත අභික්කම" හෙවත් "නොනැවතී ඉදිරියට" යන වීර පාඨය පෙරදැරි කරගනිමින් සමන් දෙවිඳුන්ගේ පහසින් අනුහස් බලන රුවන්පුරය තම මධ්‍යස්ථානය කර ගනිමින් සතුරු බලමුළු විනාශ කිරීම තම එකම අරමුණ කරගත් දෙදහස් පන්සිය වසරක ශ්‍රී ලංකා ඉතිහාසයේ රට එක්සේසත් කළ ගැමුණු නිරිඳා ගිය මගෙහි ඉදිරියට යන ගැමුණු හේවා බලකාය තරුණ නිලධාරී මේසවර්ණගේ සේවය ලබාගැනීමෙන් නව නවත් අභිමානවත් විය. ඉතා සුළු කාලයක් ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුරුවිටහි රාජකාරී කර වර්ෂ 2008 ජූලි මස 31 වන දින සිට ගැමුණු හේවා බලකායේ ප්‍රධානතම ප්‍රහාරක බළඇණියක් වූ 9 වන ගැමුණු හේවා බළඇණිය වෙත ඇතුළත් විය. ලුතිනන් මේසවර්ණ රණවිරුවා තම හමුදා දිවියට අවශ්‍ය වෘත්තීය දැනුම ප්‍රවර්ධනය කරනු වස් කෙඩෙට් නිලධාරී පාඨමාලාවට අමතරව පාබල සොල්දාදුවන් විශිෂ්ඨත්වය පත් කරන විශේෂ ක්‍රියාන්විත පාබල බණ්ඩ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා නිම කළේය.

එහිදී, උතුරු මානුෂීය මෙහෙයුම යටතේ වෙල්ලම්කුලම් සිට පුදුකුඩිඉරිප්පු දක්වා තම බළඇණියේ සියලු ක්‍රියාන්විතයන්ට ලුතිනන් මේසවර්ණ උරදෙන්නේ "පළමුව මවබිම" යන උත්කෘෂ්ඨ අරමුණ ඇතිවය. 2009 පෙබරවාරි මස වනවිට ලුතිනන් මේසවර්ණ ඉතා කෙටි කාලයක් තුළ මාතෘභූමිය වෙනුවෙන් අපිරිමිත සේවාවක් සිදුකරමින් ශ්‍රී ලංකාද්වීපයේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ තිර අධිෂ්ඨානයෙන් තම සෙබළුන්ට නිසි නායකත්වය දෙමින් ඉදිරියට ඇදුණු යුගයයි.

වර්ෂ 2009 පෙබරවාරි මස 08 වන දින ලුතිනන් මේසවර්ණගේ නිර්භීත හා නිවැරදි නායකත්වය යටතේ ඉරණමඩු ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ආරක්ෂක වළල්ල අත්පත් කරගැනීම සඳහා දක්වන ලද නිර්භීත දායකත්වය වෙනුවෙන් මොහු රණශූර පදක්කමින් පුදනු ලැබුවේය. 30 වසරක් තිස්සේ පැවති කුරිරු ත්‍රස්තවාදයෙන් මාතෘභූමිය බේරාගැනීම සඳහා කළාවූ කැපවීම අගය කරමින් පූර්ණභූමි පදක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම හා වන්නි මානුෂික මෙහෙයුම් පදක්කම යන පදක්කම්වලින්ද මෙම අද්විතීය රණවිරුවා පිදුම් ලබා ඇත.

පුදුකුඩිඉරිප්පු මුදවා ගැනීමේ සටන 2009 මාර්තු මස දෙවන සතිය වනවිට දරුණු අතට හැරුණි. නගරබද සටන්වල නිරත වෙමින් ත්‍රස්තවාදීන් සැඟව සිටි ඉසව් සොයා ගොස් ඔවුන් සමග මුහුණට මුහුණලා සටන් කළ වීරෝදාර රණවිරුවෝ පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ජයග්‍රහණයේ කාහල නාදය පතුරවමින් සිටියහ. මෙහිදී, 9 වන ගැමුණු හේවා බළඇණියද සටන් බිමේ අසීරු ඉලක්ක සොයා ගොස් සටන් මෙහෙයවූ බළඇණියක් විය.

වර්ෂ 2009 වූ මාර්තු මස 02 වන දින උදා විය. තම ඒකකයේ "සී" කණ්ඩායමේ බණ්ඩභාර නිලධාරියකු ලෙස තම සෙබළුන්ට නිසි නායකත්වය හා මගපෙන්වීම ලබාදෙමින් පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට දැඩි ප්‍රහාර එල්ල කරමින් සටන් පෙරමුණ ඉදිරියට ඇදුනේ අභීත රණවිරුවකු ලෙසිනි. ත්‍රස්තවාදී බංකර් සහිත භූමියට සෙබළුන් යොමු කරමින් ත්‍රස්තවාදීන්ගේ බංකර් වනසන්නට



> "මගේ පුතා පුංචිකාලෙ ඉඳලම ක්‍රීඩාවට දක්ෂයි. එයා බොහොම කඩිසර ළමයෙක්, හරිම ආසාවෙන් තමයි එයා යුද්ධ හමුදාවට ගියේ. ඒ කාලේ මං හරිම බයෙන් හිටියෙ. එයා නැතිවුනයි කියල දැනගන්න ලැබුණු මොහොතේ මට දැනුන දුක විස්තර කරන්නවත් බෑ. ඒත් අද මං සතුටු වෙනවා. මගේ පුතා මුළු රටම ආදරය කරන වීරයෙක් නේද" කියල.
>
> - මව

ලුතිනන් මේඝවර්ණ යුද පිටියේදී නායකත්වය දුන්නේය. මෙහිදී, ත්‍රස්තවාදීන්ගේ බංකර් සහිත කඳවුරු සංකීර්ණයේ සිට දරුණු ප්‍රහාර මාලාවක් ඉදිරියට ඇදුණු හටපිරිස්වලට එල්ලවන්නට වූයේ රැළි වශයෙනි. ත්‍රස්තවාදීහු එම්පීඑම්ජී, එල්එම්ජී මැෂින් තුවක්කුද, ආර්පීජී රොකට් ප්‍රහාර, මෝටාර් අවි පමණක් නොව කාලතුවක්කු අවි මගින්ද අඛණ්ඩව ප්‍රහාර එල්ල කරන්නට වූහ. මෙම ප්‍රහාර මධ්‍යයේ තම සටන අත්නොහැරි ලුතිනන් මේඝවර්ණ ඇතුළු කණ්ඩායම අල්ලා ගන්නා ලද ප්‍රදේශවල බලය ස්ථාපිත කිරීමට උත්සහ ගත්තේය. මෙම ප්‍රදේශයේ සෑම බිම් අඟලකම තිබූ බාධාවන් ඉතා දක්ෂ ලෙස මඟහරිමින් තම තුවාල ලබන සෙබළුන් සතුරු භූමියේ තනිවෙන්නට ඉඩ නොදී බේරා ගැනීමටද මෙම නිලධාරී විසින් පුද්ගලිකව මැදිහත්වී ක්‍රියා කිරීම නිසා සෙබළුන්ගේ චිත්ත ධෛර්යයද ඉහළ නැංවීමට සමත් විය.

මෙම බංකර් සහිත භූමිය අල්ලා ගැනීමේ අවසන් සටන දිගු වේලාවක් පැවතුණි. සටනේ දරුණුතම අවස්ථාව පැමිණි මොහොතේ ලුතිනන් මේඝවර්ණ තම ඛණ්ඩභාර නිලධාරී රාජකාරියෙන් නොනැවතී ජීවිතය ගැන පවා නොතකා සෙබළුන්ගේ ආත්ම ශක්තියට දිරිදෙමින් මනා සම්බන්ධීකරණයකින් යුතුව එක්වරම ස්වෙච්ඡාවෙන් සතුරු බංකර වෙත කඩා පනිමින් සතුරන් විනාශකර බරපතල පරාජයකට ලක් කරමින් යුද්ධයේ වාසි තම පාර්ශ්වයට හැරවීමට කටයුතු කළ ආකාරය විශිෂ්ඨය. මෙම අවස්ථාවේ අදාළ බංකරය තුළ සැඟව සිටි ත්‍රස්තවාදීන් විශාල කණ්ඩායමක් පැමිණ එම්පීඑම්ජී, එල්එම්ජී, ආර්පීජී මෝටාර් ඇතුළු සුලු අවි හා බර අවි යොදා ගනිමින් දැඩි ප්‍රහාරයන්ට ලක්කර මෙම නිලධාරී ඇතුළු ඛණ්ඩය විසින් බලය තහවුරු කරගන්නා ලද ප්‍රදේශ නැවත අත්පත් කරගැනීමට උත්සාහ කරන ලදී.

එම සටනේදී ත්‍රස්තවාදීන්ට දිගටම ප්‍රහාර එල්ල කරමින් සිටියදී එල්ල වූ වෙඩි උණ්ඩයක් හේතුවෙන් ලුතිනන් මේඝවර්ණ බරපතල ලෙස තුවාල ලැබීය. ජයග්‍රහණය පෙනී පෙනී සතුරා ආසන්නයේම සිටි ඔහු මෙහිදී තුවාල ලැබුවද තම කණ්ඩායම සමඟ සිටි සෙබළුන් එම ස්ථානයේ තනිකර දමා පසුපසට නොයාමට කටයුතු කරමින් සැබෑ වීර නායකයකුගේ ගති ලක්ෂණ කිනම් දුෂ්කර අවස්ථාවකදී වුවද නොමියන බවේ පාඩම ක්‍රියාවෙන් ලොවට පෙන්නුවේය. තම සිරුරට එල්ල වූ ප්‍රහාර නිසා ශාරීරික ශක්තිය පිරිහී යමින් තිබුණද ඒ පිළිබඳව කිසිදු තැකීමක් සිදු නොකළ මෙම අභීත රණවිරුවා, තම සෙබළුන් සතුරු බංකර අත්පත් කරගන්නා තෙක් යුද බිමේ රැඳීසිටීමට පියවර ගත්තේය. ලුතිනන් මේඝවර්ණට එල්ල වී තිබූ සතුරු ප්‍රහාරවල බරපතලකම හේතුවෙන් ඔහු පුදුකුඩිඉරිප්පු සටන්බිමේ තම අවසන් සුසුම් හෙලුවේ නිදහස් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට තම ජීවිතයේ අවසාන තත්පරයද කැපකරමිනි. තවද, මෙම රණවිරුවාගේ සේවය ඇගයීම වස් ඔහු ලුතිනන් නිලයේ සිට කපිතාන් නිලය දක්වා උසස් කරන ලද්දේ ඔහුට කරන ලද ගෞරවයක් වශයෙනි.

ඔහුගේ බළඇණියේ එවකට ඒකක අණදෙන නිලධාරී විසින් කපිතාන් මේඝවර්ණ පිළිබඳ මතකයන් අවදි කරමින් හෙළි කරන ලද්දේ ඔහු තම ඒකකය තුළ ප්‍රසිද්ධ වූයේ මිලිමීටර් 60 වර්ගයේ මෝටාර් බෝම්බ සතුරු ඉලක්ක වෙත නිවැරදිව පතිත කිරීම සම්බන්ධවයි. මෝටාර් අවි කරේ තබාගෙන සටන් පෙරමුණට ගොස් සතුරු ඉලක්ක වනසන්නට තරම් මේඝවර්ණ දක්ෂ නිලධාරියකු බව ඔහු හෙළිකරයි. මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය රැකගනිමින් තුන් හෙළයම එක්සේසත් කිරීමේ උදාර කර්තව්‍යයේ වඩාත් බිහිසුණු දරුණු සටනේ උච්චතම අවස්ථාවක් වූ මොහොතේ සතුරාගෙන් එල්ලවූ ප්‍රතිප්‍රහාරයක් හමුවේ දරුණු ලෙස තුවාල ලද නමුත් සටන් බිමේ ඉවතට නොගොස් සටන් බිමේදීම සිය අවසන් හුස්ම හෙළමින් මාතෘභූමියේ නිදහස වෙනුවෙන් අමිල ජීවිත පරිත්‍යාගයෙන් යුතුව සිදුකළාවූ අතිඋදාර මෙහෙය වෙනුවෙන් වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් යුධ සෙබළකු වෙත ජාතියෙන් පිදිය හැකි උසස්ම සම්මානය වන "පරම වීර විභූෂණය" පුදා උපහාර දක්වන ලදී.

කපිතාන් මේඝවර්ණ රණවිරුවාගේ එකම සහෝදරිය වන එච්ජීඑම් හේෂානි එරංගා මේඝවර්ණ මහත්මිය රත්නපුර මහ රෝහලේ හෙද නිලධාරිනියක ලෙස සේවය කරන අතර, විවාහවීමෙන් පසු දැනට දොඩම්පේ මිල්ලකන්දේ ප්‍රදේශයේ පදිංචිව සිටී. මාතෘභූමිය වෙනුවෙන් දිවි දුන් මේ උදාර රණවිරුවාගේ ස්මාරකය යායින්න නිවස අසලම ගම්වාසීන් හා දෙමව්පියන් විසින් ඉදිකර ඔහු වෙනුවෙන් ගරු බුහුමන් පවත්වයි. එසේ ජාතියට අභීත රණවිරුවකු ලෙස තම එකම පුතුයා කැපකිරීමෙන් සිදුකළාවූ ජාතික මෙහෙවර උදෙසා දැනට ජීවතුන් අතර සිටින දෙමව්පියන් වන එච්ජීඑම් කිත්සිරි මේඝවර්ණ හා ජී ආරියලතා ද සිල්වා යන මාපියන් දෙපළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් "උත්තම පූජා" උපහාරයෙන් පුදන ලද්දේය.

සටහන :-

"උත්තමාචාරය" ග්‍රන්ථය ඇසුරිනි...



# ක්‍රීඩා විත්ති

## 'ජාතික ඔරු පැදීමේ තරඟාවලිය - 2022' හි ශූරතාවය යුද්ධ හමුදාවට





ශ්‍රී ලංකා ඔරු පැදීමේ ජාතික සංගමය වෙතින් සංවිධානය කරනු ලැබූ "ජාතික ඔරු පැදීමේ (***Canoeing & Kayaking***) තරඟාවලිය - 2022" ඉකුත් දෙසැම්බර් මස 16 සහ 17 දෙදින තුළ බත්තරමුල්ල දියවන්නා වැව් පරිශ්‍රයේදී පැවැත්විණ. එම තරඟාවලියේ පිරිමි විවෘත අංශය නියෝජනය කර පදක්කම් 13 ක් දිනාගනිමින් අඛණ්ඩව 4 වන වරටත් ජාතික ඔරු පැදීමේ තරඟාවලියේ සමස්ත ශූරතාවය හිමිකරගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඔරු පැදීමේ කණ්ඩායම සමත්විය. එහි කාන්තා විවෘත ඉසව්වේදී යුද්ධ හමුදා ක්‍රීඩිකාවන් පදක්කම් 06 ක් දිනාගනිමින් අවසන් මහා තරඟයේදී ***"Sri Lanka Adventures Sports Club"*** කණ්ඩායම සමඟ තියුණු තරඟයකින් අනතුරුව අනුශූරතාවය දිනාගැනීමට සමත් වූහ. එමෙන්ම, ප්‍රවීණයන්ගේ ඉසව්වේදිද යුද්ධ හමුදා ක්‍රීඩකයෝ පදක්කම් 6 ක් සමඟින් ශූරතාවය දිනාගැනීමට සමත්වූහ.

## සමස්ථ ලංකා ආරාධිත සෙපක්ටැක්රෝ තරඟාවලිය





මැලේ ක්‍රිකට් ක්‍රීඩා සමාජයට වසර 150 ක් පිරීම නිමිත්තෙන් පැවති සමස්ථ ලංකා ආරාධිත සෙපක්ටැක්රෝ තරඟාවලිය පසුගියදා මැලේ ක්‍රිකට් සමාජ ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. මෙම තරඟාවලියේදී "රෙගු" ඉසව්ව පමණක් පැවති අතර කාන්තා ඉසව්වේ ශූරතාවය හා අනුශූරතාවය පිළිවෙලින් යුද්ධ හමුදා "ඒ" හා "බී" කණ්ඩායම් දිනාගන්නා ලදී. පිරිමි තරඟ ඉසව්වේ අවසාන තරඟයට වර්ෂාවෙන් බාධා සිදුවූ බැවින්, එහි අවසාන තරඟයේ ජයග්‍රාහකයා කාසියේ වාසිය මත තෝරාගැනීමට සිදුවිය. ඒ අනුව, පිරිමි අංශයේ අනුශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම දිනාගන්නා ලදී. යුද්ධ හමුදා සෙපක්ටැක්රෝ සංචිතය යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති පිරිස් පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී යටතේ පවත්වාගෙන යනු ලැබේ.

# 17 වැනි ශ්‍රී ලංකා කඹ ඇදීමේ ශූරතාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් දස්කම්







ශ්‍රී ලංකා කඹ ඇදීමේ සම්මේලනය විසින් සංවිධානය කරන ලද 17 වැනි ශ්‍රී ලංකා කඹ ඇදීමේ ශූරතාවලිය ඉකුත් දෙසැම්බර් 11 වන දින කොළඹ ටොරින්ටන් ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. එහිදී, තරගාවලියේ සියලුම ශූරතාවයන් දිනා ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඹ ඇදීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත්වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කඹ ඇදීමේ කමිටුවේ සභාපති සහ ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීමට අනුව යුද්ධ හමුදාවේ දක්ෂ කඹ ඇදීමේ කණ්ඩායම් 6 ක් මෙම තරගාවලියට සහභාගී වූහ.

# අන්තර් සේනාංක ක්‍රිකට් තරඟාවලියේ ජය 23 වන සේනාංකයට

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) වාර්ෂිකව පවත්වනු ලබන අන්තර් සේනාංක ක්‍රිකට් තරගාවලිය පසුගිය දෙසැම්බර් 14 වන දින මින්නේරිය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා පුහුණු පාසල් ක්‍රීඩා පිටියේදී පැවැත්විණි. පන්දු වාර 10 කින් සමන්විත මෙම සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය සඳහා ක්‍රිකට් කණ්ඩායම් 5 ක් සහභාගී වූහ. අවසන් තරගයේදී, 22 වන සේනාංක කණ්ඩායම පන්දු වාර 10 ක් තුළ කඩුලු 05 ක් දැවී ලකුණු 144 ක් රැස්කරගත් අතර පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ 23 වන සේනාංක කණ්ඩායමට පන්දුවාර 10 අවසානයේ කඩුලු 8 ක් දැවී ලබාගැනීමට හැකිවූයේ ලකුණු 68 ක් පමණි. ඒ අනුව, 22 වන සේනාංක කණ්ඩායම තරගාවලියේ ශූරතාවය හිමිකරගත්තේ 23 වන සේනාංක කණ්ඩායම අනුශූරයන් බවට පත්කරමිනි.



# 64 වන පාබල සේනාංකයේ පාපන්දු තරඟාවලිය



64 වන පාබල සේනාංකය යටතේ රාජකාරී නියුතු නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කරලීමේ අරමුණින් වූ පාපන්දු තරගාවලියක් පසුගිය නොවැම්බර් 23 වන දින 23 වන විජයබාහු පාබල රෙජිමේන්තු පාපන්දු ක්‍රීඩාපිටියේදී පවත්වන ලද්දේ එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙනි. මෙම තරගාවලියෙහි ශූරතාවය 23 වන විජයබාහු පාබල රෙජිමේන්තු කණ්ඩායමද, එහි අනුශූරතාවය 642 වන පාබල බලසේනා මූලස්ථාන කණ්ඩායම විසින්ද දිනාගනු ලැබූ අතර, තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස සෙ/531386 ලා/කෝ ද සිල්වා ඩබ්ලිව්පීඑම් සම්මාන හිමිකරගත්තේය. එහි කුසලාන සහ සහතිකපත් ප්‍රදානයට 642 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද එක්වූහ.

# අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාවයේ ජය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාවලිය - 2022 හි අවසන් මහා තරඟය සහ සම්මාන ප්‍රධානෝත්සවය ඉකුත් දෙසැම්බර් මස 9 දින පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. යුද්ධ හමුදා චෙස් කමිටුවේ සභාපති සහ ඉංජිනේරු බලකායේ බලකාධිපති මෙන්ම ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගි විය.

දෙසැම්බර් මස 05 සිට 09 දින දක්වා පනාගොඩදී පැවැත්වූ මෙම අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාවලිය ඒකල හා කණ්ඩායම් වශයෙන් පැවැත්වූ අතර, ඒ සඳහා රෙජිමේන්තු 15 ක් නියෝජනය කරමින් චෙස් ක්‍රීඩකයින් 130 දෙනකු සහභාගී වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ චෙස් ක්‍රීඩකයින් මෙවර අන්තර් රෙජිමේන්තු චෙස් ශූරතාව දිනාගත් අතර, දෙවන ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ක්‍රීඩකයින්ටත්, තෙවන ස්ථානය ගජබා රෙජිමේන්තු චෙස් ක්‍රීඩකයන්ටත් හිමිවිය.

# අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් ශූරතාවලිය සාර්ථකව නිමාවෙයි







යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 19ක ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වයෙන් තරඟ ඉසව් 22 ක් යටතේ පැවති "යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් ශූරතාවලිය" ඉකුත් දෙසැම්බර් මස 01 දින සිට දෙසැම්බර් මස 06 දින දක්වා පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. ක්‍රීඩාලෝලීන් විශාල පිරිසක් මධ්‍යයේ පැවති එම තරඟාවලියෙහි ජයග්‍රාහී කණ්ඩායම් වෙත සම්මාන සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. එහිදී, කාන්තා අංශයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායටද, අනුශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායටද හිමිවූ අතර, එහි පිරිමි අංශයේ ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය දිනාගත් අතර අනුශූරතාවය හිමිවූයේ ශ්‍රී ලංකා පාබල හමුදාවටය.

# ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අන්තර් ඒකක පිහිනුම් තරඟාවලිය



3 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය වෙතින් සංවිධානය කරනු ලැබූ "අන්තර් ඒකක පිහිනුම් තරඟාවලිය - 2022" පසුගිය නොවැම්බර් 30 වන දින අනුරාධපුර පිහිටි සල්ගාදු පිහිනුම් සංකීර්ණයේදී පැවැත්විණි. මෙම තරඟාවලියේ අවසන් මහා තරඟයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සන්නාහ සන්නද්ධ බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්පී කාරියවසම් සහභාගී විය. මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සියලුම ඒකක නියෝජනය කරමින් පිහිනුම් ක්‍රීඩකයින් 60 දෙනකු සහභාගී වූහ. තරඟාවලියේදී දක්ෂතා දක්වමින් 4 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ පිහිනුම් ක්‍රීඩකයින් ශූරතාවය හිමිකරගත් අතර, එහි අනුශූරතාවය හිමිවූයේ 3 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායටය.

**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



1 වන බලකායේ
බලකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එස්යූඑම්එන් මානගේ**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී පීඑස්සී**
**2022 දෙසැම්බර් මස 23 වන**
**දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(යාපනය) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඩීබීඑස්එන් බෝතොට**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**පීඑස්සී**
**2022 දෙසැම්බර් මස 26 වන**
**දින සිට**



යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඩීඑම්කේඩීබී පුස්සැල්ල**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2022 දෙසැම්බර් මස 01 වන**
**දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී ආර්සීඩීඑස් පීඑස්සී**
**2022 දෙසැම්බර් මස 15 වන**
**දින රාජකාරි භාරගන්නා ලදී.**
තවද, යුද්ධ හමුදා කාන්තා
බලකායේ බලකාධිපති ලෙසද
ඔහුතුමා 2022 දෙසැම්බර් මස 06
වන දින රාජකාරි භාරගන්නා ලදී.



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ
බලකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එම්කේ ජයවර්ධන ආර්එස්පී**
**යූඑස්පී එන්ඩීයූ**
**2022 දෙසැම්බර් මස 05 වන**
**දින සිට**



11 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල් එස්ආර්බී**
**අලුවිහාරෙ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී**
**2022 දෙසැම්බර් මස 19 වන**
**දින සිට**



යුද්ධ හමුදා මූලස්ථානයේ
යුධ සේවා ලේකම් ලෙස
**මේජර් ජෙනරාල්**
**එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩීසී**
**පීඑස්සී**
**2022 දෙසැම්බර් මස 21 වන**
**දින සිට**



51 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එස්ඩබ්ලිව් වෙලගෙදර**
**ආර්එස්පී යූඑස්පී එන්ඩීසී**
**2022 දෙසැම්බර් මස 14 වන**
**දින සිට**



රණවිරු ඇපරල් ආයතනයේ
සේනාවිධායක ලෙස
**බ්‍රිගේඩියර්**
**එම්පීඒඑන්බී මහතුවක්කාර**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී**
**2022 දෙසැම්බර් මස 05 වන**
**දින සිට**



66 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**ආර්කේඑන්සී ජයවර්ධන**
**ආර්එස්පී එන්ඩීසී**
**2022 දෙසැම්බර් මස 07 වන**
**දින සිට**



ආරක්‍ෂක සේවා විද්‍යාලයේ
අධ්‍යක්‍ෂක ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩීසීවීකේ කුලතුංග යූඑස්පී**
**2022 දෙසැම්බර් මස 23 වන**
**දින සිට**



සන්නද්ධ බලසේනා
මූලස්ථානයේ සන්නද්ධ
බලසේනාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්පී කාරියවසම්**
**2022 නොවැම්බර් මස 21 වන**
**දින සිට**



කළමනාකරණ හා තඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේපී විතානච්චි ආර්ඩබ්ලිව්පී යූඑස්පී**

**2022 දෙසැම්බර් මස 02 වන දින සිට**




යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**එම්එම් සල්වතුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2022 දෙසැම්බර් මස05 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් (පාලන/භාණ්ඩ) ලෙස

**බ්‍රිගේඩියර්**
**එස්ඒඑන්ජේ ආරියසේන**

**2022 දෙසැම්බර් මස 08 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් (පාලන/භාණ්ඩ) ලෙස

**බ්‍රිගේඩියර්**
**සී කළුතරආරච්චි**


**2022 දෙසැම්බර් මස 05 වන දින සිට**



553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**පීඩීජේඩී ප්‍රේමතිලක යූඑස්පී පීඑස්සී**

**2022 දෙසැම්බර් මස 19 වන දින සිට**



662 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**කේපීපී කරුණානායක**

**2022 නොවැම්බර් මස 21 වන දින සිට**



643 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**සීඩී වික්‍රමනායක ඩබ්ලිව්වී ආර්එස්පී**

**2022 දෙසැම්බර් මස 05 වන දින සිට**



542 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ආර්ආර්එම්පීඑන්බී ඔබරදෙණිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 දෙසැම්බර් මස 08 වන දින සිට**



612 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**එච්කේඑල්ජේ පෙරේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 දෙසැම්බර් මස 14 වන දින සිට**



21 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රමාණි ලෙස

**කර්නල්**
**කේඩීඑන්ආර් කත්තන්ගර ආර්එස්පී අයිජී**

**2022 දෙසැම්බර් මස 06 වන දින සිට**



මධ්‍යම අවි සහ පතුරොම් ගබඩාවේ සේනාවිධායක ලෙස

**කර්නල්**
**කේපීඑන්එස්කේ කාරියවසම් ඒඑටීබී එල්එස්සී**

**2022 දෙසැම්බර් මස 27 වන දින සිට**



රණවිරු සම්පත් කේන්ද්‍රයේ නියෝජ්‍ය සේනාවිධායක ලෙස

**කර්නල්**
**පීආර්එස් ධර්මරත්න යූඑස්පී**

**2022 දෙසැම්බර් මස 15 වන දින සිට**



62 වන පාබල සේනාංකයේ
කර්නල් ප්‍රමාණි ලෙස

**කර්නල්**
**ටීඑස් ලියනගුණවර්ධන**

**2022 දෙසැම්බර් මස 19 වන
දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(මුලතිව්) කර්නල් ප්‍රමා ලෙස

**කර්නල්**
**එම්ඩීඑස්වන් කරුණාරත්න
පීඑස්සී**

**2022 දෙසැම්බර් මස 09 වන
දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(වන්නි)
කර්නල් (පාලන/භාණ්ඩ) ලෙස

**කර්නල්**
**ඩීඑම්එම්සී විජේරත්න එල්එස්සී**

**2022 දෙසැම්බර් මස 01 වන
දින සිට**



12 වන පාබල සේනාංකයේ
කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්**
**එම්ටීඒයි ගුණවර්ධන
ආර්එස්පී පීඑස්සී**

**2022 දෙසැම්බර් මස 01 වන
දින සිට**



4 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**පීඑච්එස් නවරත්න ආර්එස්පී
පීඑස්සී**

**2022 නොවැම්බර් මස 21 වන
දින සිට**



12 සෙව්) රෙජිමේන්තුව
ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඊඊඑස් අමරතුංග**

**2022 ජූලි මස 12 වන
දින සිට**



2(සේව්) ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩබ්ලිව්එස්පී පෙරේරා**

**2022 නොවැම්බර් මස 16 වන
දින සිට**



2 වන යාන්ත්‍රික
පාබල රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ජේපියූ කුමාර යූඑස්පී**

**2022 සැප්තැම්බර් මස 21 වන
දින සිට**



සන්නද්ධ බලසේනා
මූලස්ථානයේ බලසේනා
සැරයන් මේජර් ලෙස

**බළලත් නිලධාරී I**

**සෙ/106499 ඔනි I**
**එච්එම්ජී රුවන් බංඩාර යූඑස්පී**

**2022 සැප්තැම්බර් මස 20 වන
දින සිට**



242 වන පාබල බලසේනා
මූලස්ථානයේ බලසේනා
සැරයන් මේජර් ලෙස
**බළලත් නිලධාරී I**

**සෙ/366175 ඔනි I**
**එච්එම්ආර්සී හේරත් ආර්එස්පී**
**2022 දෙසැම්බර් මස 12 වන
දින සිට**



2 වන යාන්ත්‍රික
පාබල රෙජිමේන්තුවේ
රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

**බළලත් නිලධාරී I**
**ඩබ්ලිව්එම්ඩී වනසිංහ**

**2022 නොවැම්බර් මස 28 වන
දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු
සම්පත් බලකායේ
ප්‍රධාන ලිපිකරු ලෙස

**බළලත් නිලධාරී I**
**ආර්එම්ජී රත්නායක**

**2022 ඔක්තෝබර් මස 27 වන
දින සිට**

## නිහඬ බව...

සිත් පව් හදින් බැඳ නිර
ජන ලෝ පෙරටු එක්කොට
සිනයි අද සැම තැන
කුරිරුකම් ලෝ ජයගෙන..

බුදු බණ රැඳුනද කොතනද
මවාගත් දේ හදේ බැඳගෙන
අන්ධ දෙනෙතින් තෙරපිලා
සොයයි මාවත දිවිහෙලා..

පෙනන දේ මත ගොළුවීලා
හදේ පව්කර බුර බුරා
තනිකමින් මුළු සිතම නැවතී
නිහඬකම ලොව රජවෙලා..

සෙ/එස්108189
ඉසෙ නිමල් ශාන්ත එස්ඒ
13 වන ඉංජිනේරු සේවා බළගණය
යුහමු

## බොරුවෙන් ජයගත් සැප විඳිනා උන්...

බොරුවෙන් රැවටී සැනහෙනා දනන් රවටමින්
ධනය බලය ලැබ සැප විඳිති කපටි රැලක්
කපුටා කපටිකමින් රැස්කළ තම රැළ
ඩැහැ ගන්නා සේ ගොදුර බුදිනට තනිව
නිවට දනන් දින දින මුළාවෙති
ඇස් කන් නැති සේ නොදැන බොරු බව
බොරුවම දෙසමින් බොරුවම කරමින්
ධන කුවේරයන්ව ඇත දේශපාළුවන්
සත්‍ය මිස අසත්‍ය නොකියම් සපථ කරමින්
කාසි පනන් සෙයනි ගජරාමෙට තිති රකින්නන්
සුව පහසුව ධන බලය මිස වෙළෙඳුරන්
නොතකති මිනිසුනි ඔබේ ලෙඩ දුක
පාසැල විවේකාගාරයකි දරු කැල අසරණය
නිධානයකි වියුණන් පංතිය දෙමාපියන් අසරණය
තමන්ගේම අනාගතය මරණය වන දිනය
නොදකින මහා මොළ ඇති පිරිසකි ජෝතිෂ
හරියටම කියනවලු යහපත හෝ අයහපත වෙන බව
අසරණ මිනිසුන් දින දින කරමින් මුලා
වැජඹෙනවලු සුරසැප විඳිමිනා
කාලීනව දෙසනි නොදන්නා නිසා බුදු බණ
රැවටී පාරමිතා පුරණා උපාසක උපාසිකා
කාසි මළු පිරින් සැප වාහන ගුඩ කඩම් පුදති
සසර දුකට භයෙන් නොලැබෙන නිවන් පතා
මෙලොව සැමට ඇති වාසනා ගුණ කිසිත් නැති
සය නුවණක් ඇති මෙලොව අපට නැති..
5000 ක් කල් කොහොම ඉවසන්නද බුදු හිමියනී
දැවෙනව හදවත ගිනිගෙන නිරතුරු මේවා දැක දැක..

අජන්ත හේරත්
අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

## මා හද මල බඹරු නොදුටු...

මෘදු කුසුමකි බඹරු නොදුටු
නැවුම් සුවඳ විහිදා
පරිසරය පුරා ලස්සන සුදු
පිපුනා නුඹ සුසිනිදු
මිච්ච සමන් සුදු මලේ..
පොද වැස්සට තෙමී.. තෙමී
මඳ සුළඟින් සිනාසුනා
නුඹ ලස්සනයි.. හැඩයි..
පොද වැසි නික්මෙයි සුළං වගේ
මිච්ච සමන් සුදු මලේ..
බුදු හිමි පාමුල නුඹ සතපා
පැතුවා පැතුමන් දහසක්
මෘදු පෙති ගිලිහී නොයන් සදා
සුවඳ දිදී හිඳින් හදේ
මා පැතු පැතුමක් සේ
මිච්ච සමන් සුදු මලේ..

සෙ/70207
කපිතාන් (උපා) ඒපීඑස් චන්ද්‍රසිරි ගරෙ
ආමාත්‍යකා නිල නිවස




## විරු බිරිඳ...

උපදින හැම භවයෙම
මගෙ වෙන්නට පැතුවාට
ඒ හැම භවයේදීම
දුක සැප එකට වින්දාට..
මෘදුවන් හදවතක්
මට උරුමව නොවුනාට
ඇයි පෙම් කළේ
මේ දරදඬු විරුවාට..
විරුවන් ගැන
කවි පොත් ලීවාට
සවියක් වෙච්ච
නුඹ අමතක වූවාට..
අඩියක් තිබ්බ
හැම මොහොතක ඉදිරියට
යසෝදරා නුඹ
සිහිවුණි හැම විරුවන්ට..

ලුතිනන් කර්නල්
හේමන්ත රත්නායක
මව්මෙඅම

## ආදර පියාණෙනී...

අගාධ සාගරය කොතරම් ගැඹුරු වුවද
එහි ඉමක් දැක්මට හැකිය අද දියුණට
ඉමක් පතුලක් නොපෙනෙන
ඔබේ ආදරය සාගරය අත්දැකී ජීවිතය
තවම නොදනී එහි ඉම

නොගැඹුරු පැහැදිලි දිගන
පෙනෙන මෙන් ඡායාව උවසේ
පැහැදිලිය එය මට
කිසිදු අඩුවක් නොමැතිව
කරදඹු උස් මහත්වී අප වැඩිහිටි වුවද
තවම පොඩි දරුවන් ඔබේ පාමුල තනිවෙන

අද හැලෙන ඇල්ලක
ගලායන දිය දහරක
හමන මාරුතයයි
පාව එන්නේ ඔබේ සුවඳය

අන් කිසිත් නොපෙනෙන
දරු දියුණුව පතන
මතු මතුත් බුදුවන
ඔබයි මා ආදර පියාණන්

සෙ/655255
සාසෙ ජයකොඩි ජේඒ
3 ශ්‍රීලයුවෙබ

## මම තාම හැඩ අකුරු සොයනවා...

සංසාර පබැඳුමක වෙහෙසකර ඉසිඹුවක
අත් නොහැරී මතක තව තියෙනවා..
සඳ බිඳුනු කණිසමක ළතෙත් නැති හදවතක්
මගහැරිය කඳුළු ගැන අහනවා
සේපාලි සුවඳකට පිටුපෑව සමනලයා
මල් වැරුණ ස්වප්නයක නිදනවා
පෙරවදන ගලපන්න ආයෙමත් ආදරෙන්
මම තාම හැඩ අකුරු සොයනවා..

විද්‍රගා පතිරත්න
කොබෙයිගනේ

## බලාපොරොත්තුවක්...

කෙලෙස අමතක කරම් දුටුව නෙතුයුග ඔබේ
සිහින අතරෙහි සැගව සිතට ඉගිකළ පැයේ
සවන් මත්කළ හඬක මුසුවූ සුවයක් නොවේ
පරව සිතවට බැඳුනු නැවුම් හැගුමක් තියේ

නෙතෙහි කඳුලක් දවා උණුසුමක සුව බැදේ
ගිමන් නිවනට ඉඳින් සෙවන ලග යැයි හැගේ
තවත් කුමකට තැවෙනු නිහඬ සිතුවිලි රැගේ
දෑත් ගැටෙනා පුරෙක සුපිපි කුසුමකි මගේ

ගැටී සිතුවිලි දහර හමුවූ බාධක පොරේ
නිසල වන බව දිනෙක සිතට ඉගියක් ගෙනේ
තුෂර බිඳුවක සිසිල හදට තුරුළුව රැයේ
සෙනෙහසක මුදු පහස වඩයි තනිවූ හදේ

වෛද්‍ය දමිත් අමරසේකර
රජයේ රෝහල - ගම්පහ

# බදු ගෙවීම...

"මම මේ කල්පනා කළේ බං මගේ පවුල හරියට රජයක් වගෙයි නේද කියලා..." යි ජේම්ස් සිය මිතුරා හට කියා සිටියේ පදමට රත්වී සිටි අවස්ථාවකය... "ඔන්න බලපං... මගේ හාමිනේ තමයි මුදල් ඇමති... නැන්දම්ම තමයි ආරක්ෂක ඇමති... දුව තමයි විදේශ ඇමති..."

"හැබෑව නේන්නම්... යි මිතුරා අසා සිටියේ... "එතකොට උඹේ තනතුර මොකක්ද?"

"මමද... මම තමයි මහජනතාව... ඒ කියන්නේ මමනෙ මුළු රටටම බදු ගෙවන්නේ..."



# අමුතුම පිස්සුවක්...

සාගරය මධ්‍යයෙහි වූ එම කුඩා දූපතෙහි සිටින රැවුල වවාගත් මිනිසකු නෞකාව දෙසට දැත් වනමින් වියරුවෙන් මෙන් කෑ ගසන අයුරු එම විනෝද චාරිකාවෙහි නියැලී සිටි සංචාරකයන් සියලුදෙනාටම පාහේ දැකගත හැකිවිය.

"ඒ කව්ද?" යි එක් මගියෙක් කපිතාන්වරයාගෙන් විමසා සිටියේය...

"අනේ මන්දා හැම අවුරුද්දෙම අපි මේ දූපත ළඟින් යද්දී මිනිහට පිස්සු හැදෙනවා..."



# රක්ෂණය නොවන්නේ ඇයි?

"ඇයි තමුසෙ ඉන්ෂුවර් වෙන්නෙ නැත්තේ...?"

"ඉන්ෂුවර් උනොත් එහෙම මගෙ නෝනා මට වැඩි කලක් ජීවත් වෙන්න ඉඩදෙන එකක් නෑ..."





# චන්ද්‍රපාල...

**විදුහල්පති** -අනිත් ඔක්කොම එකපාරටම පොත් මිටි තුන ගානෙ ගෙනියනවා... චන්ද්‍රපාල විතරක් ඇයි එක මිටිය ගානෙ ගෙනියන්නේ...

**චන්ද්‍රපාල** - තුන්පාරක් යන්න වෙයි කියලනෙ සර්... ඒ අය හරිම කම්මැලියි...

# හීනය...

**රංජන්** - ඊයෙ මං හීනෙන් දැක්කා මං ලෝකෙන්ම ලස්සන කෙල්ල ළඟට ගිහින් කසාද බඳින්න එයාට යෝජනා කළා...

**මල්ලිකා** - ඉතිං මං මොකද කිව්වේ... මල්ලිකා ඇසුවාය...



# අළුත් කම්කරුවා...

අළුත සේවයට පැමිණි කම්කරුවා පෙරදින සේවයට වාර්ථකොට ඇත්තේ පැයක් ප්‍රමාද වී බැවි දුටු කළමණාකරු ඔහුට අමතක නොවන පාඩමක් උගැන්වීමට සිතීය.

"මේ බලනවා සිරිසේන... තමුසෙ ඊයෙත් වැඩට ඇවිල්ලා තියෙන්නේ පැයකටත් වැඩිය පරක්කු වෙලා... මේක හැමදාම කරන්න බෑනෙ... ඒ හින්ද මම තමුසෙට දඬුවම් කරනවා... මම තමුසෙට පඩි නැතුව දවස් තුනකට නිවාඩු අරිනවා..."

එය ඇසූ සිරිසේන කරබාගෙන එතැනින් ඉවත්ව ගිය මුත් මොහොතකින් යළි ආපසු පැමිණියේය.

"සර් මාව දවස් පහකටම ගෙදර යවන්න බැරිද? එතකොට මට ගමේ ගිහිල්ලම එන්න පුළුවනි..."

# හතරවෙනි හරකා...

ගිය අවුරුද්දෙ 4 වැනි මාසෙ 4 වැනි දවස හරි පුදුම දවසක්... එදා මම නැගිට්ටේ උදේ 4 ට... හවස රේස් පිට්ටනියට එනකොට වෙලාව සවස 4 යි... හතරෙ ඉලක්කම හතරපස් පාරක්ම මුණ ගැහිච්ච නිසා එදා මම අතේ තිබුණු ඔක්කොම සල්ලි 4 නොම්මරේට දුවපු අස්සයගෙ නමට ඔට්ටු 4 ට දැම්මා...

ඉතින් ඌ දින්නා...?

නෑ... ඒ හරකා ආවෙ හතරවෙනියට

# ENGLISH VISION

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## What's wrong if

යම්කිසි දෙයක් කිරීම හා සැබැඳිව **"එසේ කිරීමේ"** වැරැද්ද කිමදැයි, විමසමින් ප්‍රශ්න වාක්‍යය නිර්මාණයට මෙම වාක්‍යය රටාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

**There is no need to + Verb (infinitive) + Object + Rest.**
**What's wrong if + Subject + Verb + Object + Rest.**
වට්ස් රෝන්ග් ඉෆ් + සබ්ජෙක්ට් +වර්බ් +ඔබ්ජෙක්ට්+රෙස්ට්.
එසේ කිරීමේ වැරැද්ද කිමදැයි+ කර්තෘ + ක්‍රියාපදය+ කර්මය+ ඉතිරිය.

***Ex*** / උදා :-

1. What's wrong if I read novels?
   වට්ස් රෝන්ග් ඉෆ් අයි රීඩ් නවල්ස්?
   මම නවකථා කියවන එකේ ඇති වැරැද්ද මොකක්ද?

2. What's wrong if he watches TV?
   වට්ස් රෝන්ග් ඉෆ් හී වොච් ටීවී?
   ඔහු රූපවාහිනිය නැරඹීමේ ඇති වැරැද්ද මොකක්ද?

3. What's wrong if Nimal meets her?
   වට්ස් රෝන්ග් ඉෆ් නිමල් මීට්ස් හර්?
   නිමල් ඇය හමුවුණ එකේ ඇති වැරැද්ද මොකක්ද?

4. What's wrong if I play cricket?
   වට්ස් රෝන්ග් ඉෆ් අයි ප්ලේ ක්‍රිකට්?
   මම සෙල්ලම් කරන එකේ ඇති වැරැද්ද මොකක්ද?

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයෙහි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,

- **What's wrong if :-** එසේ කිරීමේ වැරැද්ද කිමදැයි ආදී වශයෙන් අර්ථ ඇතිව මෙම වාක්‍ය ඛණ්ඩය නිදසුනෙහි පෙන්වාදී ඇති පරිදි භාවිතා වේ.

- **Subject :-** කර්තෘ පදය ඉහත පෙන්වාදුන් පරිද්දෙන්ම ව්‍යාකරණානුකූලව භාවිතා වේ.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී කාල භේදයට අනුව මෙහිදී භාවිතා කල යුතුය.

- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන භේදයකින් තොරව භාවිතා වේ.

- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

**Analysis of the sentence formation** - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.
**What's wrong if + Subject + Verb + Object + Rest.**
වට්ස් රෝන්ග් +සබ්ජෙක්ට් +වර්බ්+ඔබ්ජෙක්ට්+රෙස්ට්.
එසේ කිරීමේදී වැරැද්ද කිමදැයි+ කර්තෘ + ක්‍රියාපදය+ කර්මය+ ඉතිරිය.

**What's wrong if I read novel?**
වට්ස් රෝන්ග් ඉෆ් අයි රීඩ් නවල්?
මම පොතක් කියවන එකේ ඇති වැරැද්ද මොකක්ද?

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද, ඔබට මඟහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



මේජර් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොසේබ

www.englishvision.lk

# සිංහ රෙජිමේන්තු මූලස්ථාන බලඇණියට

# වසර 23 ක් සපිරේ





වර්ෂ 1999 ක් වූ නොවැම්බර් මස 25 වන දින ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මූලස්ථාන බලඇණියට ඉකුත් නොවැම්බර් මස 25 දිනට වසර 23 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් 2022 දෙසැම්බර් මස 23 දින වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නැංවුණු අතර, එහිදී ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එල්එම්කේඑස් ඥාණරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී හට කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම හා සියලු නිල තේ පැන් සංග්‍රහයක් හා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම විශේෂ විය.

තවද, ඒකකයේ භට පිරිස් හි ශ්‍රම දායකත්වයෙන් "සිංහ දිරිය පියස" ව්‍යාපෘති මධ්‍යස්ථානයේ නවතමයෙන් ඉදිකරනු ලැබූ භට නිවාසය සහ අංග සම්පූර්ණ නාන කාමර පද්ධතිය රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්පීඑන්පී මුතුමාල යූඑස්පී පීඑස්සී විසින් විවෘත කර සෙසුනිල පරිහරණය සඳහා ලබාදීමද එහිදී සිදුකෙරිණ.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර
එච් වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආරඑම්ඩබ්ලිව්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව් ලක්මිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජිඑච්එම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# යුධෝපකරණ නිෂ්පාදනාගාරය යළි ස්ථාපිත කෙරේ



අත්‍යවශ්‍ය යුද උපකරණ නිෂ්පාදනය නව මාවතකට යොමුකිරීම සහ විදේශ විනිමය ඉතිරි කරගැනීමේ අරමුණින් කෙටි කාලයක් තුළ යුද්ධ හමුදාවේ යුද්ධෝපකරණ අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා යළි ස්ථාපිත කරන ලද යුද්ධ හමුදා යුධෝපකරණ කර්මාන්ත ශාලාව වේයන්ගොඩ ප්‍රදේශයේ පිහිටි මධ්‍යම අවි හා පතුරොම් ගබඩා පරිශ්‍රයේදී ඉකුත් දෙසැම්බර් 08 වන දින විවෘත කෙරිණ.

මෙම කර්මාන්ත ශාලාව විවෘත කිරීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කර්නල් සේනාධිපති මේජර් ජෙනරාල් එම්ජීපී වීරසිංහ යූඑස්පී ඒටීඑම් ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.






තෝරාගත් විවිධ උපකරණ, යකඩ ඇඳන්, සම් නිෂ්පාදන, ඇගලුම්, නැවත පිරවූ ටයර්, කැනපි ආවරණ ආදී ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අරමුණින් 2014 වර්ෂයේදී යුද්ධ හමුදාවේ ප්‍රථම යුධෝපකරණ කර්මාන්ත ශාලාව දොඹගොඩ ප්‍රදේශයේ ස්ථාපිත කෙරිණ. පසුව එම කටයුතු තවදුරටත් පුළුල් කරමින් වේයන්ගොඩ ප්‍රදේශයේ වැඩි ඉඩ පහසුකම් සහිත පරිශ්‍රයක ස්ථාපිත කරනු ලැබූ මෙම නව යුධෝපකරණ කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේ ආරම්භ වී 2022 දෙසැම්බර් මස මුල් භාගයේදී අවසන් විය.




නව යුධෝපකරණ කර්මාන්ත ශාලාව විවෘත කිරීමෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති විසින් එම පරිශ්‍රයේ ඇගලුම්, බඳපටි, ශිරස්ක, බූට් සපත්තු, රෙදි විවීම, යකඩ ඇඳන් සහ විවිධ උපකරණ නිෂ්පාදන අංශ තුළ නිරීක්ෂණ සංචාරයක නිරත වෙමින් එහි නිෂ්පාදන කටයුතුවල නිරත හටපිරිස් සමඟද අදහස් හුවමාරු කරගත්තේය.





# "කගපත් ලෙළවා ජයගත් ඉතිහාස"

"යුද්දෙට නැති කඩුව කොස් කොටන්නද"
එහෙම පැරණි කියමනක් තියෙනවා.
නමුත්, මේ කියන්නෙ ඒ කඩු ගැන නෙමෙයි.
රටක අභිමානය සුරකින අසිපත් ගැන.

ලාංකේය සටන් ඉතිහාසයේ
කඩු ගැන කතා බොහොමයි.
කඩුවලින් සතුරන් සමූල
ඝාතනය කළා සේම සතුරා
ඉදිරියේ දෙදන නොනමා
නොබියව ඊට ගෙල දුන්නු
ඉතිහාසයකුත් අපට තියෙනවා.

අද අපට පෙනෙන සතුරෙක්
නැතිවුනාට කොයි මොහොතක
කොයි තැනකදී උනත් සතුරු
බළමුළු හිස ඔසවන්න පුළුවන්.
ඒ නිසාම අසිපතේ මුවහත
වගේම හුරු අතේ සවියත් එක
විදියට තියාගන්න ඕන. අසිපත්
දරණ තරුණයෝ රටකට
අවශ්‍ය වෙන්නෙ ඒ නිසයි.
අභිමානය රකින්න පුළුවන්
ඔවුන්ට විතරමයි.